**E-Repository of Humanities and Social Sciences**
Publication Committee
Faculty of Humanities and Social Sciences
University of Sri Jayewardenepura

# Author Consent Form

Please provide the following information of your book/publication (please note that one consent form needs to be filled for each publication if you have more than one).

1. Title of the publication : ජේතවන විහාරයේ නටබුන්
2. Author/ Authors : මහාචාර්ය වසන්ත මෙන්ඩිස්
3. Publisher : සමන් ප්‍රකාශකයෝ හා මුද්‍රණ ශිල්පියෝ ගංගොඩවිල, නුගේගොඩ
4. Year of Publication : 2018
5. ISBN (if applicable) : 978-955-4980-09-9
6. Access option : Open Access


**Author/copyright owner consent:**

I/~~we~~ Prof. Wasantha Mendis (your name/names), as the author/~~s~~ or copyright owner/s, would like to provide my/our consent for making available the above publication on the E-Repository of Humanities and Social Sciences of the University of Sri Jayewardenepura. I also would like to provide my consent to allow the E-Repository Management Committee to make the publication accessible to the students of University of Sri Jayewardenepura and public.

Signature of the Author/~~s or Copyright owner~~/s: [signature]

Date: 2023/09/15

# ජේතවන විහාරයේ නටබුන්



වසන්ත මෙන්ඩිස්

CamScanner

# ජේතවන විහාරයේ නටබුන්

CamScanner

# ජේතවන විහාරයේ නටබුන්

ඒ.එම්. නිමල් වසන්ත මෙන්ඩිස්

(B.A(special),PGDIA, M.SC, M.Phil, Ph.d)

සමන් ප්‍රකාශකයෝ සහ මුද්‍රණ ශිල්පියෝ
39/4, වෙල පාර,
ගංගොඩවිල
නුගේගොඩ.

මෙන්ඩිස්, වසන්ත
ජේතවන විහාරයේ නටබුන් / වසන්ත මෙන්ඩිස්
නුගේගොඩ ඃ සමන් ප්‍රකාශකයෝ, 2018
පි. 115 ඃ චිත්‍ර ඃ සෙමී. 20

ISBN 978-955-4980-09-9

i. 930.1095493 ඩිවි 23 ii. ග්‍රන්ථ නාමය

1. ශ්‍රී ලංකාව - ඉතිහාසය
2. පුරාවිද්‍යාව - ශ්‍රී ලංකාව

ජේතවන විහාරයේ නටබුන්

© ඒ.එම්.නිමල් වසන්ත මෙන්ඩිස්

පළමු මුද්‍රණය: 2018

ISBN : 978-955-4980-09-9

පරිගණක පිටු සැකසුම හා
කවරය නිර්මාණය ඃ සරසවි ක්‍රියේෂන් 0718581279

මුද්‍රණය සහ ප්‍රකාශනය ඃ
සමන් ප්‍රකාශකයෝ සහ මුද්‍රණ ශිල්පියෝ
39/4, වෙල පාර,
ගංගොඩවිල, නුගේගොඩ.



# හැඳින්වීම.

ශ්‍රී ලංකාවට ථේරවාදී බුදුදහම හඳුන්වා දීමෙන් පසුව බහුදේවවාදී ආගම් පිළිබඳව විශ්වාසයක් ඇති කරගෙන සිටි ජනතාවට නව ආගමික සංස්කෘතියක් ශ්‍රී ලංකාවෙහි මුල්බැස ගත්හ. නව ථේරවාදී බුදුදහම ක්‍රි.පූ. 3වන සියවසසේ සිට ක්‍රි.ව. 1වන සියවස දක්වා අඛණ්ඩව ව්‍යාප්තිය සිදුවූවත් වළගම්බා රාජ්‍ය සමය ලාංකේය බුදුසසුනෙහි සංධිස්ථානයක් බවට පත් විය. එනම්, ශ්‍රී ලාංකේය බුදු සසුන නිකාය දෙකකට බෙදීම සිදු වනුයේ වළගම්බා රාජ්‍ය සමයෙහි අභයගිරි විහාරය ඉදිකිරීමත් සමඟ ය. එතැන් පටන් මහාවිහාරය ථේරවාද සම්ප්‍රදාය අනුගමනය කරමින් බුදුසසුන රැකගැනීමට උත්සාහ ගනිද්දී අභයගිරි නිකාය මහායාන සම්ප්‍රදාය අනුගමනය කරමින් බුදුදහම ව්‍යාප්ත කිරීමට උත්සාහ කළහ. ක්‍රි.ව. 3වන සියවස ද ලාංකේය බුදුසසුනෙහි තවත් සන්ධිස්ථානයක් ලෙස සඳහන් කළ හැකි ය. එනම්, ලාංකේය බුදුසසුනට තෙවන නිකාය බිහිවීම යි. මහසෙන් මහරජ දවස මහාවිහාර සීමාව තුළ ම ජේතවනාරාමය ඉදිකොට සාගලිකයන්ට පූජා කළහ. මෙතැන් පටන් ශ්‍රී ලංකාවෙහි බුදුසසුන නිකායයන් තුනක් ලෙස ඉතිහාසගත විය.

ජේතවන විහාරය මහසෙන් රාජ්‍ය සමයෙහි ඉදිවූවත් එයට පසුබිම සකස් වනුයේ ගෝඨාභය රාජ්‍ය සමය යි. අභයගිරිකයින් "වෛතුල්‍යවාදය" බුද්ධභාෂිත යැයි ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවේ දී අභයගිරි භික්ෂූන් වහන්සේලා හැටනමක 'ඉන්දියාවේ කාවේරි පටුනට පිටත් කරනු ලැබී ය. මෙම අවස්ථාවේ දී උස්සිලියාතිස්ස තෙරුන් වහන්සේ, 300ක් භික්ෂූන් වහන්සේලා සමඟ දක්ඛිණගිරියට

පිටත්විය. දක්ඛිණගිරි භික්ෂූන්වහන්සේලා සාගල නම් භික්ෂුවගේ නායකත්වය යටතේ වාසය කළ බැවින් එම පිරිස සාගලික නිකාය නමින් එකල ප්‍රසිද්ධියට පත් විය. මේ අතරතුර කාවේරි පටුනට ගිය භික්ෂූන් වහන්සේලා සංඝමිත්‍ර භික්ෂුව වෙත ශ්‍රී ලංකාවේ දී තමන්ට විඳින්නට සිදු වූ අත්දැකීම් විස්තර කරන ලදි. අනතුරුව සංඝමිත්‍ර භික්ෂුව ලංකාවට පැමිණ ගෝඨාභය රජුගේ පුතුන්ට අධ්‍යාපනය ලබා දෙන ලදි.

මහසෙන් කුමරා රාජ්‍යයත්වයට පත්විමෙන් පසුව ලංකාවට පැමිණි සංඝමිත්‍ර භික්ෂුව මහසෙන් රජු ලවා මහාවිහාරය විනාශ කළා පමණක් නොව එහි උදු ද වපුරන්නට සැහැසි විය. අනතුරුව මහාවිහාර සීමාව තුළ ම ජේතවනාරාමය ඉදිකොට සාගලික නිකායිකයින්ට භාරදෙන ලදි.

මෙම නව නිකාය ක්‍රි.ව. 3වන සියවසසේ සිට ක්‍රි. ව. 12වන සියවස දක්වා වූ කාල පරිච්ඡේදය තුළ ක්‍රියාත්මකව පැවත තිබේ. වර්තමානය වනවිට මෙහි නටබුන් ස්වරූපයෙන් දක්නට ලැබේ. මෙම කෘතිය මාගේ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය සඳහා ලියන ලද පර්යේෂණ නිබන්ධය යි. මෙයින් මා උත්සාහ ගනු ලැබුවේ ජේතවන විහාරයේ ඓතිහාසිකත්වය මතු කිරීමට හා එහි නටබුන් තුළින් හෙළිවන සිංහලයාගේ අද්විතීය කලා හැකියාව මෙන් ම නිර්මාණශීලිත්වය ඇගයීම යි.

ජේතවන විහාරයේ ආරම්භයට බල පෑ පසුබිම්මෙහි පළමු පරිච්ඡේදයෙන් සාකච්ඡා වන අතර ම දේශපාලනික බලපෑම මත ගොඩනඟන ලද විහාර ස්ථානයක් ලෙස ද සඳහන් කළ හැකි ය.



එසේ ම මෙම විහාර ස්ථානයේ පූජනීයත්වට හේතු වන්නා වූ සාධක කෙරෙහි මෙහි දී අවධානයට ලක් කොට තිබේ.

ජේතවන විහාරය ආගමික සිද්ධස්ථානයක් වශයෙන් ක්‍රියාත්මකවීමට රජවරු දැක් වූ සහයෝගය ජේතවන නිකාය මෙන් ම නිකායට සම්බන්ධ වෙනත් නිකායයන් මෙන් ම මෙම විහාරස්ථානයෙන් ලාංකීය භික්ෂු ශාසනයට මෙන් ම ගිහි ජනතාවට සිදු වූ සේවය දෙවන පරිච්ඡේදයෙහි ඇගයීමට ලක් කොට තිබේ. මෙම කාල පරිච්ඡේදය භික්ෂූන් වහන්සේලා නිකාය වශයෙන් බෙදී පැවතුණු නිසා ම භික්ෂුණීන් වහන්සේලාට ද ස්වාධීනය වාසය කිරීමේ හැකියාවක් නො තිබිණි. ඒ අනුව මෙම විහාරයට සම්බන්ධ භික්ෂුණී ආරාම පිළිබඳව ද මෙම පරිච්ඡේදයෙහි අවධානය යොමු කොට ඇත.

ක්‍රි.ව. 12වන සියවසෙන් පසුව ජේතවන විහාරය පිරිහීමට පත් වූ බව අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි විය. සිව්වන පරිච්ඡේදයේ දී ජේතවන විහාරය පිරිහීමට බල පෑ ආගමික හා දේශපාලනික සාධක පිළිබඳව සාකච්ඡා කොට ඇත.

වර්තමානය වනවිට ජේතවන විහාර සංකීර්ණය නටබුන් ස්වරූපයෙන් දක්නට ලැබෙන අතර එයින් ජේතවන දාගැබ,පිළිම ගෙය (බටහිරපිහිටි), උපෝස්ථාගාරය, පංචාවාස ගොඩනැගිලි (තෝරාගත්), දානශාලාව හා බෞද්ධ ගරාදි වැට යන අංශ කෙරෙහි අවධානය යොමු කොට තිබේ. ඡායාරූප සහ සැලසුම් උපයෝගී කොටගෙන කාල නිර්ණය, භාවිත කරන ලද්දේ කුමන කටයුත්තක්

සඳහා ද, ඒවායේ වාස්තු විද්‍යාත්මක ලක්‍ෂණ පිළිඹිබුව සිව්වන පරිච්ඡේදයෙන් අනාවරණය කොට ඇත.

ක්‍රි.ව. 3වන සියවසයෙන් ආරම්භ වූ ජේතවන විහාරය නොයෙක් නරපතියන් අතින් සංවර්ධනයට පැමිණි බවත් 12වන සියවස දක්වා ක්‍රියාත්මකව පැවති බවත් ආගමික වශයෙන් මෙන් ම කලා නිර්මානයන්ගෙන් යුක්ත වූ ආරාම සංකීර්ණයක් බවත් සඳහන් කළ හැකි ය.



## ස්තුතිය

ශ්‍රී ලංකාවේ ස්තූපයන්හි ඉතිහාසය පිරික්සා බැලීමේ දී අනුරාධපුරයෙහි පිහිටි ජේතවනාරාමයට හිමි වන්නේ අද්විතීය ස්ථානයකි. මහසෙන් රජු දවස තෙක් දිවයන මෙම විහාරයෙහි චෛත්‍යය සඳහා බුදුන් වහන්සේගේ පටිධාතුව තැන්පත් කොට තිබේ. මෙම විහාර සංකීර්ණයෙහි ඓතිහාසිකත්වය ගවේෂණය කිරීමේ අරමුණින් ජේතවන විහාරයෙහි නටබුන් යන මාතෘකාව යටතේ මෙම පර්යේෂණය සිදුකරන ලදි. මෙකී නිබන්ධය ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය සඳහා ඉදිරිපත් කළ ස්වාධීන නිබන්ධනය යි. මා වැඩි කැමැත්තක් දැක්වූයේ පුරාවිද්‍යාව විෂය කෙරෙහි ය. එයට හේතුව වූයේ මා දහම් අධ්‍යාපනය ලද බෙල්ලන්විල ශ්‍රී බෝධිරාජ දහම්පාසැලෙහි පැවති ප්‍රදර්ශනයක් සඳහා චෛත්‍යය ආකෘති සකස් කිරීම යි. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙහි පුරාවිද්‍යාව විෂය හැදෑරීමට අවස්ථාව හිමිවූවත් ඒ වනවිටත් මා රජයේ නිලධාරියෙකු ලෙස කටයුතු කිරීම නිසා පුරාවිද්‍යාවවිෂය උප විෂය වශයෙන් තබාගෙන බෞද්ධ ශිෂ්ටාචාරය විෂය ගෞරව උපාධිය සඳහා තෝරා ගන්නා ලදි. එනමුත් වැඩි කැමැත්තක් පුරාවිද්‍යාව විෂය කෙරෙහි දැක් වූ නිසා අවසන් වසර ස්වාධීන නිබන්ධය සඳහා මෙම මාතෘකාව තෝරා ගන්නා ලදි.

විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන කාලය තුළ රැකියාවක නිරතවූවත් එය අධ්‍යාපනයට බාධාවක් කරනො ගත් මා හට එවකට දෙහිවල-ගල්කිස්ස මහනගර සභාවේ නාගරික කොමසාරිස් වශයෙන් කටයුතු කළ ඩබ්ලිව්.ඒ.ගුණවර්ධන මහතාගෙන් මාගේ අධ්‍යාපනයට ලැබුණේ අනුපමේය අනුග්‍රහයකි. එතුමාගේ සහෝගය නො

ලැබෙන්නට මා හට විශ්වවිද්‍යාලයෙහි උපාධිය ලබා ගැනීමට නො හැකිවන්නට විය. ඩබ්ලිව්. ඒ. ගුණවර්ධන මහතාට ස්තුති කරනුයේ ඒ නිසාවෙනි. දෙහිවල -ගල්කිස්ස මහනගර සභාවේ හිටපු නාගරික ලේකම් එන්.ටී.කුමාරසිංහ මහත්මියටත් මාගේ ස්තුතිය හිමි විය යුතු ය.

රාජකාරි කාලය තුළ විශ්වවිද්‍යාල විභාගවලට පෙනීසිටීමේ දී මාගේ රාජකාරි කටයුතු ආවරණය කළ ගීතා ජයසිංහ මහත්මියත්, චම්පිකා පෙරේරා මෙනෙවියත් ඉතාමත් ම ගෞරවයෙන් සිහිපත් කරමි. මෙම පර්යේෂණ නිබන්ධය සකස් කිරීමේ දී මා හට සහය දුන් ගයානි ආරියසිරි මහත්මියත්, බිනෝලි පෙරේරා මහත්මියටත් ස්තුතිය පිරිනැමිය යුතු ය. මාගේ අධ්‍යාපන කටයුතු සාර්ථක කර ගැනීමට සහයෝගය ලබාදුන් ලනී සොයිසා මෙනෙවියටත්, එස්. දේවිගාරාණි මහත්මියත් සිහිපත් කරමි.

මෙම කෘතිය සඳහා පසුවදන ලබාදුන් ආචාර්ය ගාමිණි රණසිංහ කථිකාචාර්යවරයාටත් මා හට නන් අයුරින් සහයෝගය ලබා දුන් සැමටත් සමන් මුද්‍රණාලයටත් මාගේ ස්තුතිය පිරි නමමි.



# සංකේත නිරූපණය

| | | |
|---|---|---|
| අ. | - | අභයගිරිය |
| අ.න. | - | අනුරපුර නටබුන් |
| අ.වි. | - | අනුරපුර විහාරාම |
| චු.ව. | - | චුල වංශය |
| නි.ක. | - | නිකාය සංග්‍රහය |
| පැ.ල. | - | පැරණි ලක්දිව |
| පැ.සි. | - | පැරකුම්බා සිරිත |
| ම.ව. | - | මහාවංශය |
| ල.ම.අ. | - | ලක්දිව මහායාන අදහස් |
| ල.බු.ඉ. | - | ලක්දිව බුදුසමයෙහි ඉතිහාසය |
| ල.ස්. | - | ලක්දිව ස්තුප |
| ල.සෙ. | - | ලක්දිව සෙල්ලිපි |
| ව.ප. | - | වංසත්ථප්පකාසිනිය |
| ස. | - | සරසවිය |
| සං. | - | සංස්කෘති |
| ස.ස. | - | සංඝසංවිධාන |
| ස.ල.ඉ. | - | සංක්ෂිප්ත ලංකා ඉතිහාසය |
| සි.ශි.ලේ.වි. | - | සිංහල ශිලා ලේඛන විවරණය |
| සි.හා.න | - | සිවුර හා නගුල |
| ස්. | - | ස්තුප |
| ශා.ව. | - | ශාසන ප්‍රභා |
| ශා.ව.ප්‍ර. | - | ශාසන වංශ ප්‍රදීපය |
| භි.ව. | - | භික්ෂුණී වංශය |



CamScanner

ENGLISH BOOKS:

A.R. A. S. L. - Architectural Remains Anuradhapura Sir Lanka

A. S. C. A. R. - Archaeologict-41 Sarvey Ceylon. Annual Reports.

A. S. C. P. P. A. R. - Archaeological Sarvey of Ceylon. plan and Pierce. Annual Report. 6

E.Z - Epigraphia in Zeylanica

J. P. P. A. E. - Jetawana Project – PerstArchaeologica] Excavation and Research Report.

L, S. B. D. P. V. - Lea Sectesbuddiques du Petit Vehicale

T. C. J. E. - The Ceylon Aloumal of the Humanities.

T.C. T. S. L. - The Culture Triangle of Sri Lanka.



# පටුන


හැඳින්වීම v-viii

ස්තුතිය ix-x

සංකේත නිරූපණය xi-xii

ඡායාරූප නාමාවලිය xv

පළමු පරිච්ඡේදය

1. ජේතවන විහාරයේ ආරම්භය 1-10
   1.1. ජේතවන විහාරයේ ආරම්භයට බල පෑ දේශපාලන හේතු 1-6
   1.2. ජේතවනාරාමයෙහි පූජනීයත්වයට බල පෑ සාධක 7-10

දෙවන පරිච්ඡේදය

2. ජේතවන විහාරයේ පැවැත්ම 11-34
   2.1. ජේතවන විහාරයට රජවරුන්ගෙන් ලැබුණු සහයෝගය 12-21
   2.2. ජේතවන නිකාය 22-25
   2.3. ජේතවන නිකායට සම්බන්ධ වෙනත් නිකායිකයෝ 26
      2.3.1.පාංශුකූලික නිකාය 26-27
      2.3.2.අරඤ්ඤක භික්ෂූණ් වහන්සේලා 27-28
   2.4. ජේතවන විහාරයට සම්බන්ධ මූල 28
      2.4.1.රතන මා පිරිවෙන 29
      2.4.2.සෙනෙවිරද් පිරිවෙන 29-31
      2.4.3.ජේතවන විහාරයෙන් සිදු වූ සේවය 31-32
   2.5. ජේතවන විහාරයට සම්බන්ධ භික්ෂුණී ආරාම 32-33

3. තුන්වන පරිච්ඡේදය

   3.1. ජේතවන විහාරයේ පිරිහීම 35-43

4. සිව්වන පරිච්ඡේදය 45
   4.1. අභයගිරිය හා ජේතවන නම් මාරුවීම 45-46
   4.2. ජේතවන දාගැබ 47-66




CamScanner

4.3. පිළිමගෙය (දාගැබට බටහිරින් පිහිටා ඇති) 66-72
4.4. උපෝසථාසාරය 73-78
4.5. දානශාලාව 78-82
4.6. පංචාවාස ගොඩනැගිලි 82-87
4.7. බෞද්ධ ගරාදි වැට 87-91

**නිගමනය** 92-99

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය** 100-102

**රූප සටහන්** 103-115



# ඡායාරූප නාමාවලිය

ඡායාඵලක අංක 1 - ජේතවන ස්තූපය

ඡායාඵලක අංක 2- ස්තූපයට ප්‍රවිශ්ටවීමට ඇති පඩිපෙළ (නැගෙනහිර පිහිටි)

ඡායාඵලක අංක 3 - පියස්ස සහිතව තිබුණා යැයි අනුමත කළ හැකි ගොඩනැගිල්ල

ඡායාඵලක අංක 4 - පිළිමගෙය

ඡායාඵලක අංක 5 - පිළිම පීඨය

ඡායාඵලක අංක 6 - උපෝසථාසාරය

ඡායාඵලක අංක 7 - ජන්ථාගාරය (උපෝසථාසාරයේ පිහිටි)

ඡායාඵලක අංක 8 - දාන ශාලාවේ ප්‍රධාන බත් ඔරුව

ඡායාඵලක අංක 9 - දානශාලාවට සම්බන්ධ ගොඩනැගිල්ල

ඡායාඵලක අංක 10 - පංචාවාස ගොඩනැගිල්ලේ උතුරු දිසාවේ මතුපිට පෙනුම

ඡායාඵලක අංක 11 - පංචාවාස ගොඩනැගිල්ලේ උතුරු දිසාව

ඡායාඵලක අංක 12 - පංචාවාස ගොඩනැගිල්ලක ප්‍රධාන දොරටුව සඳහා සකස් කර ඇති කොරවක්ගල

ඡායාඵලක අංක 13 - බෞද්ධ ගරාදි වැටේ ප්‍රධාන දොරටුව



CamScanner

# පළමු පරිච්ඡේදය
## ජේතවන විහාරයේ ආරම්භය

ශ්‍රී ලංකා බෞද්ධ ඉතිහාසය වූ කලි විවිධ සිද්ධීන්ගෙන් ගහණ වූවකි. ක්‍රි. පූ. 03 වන සියවසේ දී මිහිඳු මහරහතන් වහන්සේ ථේරවාදී බුදු දහම ශ්‍රී ලංකාව තුළ චිරස්ථායි කළ ද ධර්මය හා විනයට විටින් විට නොයෙකුත් අන්දමින් විවේචන සිදුවීම සහ දේශපාලන අස්ථාවරත්වය නිසා මහායාන ධර්මයේ සම්ප්‍රාප්තිය ද වළක්වනු නො හැකි විය. සාහිත්‍ය මූලාශ්‍ර වාර්තා කරන අන්දමට මහායාන ධර්මය ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්ත වූයේ වරක් දෙවරක් නොව එය කිපවරක් ම සිදු වූවකි. ප්‍රථමයෙන් ම විරුද්ධ වූවත් පසු කාලය වනවිට මහායාන ධර්මය පිළිගත් මහායාන ධර්මයේ ශාඛාවක් ලෙසින් ලංකා ඉතිහාසයට නව පිටුවක් එක් කළ ජේතවන නිකායේ ආරම්භය පිළිබඳ ව කරුණු සෙවීමේ දී එයට ප්‍රධාන වශයෙන් බලපෑවේ දේශපාලන හේතු බව සඳහන් කිරීම සාධාරණ ය.

### 1.1ජේතවන විහාරයේ ආරම්භයට බල පෑ දේශපාලන හේතු

බුදු දහම පැමිණීමෙන් පසුව ලක්වැසි ජන ජීවිතයේ සෑම අංශයක් වෙත ම නව දහම ගමන් කරනු ලැබුවේ කඳු මුදුනකින් ආරම්භ වන කුඩා දිය කඩිත්තක් විශාල ප්‍රදේශයක් ස්වයංපෝෂණය කරන්නට පීවය දෙන්නාක් මෙනි. එනිසා ම ලක්වැසි භික්ෂූන් වහන්සේලාට ලක්දිව දේශපාලනය පිළිබඳ ව කිසියම් වූ අයිතියක් තිබුණා සේ ම රජවරුන්ට ද භික්ෂූන් වහන්සේලාට සිව්පසයෙන් සංග්‍රහ කරමින් තම සිතැඟි පරිදි උපස්ථාන කිරීමට අවස්ථාව තිබුණි.

ජේතවන විහාරයේ ආරම්භයට දේශපාලනය බලපෑ අයුරු විමසීමේ දී එය ගෝඨාභය රජුගේ දෙවැනි පුත් මහසෙන් රජුගේ රාජ්‍ය සමයේ සිදු වූ බව[1] (ක්‍රි.ව. 276-303) සඳහන් කළ හැකි ය. නමුත් එහි පසුබිම සකස් වූයේ ගෝඨාභය රජු දවස ය.

ගෝඨාභය රජු දවස අභයගිරි විහාරිකයන් විසින් දෙවෙනි වරටත් 'වෛතුල්‍යවාදය' බුද්ධ භාෂිත යැයි ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවේ දී [2] (ගෝඨාභය) රජු විසින් ථේරවාදී බුදු දහම සුරක්ෂිත කරනු වස් 'වෛතුල්‍යවාදය' ගත් අභයගිරි භික්ෂූන් වහන්සේලා හැට නමක් තෝරා එම භික්ෂූන්ගේ පිට මත (වෙර) ලකුණු තබවා දේශත්‍යාග කරන ලදි.[3]මෙම අවස්ථාවේ දී කිසිදු පක්ෂයක් ගනු නො ලැබූ උස්සිලියාතිස්ස භික්ෂූන් වහන්සේ තවත් භික්ෂූන් වහන්සේලා තුන්සියයක් පමණ දෙනා රැගෙන නැවතත් බුද්ධිමත් රජකු පහළ වූ කළ මෙවැනි ම තත්ත්වයකට මුහුණදීමට සිදු වේ යැයි සිතා දක්ෂිණගිරියට[4] ගොස් පදිංචි වූහ. දක්ෂිණගිරික භික්ෂූන් සාගල නම් භික්ෂුවගේ නායකත්වය පිළිගෙන ආගම ආඛ්‍යාත කළ බැවින් එම නිකාය 'සාගලික නිකාය' නමින් ප්‍රසිද්ධියට පත් විය. කෙසේ වුව ද ගෝඨාභය රජු විසින් දේශත්‍යාග කරන ලද භික්ෂූන් ඉන්දියාවට ගොස් මහායාන ධර්මයේ ප්‍රබල භික්ෂුවක් වූ කාවේරි පටුනෙහි

---

[1] ගුණවර්ධන, රණවීර, සිː හා නාː, 1993, පි.33

[2] නිː සඃ, 1955, පි.19

[3] එම

[4] දක්ෂිණගිරි විහාරය වළගම්බා රජුගේ යෝධයන් සත්දෙනා අතරින් අත්තිය නම් තැනැත්තා විසින් නිර්මාණය කරන ලද බව මහා වංසයේ (පොල්වත්තේ බුද්ධදත්ත හිමි සංස්කරණය ) 33 පරිච්ඡේදයේ 89-90 ගාථාවල සඳහන් වේ. ක්‍රි.පූ. 89-77 අතරේ ඉදි වූ බව කියැවෙන මෙය, ''තිස්නවෙත'' (තිස්ස චෛත්‍යය) යන නමින් ව්‍යවහාර කොට තිබේ. එම විහාර නාමය දකිනි විහාර (දක්ෂින විහාරය) බව, Ancient Ceylon හි සඳහන් වේ.





සංඝමිත්‍ර නම් භික්ෂුවක් සමඟ කුලුපග වී තමන්ට සිදු වූ අතවරය පවසන ලදි. එම අවස්ථාවේදී,

> ''මහවෙහෙර වැස්සන්ට වෛතුල්‍යවාදිය ගන්වමි. නැතිනම් ඔවුන්ගේ විහාරය මුලින් උදුරුවා හෝ නස්වා පියමි''[5]

යන අදහස පෙරදූරි කර ගෙන ලංකාවට පැමිණි සංඝමිත්‍ර භික්ෂුව එවකට පාලකයා වූ ගෝඨාභය රජු පහදවා ගෙන ඔහුගේ පුතුන් දෙදෙනා වූ ජෙට්ඨතිස්ස හා මහසෙන් කුමරුවන්ට අකුරු ඉගැන්වීම සඳහා රජ වාසලට ගිය අතර එසේ කරනු ලැබුවේ මහා විහාරයෙන් පළි ගැනීමේ චේතනාවෙනි. ගෝඨාභය රජුගෙන් සංඝමිත්‍ර භික්ෂුවට අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නො හැකි විය. උත්සාහය අත් නො හළ එම භික්ෂුව සිය පරමාර්ථය වැඩිමහල් පුතා වූ ජෙට්ඨතිස්සගෙන් සිදු කර ගැනීමේ බලාපොරොත්තුවෙන් යුතුව ඔහු රජවීමෙන් පසු ලංකාවට පැමිණ වෛතුල්‍යවාදය ව්‍යාප්ත කිරීමට ලංකාවට පැමිණියත් සංඝමිත්‍ර භික්ෂුව කෙරෙහි මෙතුමා එතරම් පැහැදීමක් නොමැති බව හැඟී ගියෙන් පෙරළා භාරතය බලා පිටත් වූයේ ය.

ජෙට්ඨතිස්ස රජුගේ ඇවෑමෙන් පසුව ක්‍රි. ව. 276 දී පමණ රජ බවට මහසෙන් රජතුමා පත්වීමෙන් පසු [6] නැවතත් ලංකාවට පැමිණි සංඝමිත්‍ර භික්ෂුව මහසෙන් රජු අවනත කරගෙන මහාවිහාරයට වෛතුල්‍යවාදය ගැන්වීමට ප්‍රයත්න දැරුවත්[7] එය ව්‍යර්ත වූයෙන් මහසෙන් රජු ලවා මහා විහාරය විනාශ කළේ ය. සංඝමිත්‍ර භික්ෂුවගේ උපදෙස් මත මහා

---

[5] නිඃසඃ, 1955, පි.25

[6] මඃවඃ, 1908, 37 වන පරිච්ඡේදය 1 ගාථාව

[7] නිː සඃ, 1955, පි.28

විහාරය කඩා බිඳ දමුවා පමණක් නොව එම භූමිය තුළ උඳු ද වැපිරි ය. එමෙන් ම

**"මහ වෙහෙර වැසි මහණක් හට දනක් දුනහොත්,**
**ඔහුට සියක් දඩ යයි"** අණ බෙර ද යැවිය.

මහ වෙහෙර සීමා පවා උගුලුවාලමින් මහා විහාර සීමාව තුළ ම ජෝතිවනයෙහි විහාරයක් කරවීමට පටන් ගනු ලැබී ය. මහා විහාරීය භික්ෂූන් වහන්සේලා එයට විරුද්ධත්වය ප්‍රකාශ කරනු ලැබුවත් රජුගේ යහපත් ප්‍රතිචාරයක් නො ලැබූයෙන් රහත් සත් නමක් විහාරයේ බිම් මහලෙහි සඟවා ගිය බවත් මහා විහාර සීමා උගලුවන පුවත ඇසූ සිතුල් පව්වේ අභිඥාලාභී වූ භික්ෂූන් වහන්සේ නමක් රාක්ෂ වේශයක් මවාගෙන යගදාවක් අතින් අමෝරා ගෙනැවිත් දෙනානක වෙහෙරෙහි භික්ෂූන් නුවර බලා පිටත් කරනු ලැබූහ.[8] මෙම ක්‍රියාවෙන් මදක් පසුගාමී වුවත් මහසෙන් රජතුමා සිය අරමුණ ඉටු කරගැනීම අත් නො හැරියහ.

ජේතවන විහාරය ගොඩ නැංවීමට තම සකල දේශපාලන ශක්තියම යෙදවූවත් මහසෙන් රජුගේ මෙම ක්‍රියාවට මහජනයා එකහෙළා ම විරුද්ධ වූහ. රජුගේ හිතවත් ඇමතියෙකු වූ මේඝවර්ණාභය මලය රටට ගොස් සේනා රැස් කරගෙන රජුට විරුද්ධව යුද්ධයට පැමිණි අතර පසුව මහසෙන් රජතුමා තමන් විසින් සිදු කළ සාපරාධී ක්‍රියාවල බරපතලකම තේරුම් ගත්තා පමණක් නොව ඇමතියා සමඟ සාකච්ඡා කොට නැවතත් මහා විහාරය ප්‍රතිසංස්කරණය කරවී ය. මේ අතරතුර රජුගේ වල්ලභ දේවියක විසින් වඩුවකු ලවා සංඝමිත්‍ර භික්ෂුව මැර වීය.

මහසෙන් මහරජ මහා විහාරයට හිතවත්ව ක්‍රියා කිරීමට පොරොන්දු වුවත්, එසේ නො වූ බව පැහැදිලි වනුයේ

8 නිː සං:, 1955, පි.28





මහාවිහාරික භික්ෂූන්ගේ බලවත් විරෝධතා නොතකා මහාවිහාර සීමාව තුළ ම විහාරයක් ඉදි කිරීමට පටන් ගත් බවත්, එය ජේතවන විහාරය වශයෙන් නම් කොට සාගලික නිකායික භික්ෂුවක් වූ තිස්ස හිමියන්ට පූජා කිරීමෙනි. මෙම අවස්ථාවේ දී මහාවිහාරීය භික්ෂූන් වහන්සේලා "ඔහු අධර්මවාදියෙකැයි" [9] චෝදනා කොට මහසෙන් මහරජුගේ බලවත් අකමැත්ත මධ්‍යයේ ම උපැවිදි කරනු ලැබී ය. උපැවිදි කරනු ලැබූ ඔහුව මහාවංස කතුවරයා හඳුන්වා ඇත්තේ,

**"කුහෙන ජිම්හානමාසේ පාපිම්තේත අසඤ්ඤ තෙ"**

යනුවෙනි.[10]

කොහොන්තිස්ස හිමියන් ශාසනයෙන් නෙරපීමෙන් පසුව සාගලිකයෝ ජේතවනයේ පදිංචි වූහ. ජේතවනිකයනුත් ඉන්පසු සාගලික නිකායට අයත් වූහ.[11]

මේ අනුව සලකන විට ජේතවනාරාමය පහළ වූයේ මහත් වාද - භේද මධ්‍යයේ බව කිව යුතු ය. ජේතවනාරාමය පිළිගත් තිස්ස තෙරුවන් ගැන මහාවංශ කතුවරයා කළ ප්‍රකාශය දෙනානකයේ හෙවත් ජේතවනාරාමයේ භික්ෂූන් පිළිගත් බවක් සඳහන් නො වේ.

ජේතවනාරාම භූමියෙන් සොයා ගත් දසවන සියවසට අයත් සෙල් ලිපියක[12] සඳහන් වනුයේ තිස්ස තෙරුන් ඉතා සිල්වත් කෙනෙකු ලෙස ය. එහි මෙසේ ද සඳහන් වේ.

9 මː වː 37 වන පරිච්ඡේදය 32 ගාථාව, 1908
10 මේධානන්ද හිමි, උඩුවේවල., ගාː ප්‍රː, 1986, පි.36
11 E.Z.Vol. 11. Edi: Don Marting De Zilva Wickremesinghe, London, 1982 P.22
12 වනරතන හිමි, කඹුරුපිටියේ. අː නාː, 1970, පි.121

**"සාගුලි මාහිමියන් නමින් පාළ වූ අපිස් සතොස් තිසි මහතෙරනට් පිහිටි දෙනා රජමහා වෙහෙරෙහි"** යනුවෙනි.

මෙම සෙල් ලිපියට විවේචනයක් සපයන සෙනරත්පරණවිතාන මහතා[13] මෙහි තිස්ස නමින් හඳුන්වනු ලබන්නේ දක්ඛිණගිරි විහාරයෙහි විසූ තිස්ස තෙරුණ් බවත් මෙහි සඳහන් වන අන්දමට උන්වහන්සේ මහත් ප්‍රශංශාවට ලක්ව ඇති බවත් පවසයි.

මහා විහාරයට විරුද්ධ මත දැරුවන්ගේ තොරතුරු වංශ කථාවල අපක්ෂපාතිව වාර්තා වී නොමැති හෙයින් යථොක්ත සෙල් ලිපියේ කාලය වූ 10 වන ශත වර්ෂය දක්වා පමණවත් තිස්ස හිමිගේ කීර්තිය පවතින්නට ඇතැයි අනුමාන කළ හැකි අතර මහසෙන් රජතුමා මේ තිස්ස තෙරුන් කෙරෙහි බෙහෙවින් පැහැදුනේ උන්වහන්සේ තුළ පැවති 'අපිස් සතොස්' ගුණය නිසා බව පිළිගැනීම යුක්ති සහගත නො වන්නේද? එනිසා ම උන්වහන්සේට ජේතවන විහාරය පූජා කළා යැයි ද සිතීමට පුළුවන.

මේ අනුව ජේතවන විහාරය 'සාගලික' හිමියන්ගේ ප්‍රධානත්වයෙන් මහසෙන් රජුගේ දායකත්වයෙන්, රජුගේ රාජ්‍ය වර්ෂයෙන් වර්ෂ නමයක් ඉක්ම ගිය පසු සිදු වූ බව, ස්මිදර් මහතා පවසයි.[14] ඒ මහතා පවසන අන්දමට ජේතවන විහාරාමයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරනු ලැබුවේ, ක්‍රි. ව. 295 දී ය.

13 Smither G. James . A.R.A.S.L. by Chandra Wikrmagamage, Colombo, 1993. P.68

14 J.P.F. A.E.R.R.Unesco. Colombo. 1982. P.06





## 1.2ජේතවනාරාමයෙහි පූජනීයත්වයට බල පෑ සාධක

මිහිඳු මහරහතන් වහන්සේ ධර්මාලෝකය ලබාදීම සඳහා ලංකාවට වැඩම වූ පසුව දෙවැනි දවසේ සිට සත් දිනක් පුරා සත් දහසක් දෙනාට බුද්ධ ධර්මයේ හරය දේශනා කරන ලද්දේ "නන්දන" උද්‍යානයේ දී ය. සත්‍ය වූ බුද්ධ ධර්මය මෙහි දී මනා කොට දේශනා කරන ලද හෙයින් ද සත් දහසක් පමණ දෙනා ධර්මාවබෝධය ලබා ගත් ස්ථානය නිසා ද මෙම 'නන්දන' උයනට 'ජෝති' උද්‍යානය යයි විශේෂ නාමයක් පට බැඳුණි.[15]

බුද්ධ ධර්මයේ සාරයෙන් පෝෂිත චිරප්‍රසිද්ධියට පත් ධම්මචක්කපවත්වන සූත්‍රය සතියක් පුරා දේශනා කරමින් ධර්ම ප්‍රදීපයේ දීප්තිමත් ආලෝකය විහිදුණේ මෙම පුණ්‍ය භූමියේ හෙයින් "ලංකා ලෝකය" නොහොත් "දීප ජෝතික" යැයි මහින්ද මහරහතන් වහන්සේ නම්වර ලැබූ නිසාදෝ මහින්ද මහරහතන් වහන්සේත් මෙම නන්දන උද්‍යානයත් අතර සමීප සම්බන්ධතාවයක් ගොඩ නැඟෙන්නට ඇත. ඒ කෙසේ වෙතත් මෙම නන්දන උද්‍යානය පසු කාලය වන විට ජෝති "ජේත වී " ජේතවනාරාමය" යන නාමය නිර්මානයවීමත් මෙහි දී අනුබුදු වශයෙන් ගෞරවයට පාත්‍ර වූ මිහිඳු මහරහතන් වහන්සේගේ පාදස්පර්ශවීම නිසා මෙහි පූජනියත්වයට හේතු වන්නට ඇත.

මිහිඳු හිමියන් මිහින්තලයේ පිරිනිවන් පෑ පසුව එම ශුද්ධ ශරීරය ගෙනවුත් සොහොන් කළ තැන පිළිබඳ ව වංශකථා දෙක (මහාවංශය, දීපවංශය) පරස්පර විරෝධී අදහස් දක්වයි. දේවානම්පියතිස්ස රජුගේ ඇවෑමෙන් පසුව රජය වූ 'උත්තිය රජු' මිහිඳු හිමිගේ ධාතු කොටසක් නිධන් කර උන්වහන්සේ සොහොන් කල තැන ඉදි කළ බව මහාවංශයේ සඳහන් වුවත් එහි නිශ්චිත ස්ථානයක් සඳහන් වන්නේ නැත.

15 J.P.F. A.E.R.R.Unesco. Colombo. 1982. P.07

මිහිඳු හිමියන්ගේ දෙන සහිත රත්සිවි ගෙය, උපෝසථාගාරය හා දාන ශාලාව අතර තැනක මහාවිහාර සීමාව තුළ එහි උතුරු දකුණු අක්ෂය අසුවන සේ තැබූ බව වංශ කථා දෙකෙහි ම සඳහන් වේ.[16]

දීප වංශයේ සඳහනට අනුව සියලු ගෞරව බහුමාන පිදීමෙන් අනතුරුව මිහිඳු හිමියන්ගේ ශ්‍රී ශරීරය ථූපාරාම චෛත්‍යය තුන් වරක් ප්‍රදක්ෂිණා කරවා මිහිඳු හිමියන් වැඩ විසූ ප්‍රසිද්ධ "තිස්සාරාමයට" පෙරදිගින් ස්ථානයක සොහොන් කළ බව සඳහන් වේ.

මිහිඳු හිමියන්ගේ ආදාහනය කුසිනාරාහි සිදු වූ බුදුරජාණන් වහන්සේගේ ආදාහන උත්සවයට සමාන ආකාරයෙන් නිර්ණය කිරීම වශයෙන් බුද්ධඝෝෂ හිමියන් මහා පරිනිබ්බාණ සූත්‍රයට අටුවා පෙළ ගැසීමේ දී සඳහන් කරනුයේ එය අනුරාධපුරයට දකුණින් වූ ජේතවන භූමියට සමීපව සිදු වූ බව යි. මහාසාෂි බුදුවරුන් වහන්සේලා වැඩමවීම පිළිබඳව ජාතක කතාත් විවිධ නමින් හඳුන්වන මහා මේඝවනය තමන් වහන්සේ පිළිගත් සැටිත් සැළකීමේ දී මිහිඳුහිමිගේ ඓතිහාසිකත්වය බුදුරජාණන් වහන්සේගේ තැන ගන්නා බැවින් එම අවස්ථාව සිහිවීම වශයෙන් එම භූමියේ මෙම චෛත්‍යය ඉදි කළ යැයි විශ්වාස කළ හැකි ය.

ජේතවනාරාම චෛත්‍ය සම්බන්ධ පූජනීයත්වය පිළිබඳ ව ඉහත සඳහන් තොරතුරු පිළිගතහොත්, ලෝකයේ විශාලතම ස්තූපය වශයෙන් මහසෙන් රජු විසින් ඉදි කරන ලද "ජේතවන විහාරය" ශ්‍රී ලංකා භූමියේ ඇති වැදගත් ම බෞද්ධ ස්මාරක අතුරින් එකක් වශයෙන් හැඳින්වීම යුක්ති යුක්ත ය.

නමුත් එය එලෙසින් ම පිළිගැනීමට තවමත් අපට හැකියාවක් නොමැත. මෙම හැඳින්වීම අනුමත කරන තවත්

[16] J.P.F. A.E.R.R.Unesco. Colombo. 1982. P.07





වැදගත් සාධකයක් වනුයේ ජේතවනාරාම චෛත්‍යය ඉදි කරන තෙක් අනුරාධපුරයේ සියලු ම ස්තූප කරවන ලද්දේ ශුද්ධ ධාතූන් තැන්පත් කිරීමට හෝ එම ස්ථානය පිළිබඳ යම් වැදගත් සිද්ධියක් මෙනෙහි කිරීමට බව එම මතය යි.

මහසෙන් මහරජු මෙම ස්ථානය තෝරා ගත්තේ මන්දැයි පිළිගත හැකි කිසිදු සඳහනක් තවම ලැබී නැත. යම්කිසි ප්‍රාතිහාර්යයකින් ලබා ගත් පටි ධාතුවෙහි කොටසක් එහි නිධන් වී ඇතැයි සඳහන් වන්නේ, 13 වැනි ශතවර්ෂයේ සාහිත්‍යය කෘතියක් වූ "පැරකුම්බා සිරිත" නම් වූ කෘතියෙහි ය.[17]

තෙදින් මහසෙන් නැමති මහසෙන් රජෙක්දෙනා වෙහෙරෙනු
පුර
රියන් සතළිස්තුරා සියයක් කරවමින් මහා සෑයක් මන          ගර
බුදුන් ගුළ සලකා පටි දා සුරපුරෙන් බසිවැයි ඉටන්          කර
ඉදින් නොවැසිව රහ බොමැයි රඟවිත අතින් ගෙන සිටින          එමවර

වඩාගෙන උන් සුරිඳු නුඹ ගැබ උන් පටිදා එනවෙර          දැක
දමාරාවිත සුවඳ සිලිලෙන් දොවා තම සුබ ලකුණු අත්          දෙක
එදා අල්වන අසුරියනක් පමණ දුරු කැර නැගී සහ          සක
යොදා උකුලේ තිබු සිරියැද ගෙන කැපී පැන ඉන් අඩක්          එක

යනුවෙන් එහි සඳහන් වේ.

[17] වික්‍රමසිංහ, කේ.ඩී.පී., පැ:සි:, 1970. පි.36 17-18කවි

ජනප්‍රවාදයේ එන අන්දමට මෙම ජේතවනාරාම භූමිය බහිරවයකු අරක් ගෙන ඇතැයි යන ආකල්පය පැවති තිබේ. ඒ අනුව එදා අනුරපුර වැසියන් එම බහිරවයා සඳහා මෙම ස්ථානයේ කුඩාවට තැනූ ගොඩනැගිල්ලක පුද පූජා පවත්වන්නට ඇතැයි ද පසුව එම ස්ථානයේ මෙම විශාල දාගැබ ඉදි කරන්නට ඇතැයි අනුමාන කිරීමට පුළුවන. නූතනයේ ද මෙම සංකල්පය අනුරපුර වැසියන් අතර ජනප්‍රියව පවතින බව විහාරවාසි ස්වාමීන් වහන්සේ සමඟ පැවති සාකච්ඡාවේ දී අනාවරණය කරන ලදි.



# දෙවන පරිච්ඡේදය

## ජේතවන විහාරයේ පැවැත්ම

දේවානම් පියතිස්ස රජු දවස මහා විහාරය කේන්ද්‍ර කොටගෙන, ලංකාව තුළ බුද්ධ ශාසනය ප්‍රතිෂ්ඨාපනය කරනු ලැබීය. ඒ තුළින් බිහි වූ සංඝ සංවිධානය වළගම්බා රජ දවස දක්වා කිසිදු වෙනසකට භාජනය නො වීය. පසුව වළගම්බා රාජ්‍ය සමයේ දී අභයගිරි විහාරය ආරම්භ වීමෙන් එතෙක් මහාවිහාරය මුල් කරගෙන බිහි වූ සමාජය පළල් වූවා සේම එය දෙකොටසකට බෙදුණි. අනතුරුව අභයගිරි නිකායෙන් භින්න වී ජේතවන නිකාය බිහිවීම ද සංඝ සමාජයේ හා එතෙක් පැවති ආගමික රටාවේ තවත් වර්ධිත ස්වරූපයක් සලකුණු කරන්නක් වශයෙන් සැළකිය හැකි ය.

ජේතවන විහාරයේ පැවැත්ම පිළිබඳ ව, සාහිත්‍ය මූලාශ්‍රවලින් සැපයෙන තොරතුරු අල්ප වුවත් එය ක්‍රි.ව. 12 වන සියවස දක්වා පමණ ක්‍රියාත්මක ස්වරූපයෙන් පැවති බව සඳහන් කළ හැකි ය.[18] මෙම කාලය තුළ ජේතවන විහාරය උච්චාවචනයන්ට ලක්වෙමින් ක්‍රියාත්මක වූවත් එම කාලය තුළ ලංකා බුදු සසුනේ මෙන් ම සාමාජික හා සංස්කෘතික යන සෑම අංගයකට ම එහි ආභාසය ලැබෙන්නට ඇතැයි සිතීමට පුළුවන.

[18] ගුණවර්ධන. රණවීර., සීː හා නːා, 1993, පි.35

## 2.1ජේතවන විහාරයට රජවරුන්ගෙන් ලැබුණු සහයෝගය

දේශයේ පාලකයා වශයෙන් රජුට හිමි වනුයේ අග්‍රස්ථානයකි. තම දේශයේ ජනතාවගේ අසීමිත ආශාවන් සීමිත සම්පත් තුළින් තෘප්තිමත් කිරීම සේම තම ජනතාව තුළ අධ්‍යාත්මික ගුණ වගාව සදාචාරය හා චරිත සංවර්ධනය රෝපණය කරන ආගමික මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීමත් ඒවා ආරක්ෂා කිරීමත් සේ ම එහි චිරස්ථිතිය උදෙසා කටයුතු කිරීම ආදිය රජයේ සේවාවන් අතර ප්‍රධාන ය.

මහසෙන් රජුගේ ප්‍රමාණික්‍රාන්ත ක්‍රියා මහා විහාරයට විරෝධීව සිදු කිරීම නිසා, රජු හා සංඝයා අතර වෙනසක් දක්නට ලැබුණත්,[19] රජුත් සංඝයාත් අතර ඉතා සමීප සබඳතාවයක් ගොඩනැගී තිබුණි. ශ්‍රී ලංකාවේ රජවරු සංඝයාගේ උදෙහ්ගිමත් අනුග්‍රාහකයෝ වූහ. එනිසාම රජවරු වෙහෙර විහාර ඉදි කිරීම පමණක් නොව එම වෙහෙර විහාරයන්ගේ නඩත්තු වියදම සඳහා ගම් ද ඒ සඳහා පූජා කරනු ලැබීය.

ලංකාව තුළ බුදු දහම මුල් බැස ගැනීමෙන් පසුව රජවරු සියලු දෙනාම මහා විහාරයට ලැදිව කටයුතු කරනු ලැබූ අතර. වළගම්බා රාජ්‍ය සමයේ 'අභයගිරි' නිකාය බිහිවීමෙන් පසුව ඇතැම් රජවරු ද නිකාය වශයෙන් බෙදී කටයුතු කළහ. මහසෙන් මහරජ දවස ජේතවන නිකාය බිහිවීමෙන් පසුව ද එම ප්‍රතිපත්තිය ම අනුගමනය කරනු ලැබූ අතර කෙසේ වෙතත් ඇතැම් රජවරු ජේතවන නිකායට පක්ෂපාතිව කටයුතු කිරීම එහි සංවර්ධනයට මෙන්ම චිරස්ථිතියට ද ප්‍රබල හේතුවක්

[19] ගුණවර්ධන. රණවීර. සී: හා නා:, 1993, පි.174





වූවා සේ ම තුන් නිකායට ම එකම අකාරයෙන් සැලකිලිමත් තරමක් දුරට හෝ මෙහි අභිවෘද්ධියට හේතු වූවා යැයි සඳහන් කිරීම වටී.

නව නිකායෙහි අභිසංවර්ධනය උදෙසා සේවය ආරම්භ කරනු ලැබුවේ මහසෙන් රජතුමා ය. මහත් වූ අභියෝග මධ්‍යයේ මහා විහාර සීමාව තුළ ම ජේතවන දාගැබ ඉදි කළා පමණක් නොව එහි නවාතැන් ගනු ලැබූ භික්ෂූන් වහන්සේලා උදෙසා සිවුපසයෙන් ද සංගග්‍රහයන් නො අඩුව සිද්ධ කරමිනි. මෙතුමා විසින් ජේතවන දාගැබට අමතරව "රතන-මා" පිරිවෙන හෙවත් මහා පරිවෙණ, මහා සාගලි යයි ප්‍රසිද්ධව වැඩ සිටි කොහොන්තිස්ස හිමියන් වෙත පූජා කොට තිබේ.[20]

වංශකථාකරුවන් මහසෙන් මහාවිහාරීය විරෝධියෙක් වශයෙන් සලකා එතුමාගෙන් සිදු වූ සේවය අපක්ෂපාති ලෙස සඳහන් කර නො තිබීම එතුමාගෙන් සිදු වූ සේවය පිළිබඳ ව ඇගයීමේදීත් තොරතුරු රැස් කිරීමේදීත් අපහසු කරවන්නකි. ජේතවන විහාරයට එතුමාගෙන් සිදු වූ සේවය පිළිබඳ තොරතුරු හමු නො වුණත්, ජේතවන දා ගැබ හා 'රතන-මා' පිරිවෙන යන සාධක දෙක තුළින් බෞද්ධ විහාරස්ථානයක අනිවාර්ය ප්‍රධාන අංග වූ සංඝාවාස පොකුණු, දාන ශාලා, බෝධිය, හා උපෝසථාගාර යනාදී අංගයන් මෙතුමාගේ අවධියේ දී ඉදිවන්නට ඇතැයි අනුමාන කළ හැකි ය. විශේෂයෙන් ම නූතනයේ නෂ්ටප්‍රාය වී ඇති ඉහත සඳහන් ගොඩනැගිලිවල ඉදිකිරීම් ආරම්භ කරන්නට ඇත්තේ මහසෙන් රාජ්‍ය අවධියේ යැයි ජේතවන භූමියේ කැණීම් පරික්ෂකවවරුන්ගේ මතය යි.

[20] E.Z. Vol. 111 Edi. Don Marting De zilva wickreasinghe London, 1982. P. 228-229

මහසෙන් මහරජතුමා එසේ ජේතවන දාගැබ හා එහි විහාර සංකීර්ණය ආරම්භ කරනු ලැබුවත් ඒවායේ නිමාව දකින්නට එතුමා ජීවතුන් අතර සිටියේ නැත. තම පිය රජු විසින් අසම්පූර්ණ කරන ලද මෙම දාගැබ හා විහාර සංකීරණය, ඔහුගේ ඇවෑමෙන් රජ බවට පැමිණි ඔහුගේ පුත් සිරිමේඝවණ්ණ රජතුමා ක්‍රි.ව. 303-331 විසින් සම්පූර්ණ කරන ලදි.[21] එතුමා ජේතවන විහාරීය විරෝධියෙක් වූවා නම් එසේ කටයුතු කිරීම නතර කිරීමට හැකියාව තිබේ. නමුත් තම පියාණන්ගෙන් උරුම වූ දායාදයක් වුවත් ඒ සියල්ල නිමා කිරීම මේඝවණ්ණ ඇමතියා ජේතවන විහාරය දක් වූ සහයෝගයක් වශයෙන් අගය කිරීමට පුළුවනි.

ජේතවන විහාරයට පක්ෂපාති වූ රජෙකු වශයෙන් මිත්තසේන රජතුමා ද (ක්‍රි.ව. 432-433) සඳහන් කළ හැකි ය. එක් වර්ෂයක් පමණක් රජකම් කරනු ලැබුවත් එම සුළු කාලය තුළ ජේතවන දාගැබේ ඇත් පවුර තුළින් තොරණක් කරවී ය.[22]

ධාතුසේන රජතුමා (ක්‍රි.ව. 459-477) රජ බවට පත්වීමෙන් අනතුරුව බුදු දහමේ චිරස්ථිතිය උදෙසා කටයුතු කිරීමේදී මෙම නව නිකාය වූ ජේතවන විහාරය සඳහා ද සිය රාජ්‍ය අනුග්‍රහය ලබා දුන්නේ ය. ඒ අනුව ස්තූපය මුදුනත තනවා තිබුණු ඡත්‍රය පිළිසකර කිරීමත් විශේෂයෙන් ම දාගැබ හුණු බදාම කිරීමත්, විශාල මැණික් එබූ පළිඟු මුදුවක් පළඳවා විසිතුරු කැටයම් සිදු කිරීමත් විශේෂයෙන් ම සැළකිය යුතු ය.[23]

ක්‍රි.ව. 573-575 අතර, ශ්‍රී ලංකාවේ රජ බවට පැමිණියේ මහානාග රජතුමා ය. මෙතුමා විසින් ද ජේතවන ස්තූපය

21 Smither, G. James. A.R.A.S.L. Edi. by Chandra Wikrmmagamage,1993. p. 63

22 ම: වං, 1908, 38 පරිච්ඡේදය, 04 ගාථාව

23 එම, 54, 74 ගාථා.





අලංකාර කිරීමත්, ස්තූපයට විදුලිසැර වැදීම වැළැක්වීම සඳහා ආරක්ෂිත වළල්ලක් (චුම්බක) යෙදීමත් සිදු කර තිබේ. එවගේ ම එතෙක් ජේතවන දාගැබ් හස්ති වේදිකාවේ ගරා වැටෙමින් තිබුණු සිතුවම ද මෙම රජුගේ රාජ්‍ය අනුග්‍රහය මත නැවත ප්‍රතිසංස්කරණය කර ඇත.[24] උඩුකම්හි වැහැප්ගම ද, කුඹුරු අක්කර 300 ක් ද, ජේතවන භික්ෂූන් සඳහා පිදූ බව එහි වැඩිදුරටත් සඳහන් වේ.

දාගැබ පිළිසකර කිරීමත් එහි අලංකාරය සඳහා කටයුතු කිරීම ම, පමණක් නොව මහානාග රජතුමා විසින් මෙම විහාරයේ වසන භික්ෂූන් වහන්සේලාගේ සිවුපසය ලබා ගැනීමට හැකි වන අයුරින් උද්ධාගම හා වසග ග්‍රාමය පූජා කොට එයින් ලැබෙන ආදායම ජේතවන භික්ෂූන්ට පූජා කොට තිබේ.[25]

මහානාග රජුගේ ඇවෑමෙන් පසුව ජේතවන විහාරයේ අභිසංවර්ධනය උදෙසා කටයුතු කළ මීළඟ රජු වනුයේ 1 වන අග්ගබෝධි රජතුමා ය. (ක්‍රි.ව. 575-608) ජේතවන දාගැබ සඳහා රත්මුවා ඡත්‍රයක් තනවන ලද්දේ මෙතුමා විසිනි.[26] මෙම විහාරයට අනුබද්ධ මහා පිරිවෙනෙහි වැඩ විසූ ත්‍රිපිටකධාරී මහතෙරුන් (මෙම හිමියන් ධටසිව නම් විය හැකියි) උදෙසා "හිනෙනරුදිප" විහාරය ද සිරිසංඝබෝධි පිරිවෙන කරවීය.[27]

ක්‍රි.ව.608-618 අතර 1වන අග්ගබෝධි රජතුමාගේ ඇවෑමෙන් පසුව රජ බවට පැමිණ, සය වැනි අග්ගබෝධි රජතුමා ද මෙම දාගැබට දිළිසෙන ශීර්ෂ පළඳනාවක් පැළඳ වූ අතර බෝධිඝරය අසළ ළිඳක් තනවා ජේතවන නිකායික

24 ම: වං, 1908, 40 පරිච්ඡේදය 95,97,98

25 - එම -

26 එම, 42 පරිච්ඡේදය 10,11ගාථා.

27 ම: වං, 1908, 40 පරිච්ඡේදය, 26,31ගාථා

CamScanner

භික්ෂූන්ගේ ප්‍රයෝජනය සඳහා පූජා කොට තිබේ.[28] එවගේම මෙතුමා විසින් ජේතවන විහාරය වෙනුවෙන් වේළුවන නම් විහාරයක් ඉදි කොට පූජා කළ බව සඳහන් වෙතත් එය පිහිටියේ කොතැන ද යන්න තවමත් අවිනිශ්චිත ය එය අනුරාධපුරයටත් මිහින්තලාවටත් අතර පිහිටා තිබෙන්නට ඇතැයි ගෛගර් මහතා කල්පනා කරයි.

IIIවැනි මුගලන් රජු (ක්‍රි.ව. 618-623) ශ්‍රී ලාංකාවේ රාජ්‍ය පදවි ප්‍රාප්තියට පත් වුවාට පසුව, මෙම ජේතවන දාගැබට නවක්ම සිදු කර ඇති බව දක් වේ.[29]

ජේතවන විහාරයට පක්ෂපාතිව කටයුතු කළ මීළඟ රජතුමා වනුයේ IIIජෙට්ඨතිස්ස (ක්‍රි. ව. 632) රජතුමා ය. මෙතුමා විසින් මෙම විහාරයේ වැඩ සිටින භික්ෂූන් වහන්සේලාගේ සිව්පසය උදෙසා "කොණ්ඩිගම" නම් වූ ග්‍රාමය පූජා කොට තිබේ.[30]

IIIවැනි ජෙට්ඨතිස්ස රජුගේ ඇවෑමෙන් රජ බවට පැමිණි, III වැනි අග්ගබෝධි (ක්‍රි.ව. 633-643) රජතුමා ද මෙම විහාරීය භික්ෂූන් වහන්සේලා උදෙසා "මහා මතිකගාම" නම් ගම්වරය පූජා කළ බව සඳහන් වේ.[31] මෙම රජුගෙන් ජේතවන විහාරයට සිදු වූ සේවය මෙපමණක් බව සඳහන් වීමෙන් හැඟී යනුයේ ඇතැම් විට මෙතුමා මේ වනවිට පැවති තුන් නිකාය උදෙසා ම කටයුතු කළ නරපතියෙකු වූ බව ය. එසේ නොවේ නම් මහාවංශ කතුවරයා මොහුගෙන් ජේතවන විහාරයට සිදු වූ සේවය අපක්ෂපාතී ලෙස සඳහන් කර නො තිබීම ය.

මෙතුමාගෙන් පසුව රජ බවට පැමිණි පළමුවැනි දාඨෝපතිස්ස රජතුමා (ක්‍රි.ව 643-650) මෙම විහාරයේ තිබුණු

28 එම, 66 ගාථාව
29 මඃ වඃ, 1908, 44 පරිච්ඡේදය 04 ගාථාව.
30 එම, 97 ගාථාව.
31 මඃ වඃ, 1908, 44 පරිච්ඡේදය 12 ගාථාව.





සියලු අගනා වස්තු අත්පත් කර ගත් බව සඳහන් වේ.[32] එසේ නම් මෙතුමාගේ අවධියේ ජේතවන දාගැබ හා ඒ තදානුබද්ධ විහාර සංකීර්ණ අරාජිකත්වයට පත් වන්නට ඇතැයි අනුමාන කළ හැකි ය. එවගේම මෙතුමාගේ රාජ්‍ය කාලයෙන් වර්ෂ 09 ක් ඉක්ම යන තෙක් මෙම විහාරයට කිසිදු රාජ්‍ය අනුග්‍රහයක් ලැබී නොමැත.

එයින් පසුව රජ බවට පැමිණි II වැනි දාඨෝපතිස්ස රජු දවස සාගලික හා ධම්මරුචික නිකායන්හි "දාඨවේධ" යන නමින් හැඳින්වෙන භික්ෂූන් දෙනමක් විසින් "විනය පිටකයක්" සිදු කිරීම ද මෙතුමාගෙන් ලැබුණු අනුග්‍රහයක් වශයෙන් දක්වීමට පුළුවන.[33]

IVවන අග්ගබෝධි රජතුමා (ක්‍රි.ව. 667-683) ජේතවන විහාරයේ සංවර්ධනය උදෙසා කටයුතු කරමින් එහි නඩත්තු කටයුතු සඳහා විශාල නිශ්චිත ආදායම් සහිත ගම 1000 ක් පූජා කළ බව සඳහන් වේ.[34] මහසෙන් මහරජතුමා විසින් ඉදි කරන ලද රතන-මා පිරිවෙන සඳහා ප්‍රාසාදයක් තනවා එකී වූ පිරිවෙන විශාල කළ බව ද සඳහන් වේ.[35] එවගේම මෙතුමාගේ ද්‍රවිඩ සේනාපතියෙකු වූ පොත්තසාති විසින් ජේතවනාරාමට සම්බන්ධ කොට සෙනෙවිරද් පිරිවෙන නමින් පිරිවෙනක් ද කිරීම අගය කළ යුතු ය. [36] මෙම පිරිවෙන ඇතැම් විට අග්ගබෝධි රජුගේ ඉල්ලීම පිට ද්‍රවිඩ සේනාපතියා විසින් ඉදි කළා විය යුතු ය. එසේ නොවේ නම් තමා රජතුමා බුදු දහම කෙරෙහි දක්වන ආකල්පය පිළිබඳව පැහැදුණු පොත්තසාත

32 මඃ වඃ, 1908, 44 පරිච්ඡේදය 13 ගාථාව.

33 වං.ප., 1935, පි.176
34 මඃ වඃ, 1908, 46 පරිච්ඡේදය 16,22 ගාථා.
35 මඃ වඃ, 1908, 46 පරිච්ඡේදය 16,22 ගාථා.
36 එම

විසින් තමා ද බුදු දහම කෙරෙහි පැහැදී මෙලෙස පිරිවෙනක් ඉදි කිරීමට පටන් ගත්තා යැයි අනුමාන කිරීමට අවකාශ ඇත.

ක්‍රි.ව. 718-724 අතර ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාලන තන්ත්‍රය මෙහෙය වූ Vවැනි අග්ගබෝධි රජතුමා ද මෙම විහාරයේ භික්ෂූන් වහන්සේලාගේ නඩත්තු කටයුතු සඳහා. මහාසේන නමින් වූ ගමක් පූජා කොට තිබේ. ගොණ්ඩිගාමක නම් වූ වැව මොහු විසින් පිළිසකර කර එය ද ජේතවන විහාරයට පූජා කරනු ලැබී ය.[37]

VIIවන අග්ගබෝධි රජතුමා (ක්‍රි.ව. 772-777) විසින්, ජේතවන විහාරයට සම්බන්ධිතව පැවති මහා පිරිවෙනෙහි ප්‍රාසාද කර වූ බව මහා වංශයේ සඳහන්ව ඇත.[38]

IIවැනි දප්පුල (ක්‍රි.ව. 815-831) රජතුමා ද බෝධිඝරයට රන්මුවා බුද්ධ ප්‍රතිමාවක් කරවන ලදී.[39]

Iවන සේන රජතුමා ද (ක්‍රි.ව. 833-853) ජේතවන විහාරයේ සංවර්ධනය හා චිරස්ථිතිය උදෙසා, මහල් කිපයක් සහිතව, මණිමේඛලා නම් විශාල ප්‍රාසාදයක් තනවා, එහි රන් බුදු පිළිමයක් වඩා හිඳ වූහ. එම ප්‍රාසාදයට අවශ්‍ය ආදායම් සලස්වා භික්ෂූන්ට වස් විසීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කොට ඇත. විදේශිය ආක්‍රමණ වලට නතුවීම නිසා ගිණිබත් වූ ප්‍රාසාදය නැවත ඉදි කිරීම ද මෙතුමා විසින් සිද්ධ කොට ඇත.[40]

IIවන සේන රජතුමා (ක්‍රි.ව. 853-887), I වන සේන රජතුමා විසින් ඉදි කරන ලද මණිමේඛලා ප්‍රසාද නොහොත් මණිප්‍රාසාදයේ බුද්ධ ප්‍රතිමා ගෘහයට පිළිසකර කරනු ලැබූ

37 ම.ව., 1908, 16,22ගාථා
38 එම, 56 ගාථා
39 එම, 77ගාථා
40 E.Z. Vol. 1 Edi. Don Marting De zilva wickreasinghe, 1912 P. 227





අතරම එහි බෝධිසත්ව ප්‍රතිමා තබවා බෝධිසත්ව සංකල්පය විහාරය හා ගලපා තිබේ.[41]

IVවන කාශ්‍යප රාජ්‍ය සමයේ (ක්‍රි.ව. 898-914) "සේන ඉලංග" නැමති සෙනෙවියා විසින් ඉදි කරන ලද "කස්සප පිරිවෙන" ද මෙම ජේතවන විහාරයට එකතු කිරීම, එහි චිරස්ථිතියට මහගු සේවයක් ඉටු වූවා යැයි පැවසීම සාධාරණ ය. [42] මෙතුමා විසින් සීගිරියේ 'දල්හ' නම් විහාරය ද 'කොණ්ඩඤ්ඤ' නම් විහාරය ද දෙනානක හෙවත් ජේතවනිකයන්ට පූජා කර ඇත.[43]

ක්‍රි. ව. 924 -935 අතර රජ කරනු ලැබූ, IVවන දප්පුල රජතුමා විසින් ඉදි කළ ශිලා ලේඛනයක සඳහන් වන අන්දමට, "දෙනා වෙහෙර සිරිසඟබෝරාට්" පිරිවෙනට අනුයුක්ත "වට්ටරක පිටියි වේලම්ගම" නම් වූ ගමෙහි ආදායම එම ආයතනයට ප්‍රදානය කිරීම ජේතවන විහාර සංකීර්ණයේ අභිවෘද්ධියට මහත් සේ උපකාරී වූවාට සැක නැත.[44]

Vවන කාශ්‍යප රජතුමා විසින්, (ක්‍රි.ව. 914 -923) මහා මණ්ඩල කර වූ බවත්, ඒවා විසිතුරු රූකම්වලින් සිතියම් කරනු ලැබූ බවත් ජේතවන විහාරයේ දාන ශාලාව සඳහා ගම්වර සිදුබවත් මහාවංශයේ සඳහන් වෙයි.[45] නමුත් එම ගම් පිළිබඳව කිසිදු සඳහනක් මෙතෙක් සොයා ගැනීමට අපහසු වී ඇත.

ජේතවන විහාරයේ අභිසංවර්ධනය හා චිරස්ථිතිය උදෙසා කටයුතු කරනු ලැබූ රජවරුන් අතුරින් මීළඟට වැදගත් වනුයේ ෂඪ වන උදය රජතුමා ය. (ක්‍රි.ව. 946-954) මෙතුමා රජ බවට පත් වන විට සොළීන් විසින් අනුරාධපුර නගරයේ තිබුණු

41 ම: ව:, 1908, 51 පරිච්ඡේදය 77, 78 ගාථා.
42 E.Z. Vol. 11 Edi. Don Marting De zilva wickreasinghe, 1928, p.40
43 ම: ව:, 1908, 39 පරිච්ඡේදය 40,41,42 ගාථා.
44 ම: ව:, 1908, 42 පරිච්ඡේදය 26,31 ගාථා.
45 එම, 52 පරිච්ඡේදය 35,59 ගාථා.

බෞද්ධ පූජණිය වස්තු විනාශ කරන ලදි. සොළීන් විසින් එසේ කරන ලද පූජනිය වස්තු අතරින් ජේතවන විහාරයට අනුබද්ධ ''මණිප්‍රාසාදය'' අර්ධ වශයෙන් නැවත ඉදි කොට ඇත.[46]

එමෙන්ම, ක්‍රි.ව. 946-954 අතර රජ බවට පැමිණි IVවන මහින්ද රජතුමා ද ජේතවන විහාරයේ අභිසංවර්ධනය උදෙසා කටයුතු කරනු ලැබූ නරපතියෙකි. මොහු විසින් IV වන උදය රජු විසින් අර්ධ වශයෙන් ප්‍රතිසංස්කරණය කරන ලද ''මණිප්‍රාසාදය'' ගොඩනැගිල්ලේ සියලු ප්‍රතිසංස්කරණයන් නිම කරන ලදි.

IVවන උදය රජුගේ නිලධාරීන් සතර දෙනෙක් විසින් පිරිවෙන් සතරක් කරවූ බවත්,[47] එය ප්‍රථමයෙන් ම තමාගේ සීයා විසින් ලදුව පසුව තමා විසින් පිළිසකර කළ බවට, ශිලාලේඛනයක් උපදෙස් දෙයි.[48] ''දියසෙත්'' උපෝසථාගාරය ඔහු විසින් ඉදි කරන ලදි. මණ්ඩලාකාර රන්මුවා ඡත්‍රයකින් දාගැබ අලංකාර කළ අතර බුද්ධ ප්‍රතිමාවවල ශීර්ෂ ද මොහු විසින් විසිතුරු කොට ඇත. ජේතවන දාගැබ සතර කෙළවර රන්හිස සහිත කුළුණු සතරක් ද කරවූ බව සඳහන් වේ.[49]

නිකාය භේදයක් නොතකා කටයුතු කළ රජෙකු වශයෙන් හැඳින්විය හැකි, Iවන මොග්ගල්ලාන රජතුමා ද තමා විසින් සීගිරියේ තැනූ විහාර දෙකින් එකක් වන ''දාඨා **කොණ්ඩඤ්ඤ**'' නමින් හැඳින්වෙන විහාරය ජේතවන නිකායට පූජා කළ බව මහාවංශයේ අන්තර්ගත ය.[50]

ස්තූපය පිහිටා ඇති සලපතල මළුවේ ගල්ලැලිවල ඒවා පූජා කළ සැදැහැවතුන්ගේ නම් සටහන්ව ඇති බවත් එම

46 එම, 53 පරිච්ඡේදය 51 ගාථාව.
47 E.Z. Vol. 11 Edi. Don Marting De zilva wickreasinghe, 1912,P. 227
48 E.Z. Vol. 11 Edi. Don Marting De zilva wickreasinghe, 1912,P. 227
49 J.P.F.A.E.R.R. Unesco. Colombo, 1982. p.
50 මඃ වඃ, 1908, 39 පරිච්ඡේදය 41 ගාථාව.





ලිපිවලට අනුව, ඒවා 08 වෙනි ශත වර්ෂයට පමණ අයත් ඒවා බවත් නූතන පර්යේෂණ තුළින් අනාවරණය කොට ගෙන ඇත.[51]

ක්‍රි.ව. 600 පමණ ශ්‍රී ලංකාවට පැමිණ විදේශ වෙළඳුන් දෙදෙනෙකු විසින් ස්තූපයට රන්කාසි සියයක් (100) පරිත්‍යාග කළ බව සඳහන් වන සෙල් ලිපියක් ජේතවනාරාම කෞතුකාගාරයේ තැන්පත් කොට ඇත. මේ තුළින් ද පැහැදිලි වනුයේ දේශීය රජවරුන් පමණක් නොව විදේශිකයන්ගේ ද ගෞරවයට ජේතවනාරාමය පාත්‍ර වී ඇති බව යි.

සාහිත්‍ය මූලාශ්‍රවල සඳහන් වන අන්දමට ජේතවන විහාරයේ චිරස්ථිතිය උදෙසා, අවසාන වශයෙන් සේවය කළේ Iවන පරාක්‍රමබාහු රජතුමා ය. (ක්‍රි.ව. 1153-1186) මෙතුමා රජවීමට ප්‍රථම ශ්‍රී ලංකාවේ පාලන බලය ලබාගෙන සිටියේ චෝලයින් විසිනි. Iවන පරාක්‍රමබාහු රජතුමා විසින් චෝළයින්ගෙන් රට මුදවාගෙන අනුරපුර රාජ්‍ය සම්ප්‍රදායට අනුව බුදු දහමේ චිරස්ථිතිය උදෙසා කටයුතු කරනු ලැබී ය.[52]

මෙම රජතුමාගෙන් පසුව රාජධානිය පොළොන්නරුවට මාරුවීමක් පොළොන්නරු රාජධානිය තුළ ද ජේතවන විහාරයක් ඉදිවීමත් නිසා Iවන පරාක්‍රමබාහු රජතුමාගෙන් පසුව ජේතවන විහාරය පිළිබඳව කිසිදු සඳහනක් නො තිබීමෙන් ඉන් පසුව රජදරුවන්ගෙන් සහයෝගය නො ලැබුණු බව සඳහන් කිරීමට පුළුවන.

51 වත්තල, ශරත්., ඈවිඃ, 1991, පි.22
52 එම

## 2.2ජේතවන නිකාය

ලක්දිව බිහි වූ ප්‍රබල නිකායන් අතුරින් තුන්වන නිකාය වශයෙන් හැඳින්වෙන්නේ ජේතවන නිකාය යි. මෙහි සම්භවය වෛතුල්‍යවාදී ඉගැන්වීම් සමඟ කිසිඳු සම්බන්ධයක් පැවැත්වීමට අකමැති වූ සාගලික භික්ෂුව ප්‍රධාන භික්ෂූන් වහන්සේලා තුන්සියයක් දෙනා මූලික කොට ගෙන සිදු විය.[53]

අභයගිරි විහාරයේ විසූ සාගල භික්ෂුව, දක්ෂිණගිරි වෙහෙරට ගිය අතර එවක පටන් "සාගලික නිකාය" වශයෙන් ප්‍රසිද්ධ වූහ. සාගල නුවර උපන් බැවින් ද ධර්මය තේරුම් කරදීමේ අර්ථයෙන් ද මෙම නම ලැබුණු බව සඳහන් වේ.[54] ගෝඨාභය රජු දවස දකුණු වෙහෙරෙහි විසූ සාගලික නිකායිකයෝ මහසෙන් රජු දවස ජේතවනාරාමය ඉදි කිරීමෙන් පසු ජේතවනාරාමයේ පදිංචි වූ අතර එවක පටන් ඔවුන් "ජේතවන නිකාය" වශයෙන් ව්‍යාප්ත වූහ.[55]

ජේතවන නිකායේ ආදි කතෘවරුන් වෛතුල්‍යවාදයට විරුද්ධ වූ බැවින් ද අභයගිරි නිකායෙන් කැඩී වෙන් වූ බැවින් ද මෙම නව නිකාය ආරම්භක අවධියේ දී වෙනම ම ආගම ආඛ්‍යාත කරන්නට ඇත. නමුත් ඒ පිළිබඳව අපට තොරතුරු හමු නොවේ. කෙසේ නමුත් සිලාකාල රාජ්‍ය සමයේ දී අභයගිරි හා ජේතවන විහාරිකයන් අතර පැහැදිලි වෙනසක් දක්නට ලැබේ.

සිලාකාල (ක්‍රි.ව. 522 -535) රජ බට පත් වී වසර දොළහක් ඉක්මගිය පසු "කාසි" නම් නුවරට ගිය "පූර්ණ" නම් තරුණයා "ධම්ම ධාතුව" රැගෙන ඒමෙන් පසුව අභයගිරි විහාරිකයන් ජේතවන විහාරිකයන් කැමති කරවා ගෙන එහි භාරකාරීත්වය

[53] ගුණවර්ධන, රණවීර., සිː සහ නාː, 1993. පි.35
[54] අමරවංශ හිමි, කොත්මලේ., ලංසː, 1969, පි.162
[55] සාසනරතන හිමි, මොරටුවේ., ලංමංඅː, 1952, පි.74





ජේතවනිකයන්ට භාර දෙන ලදි.[56] එසේ භාර ගැනීමෙන් පසුව ධම්ම ධාතුවට වැඳුම් කිරීමේ වාර්ෂික පිංකම් උත්සවයක් ජේතවනාරාමයෙහිම සිදු වූ බව චූලවංශයේ දක්වේ යැයි ශාසනවංශ ප්‍රදීපයෙහි සඳහන් වේ. [57] මෙතැන් පටන් ජේතවනිකයන් ද වෛතුල්‍යවාදය පිළිගත් බව සඳහන් කළ හැකිය. මෙසේ ඔවුන් වෛතුල්‍යවාදය පිළිගැනීමට හේතු වූයේ සාගලිකයන් (ජේතවනිකයන්) වෛතුල්‍යවාදයට විරුද්ධව ස්වාධීනව නැගී සිට ස්වාධීනව ආගම ආඛ්‍යාන කිරීමට උත්සාහ කෙරුවත්, ඔවුන්ට දිගටම පවත්වාගෙන යාමට නො හැකි වූ බැවින් ද නව නිකායක් බිහි කරගනු ලැබුවත් "අභයගිරි" නිකාය තරම් ප්‍රබල නොවූ හෙයින් ද මෙසේ අභයගිරි විහාරයට ම සම්බන්ධවීමට සිදු වුවා යැයි සඳහන් වේ.[58]

ජේතවන නිකාය නව නිකායක් වශයෙන් බිහි වූවත් එහි අදහස් උදහස් අතින් අභයගිරි නිකායට වෙනස් නො වන බව සඳහන් වේ. [59] ධර්මරුචි හා සාගලික ද්විනිකායිකයෝ ම වෛතුල්‍යවාදීන් වශයෙන් 'ලක්දිව සෙල්ලිපි' ග්‍රන්ථයේ දක්වා තිබේ. [60] ජේතවන නිකාය මහායාන ධර්ම මධ්‍යස්ථානයක් වශයෙන් පැවති බව,'දස රජ පුවත" ග්‍රන්ථයේ ද සඳහන් වේ.[61]

මහායාන ධර්මයේ සඳහන්, ජේතවන නිකායිකයන් පිළිගත් වෛතුල්‍යවාදය පිළිබඳ ව අධ්‍යයනය කිරීමේ දී මෙම වාදය මහාවිහාරයෙන් වෙන්ව ගිය බාලමහස්සුතිස්ස ස්ථවිරයන් වහන්සේ විසින් ථෙරවාදයට වෙනස් වූ ආචාර්යවාදයක් බිහි

[56] නිːසː, 1952, පි.74
[57] විමලකිත්ති හිමි, මැදඋයන්ගොඩ., ශාːවː ප්‍රː, 1955, පි.127
[58] සාසනරතන හිමි, මොරටුවේ., ලංː මංː අං, 1952, පි.74
[59] පියසේන, ගජධීරආරච්චිගේ., බෞːසː කළාප -5.
[60] අමරවංශ හිමි, කොත්මලේ., ලංසː, 1969, පි.162
[61] ලැනරෝල්, ද නාලනී., ශ්‍රීː ලංː ලොː, 1993, පි.59

කර ගත් බව සඳහන් වන අතර[62] මෙම ආචාර්ය වාදය සකස් කරන ලද්දේ විනය පිටකයට අයත් බන්ධක පරිවාරකයන් ඉවත් කිරීමෙනැයි ද ශාසන වංශ ප්‍රදීපයෙහි වැඩිදුරටත් දක්වා තිබේ.[63]

වෛතුල්‍යවාදීහු වෛතුල්‍ය පිටකයක් කළ බවත් ලංකාවතාර සූත්‍රයේ සඳහන් වේ.[64] දක්ෂිණාපථයෙහි වෛතුල්‍ය නම් රටක හෝ නුවරක උපන් නාග නම් භික්ෂුව විසින් වෛතුල්‍ය නිකාය නිපදවන ලදැයි සැලකීමට අවකාශ තිබේ. මෙම වෛතුල්‍යවාදය ප්‍රථමයෙන් ම අභයගගිරි නිකායිකයන් පිළිගෙන පසුකාලය වනවිට ජේතවන නිකායිකයන් අතර ද ව්‍යාප්තව ගියේ යැයි දැක්විය හැකි ය.

හීනයානයට හෝ ස්ථවිරවාදයට එකඟ නො වූ සියලුම බෞද්ධ නිකායයන් ලක්දිව, වෙදල්ල නමින් හඳුන්වනු ලැබේ. වෛතුල්‍යවාදීන් "මහාසුඤ්ඤවාදී" යනුවෙන් හැඳින් වූ බව දැක් වේ. [65] මෙම ශබ්දයේ නියම අර්ථය පැහැදිලි නැති වුවත් ස්ථවිරවාදීන් දක්වනු ලබන නවාංග ශාස්තෘ ශාසනයෙහි අවසාන අංගය වේදල්ල නමින් ප්‍රකට ය.

එවගේම අසංගාචාර්යයන්ගේ අභිධාන සමුච්චයේ වෛතුල්‍ය වෛදල්‍ය-වෛපුල්‍ය යන වචනක්‍රමය සමානාර්ථයෙහි දක්වා ඇත. "වෛතුල්‍ය" යන්නම වඩා පැරණි නාමය වන බව චීන සාක්ෂිවලින් අනාවරණය වේ. කෙසේ වුව ද ඔවුන් මහායානිකයන් බවත් ඔවුන්ගේ ආගමික භාෂාව සංස්කෘත බවත් මොරටුවේ සාසනරතන හිමියෝ සඳහන් කරති.[66]

---

[62] විමලකිත්ති හිමි, මැදඋයන්ගොඩ., ශාංවං ප්‍රං,1955, පි.127
[63] එම
[64] විමලකිත්ති හිමි, මැදඋයන්ගොඩ., ශාංවං ප්‍රං,1955, පි.127
[65] අමරවංශ හිමි, කොත්මලේ., ලං සෙං, 1969, පි.163
[66] සාසනරතන හිමි, මොරටුවේ., ලං මං අං, 1952, පි.75





ක්‍රි. ව. IVවන ශතවර්ෂයට අයත් ජේතවනාරාම සෙල් ලිපියේ සඳහන් වන අන්දමට වෛතුල්‍යවාදය පොත්වල ලියූ බව සඳහන් වේ.[67] එසේ ම සිවුර හා නගුල[68] ග්‍රන්ථයේ සඳහන් වන අන්දමට පළමුවැනි පරාක්‍රමබාහු රජ සමය වනවිටත් ජේතවන නිකායික භික්ෂූන් වෛතුල්‍යවාදී ඉගැන්වීම් දැඩි උද්‍යෝගයකින් ඉදිරිපත් කළ බව සඳහන් කළ හැකි ය.

මෙම ජේතවන නිකාය සෞත්‍රාන්තික නිකායට සම්බන්ධව තිබුණැයි ඩී.ජේ. කලුපහන මහතා අදහසක් පළ කොට තිබේ.[69] මෙ පිළිබඳව අධ්‍යයනය කර බලන විට, සෞත්‍රාන්තික නිකායේ මූලික ඉගැන්වීම වනුයේ බෞද්ධ සූත්‍ර මුල් කර ගැනීම යි. එසේම බුදුරජාණන් වහන්සේගේ අභිධර්මය මෙම නිකායිකයින් පිළි නො ගනී. සමහරවිට ඩී.ජේ. කළුපහන මහතා, මෙසේ තම අදහස් පළ කරනු ලබන්නට ඇත්තේ වෛතුල්‍යවාදයට සම්බන්ධ සූත්‍ර ගණනාවක් තිබෙන නිසා විය හැකි ය. නමුත් ජේතවන නිකායික භික්ෂූන් සෞත්‍රාන්තික නිකාය සමඟ එකමුතු ව කටයුතු කළා යැයි සිතීම අපහසු ය. මන්ද එසේ නම ඔවුන් ස්වාධීන නිකායක් වශයෙන් ඉදිරියට යනු ඇත. හෙළ සාහිත්‍ය ග්‍රන්ථවල සඳහන් වන අන්දමට ජේතවන නිකායිකයින් පසු කාලය වන විට අභයගිරියට සම්බන්ධව කටයුතු කළහ.[70] එසේ ජේතවන නිකායිකයින් සෞත්‍රාන්තික නිකාය පිළිගත්තේ නම් අභයගිරියට විරුද්ධව වෙන්ව ගොසින් නැවතත් අභයගිරියට ම සම්බන්ධවීමට කිසිදු හේතුවක් නොමැත.

---

[67] E.Z. Vol. 1V, 1934, P.11
[68] ගුණවර්ධන, රණවීර., සීං සහ නං, 1993, පි.40
[69] Kalupahna, D.J. T.C.J.H., 1970, p .159
[70] ගුණවර්ධන, රණවීර., සීං සහ නං, 1993. පි.159-160

CS CamScanner

## 2.3ජේතවන නිකායට සම්බන්ධ වෙනත් නිකායිකයෝ:

### 2.3.1පාංශුකූලික නිකාය.

ජේතවන විහාරයට සම්බන්ධ ජේතවන නිකායික භික්ෂූන් වහන්සේලා පමණක් නොව වෙනත් නිකායන්වලට අයත් භික්ෂූන් වහන්සේලා ද මෙම විහාරයට සම්බන්ධව වැඩ සිටි බව පෙනේ. එබදු වෙනත් නිකායික භික්ෂූන් වහන්සේලා අතර පාංශුකූලික භික්ෂූන් වහන්සේලා ද සිටි බව ශාසන වංශ ප්‍රදීපයෙහි[71] සඳහන් වේ.

බැමිණිතියා මහාසෑය අවසන් වූ පසුව, පාංශුකූලික හා ධර්ම කථිකය යන භික්ෂූන් වහන්සේලා අතර ඇති වූ වාදයේ දී ප්‍රතිපත්තිකාමීව භාවනානුයෝගව වැඩ සිටි බව සැලකෙන මෙම භික්ෂූන් වහන්සේලාට එවකට අනුරාධපුරයේ තිබුණු ආගමික තත්ත්වය අනුව ස්වාධීනව සිටීම අපහසු වන්නට පුළුවනි. පාංශුකූලික භික්ෂූන් ද මෙලෙස නිකායවලට සම්බන්ධ වන්නට ඇත. රෙදි කඩමාලුවලින් සැදූ සිවුරු දරමින් ධූතාංග ක්‍රමය පිළිගෙන සිටි මෙම භික්ෂූන් වහන්සේලා පළමුව අභයගිරි විහාරයට සම්බන්ධව විසූ බවත් ක්‍රි.ව. 872 දී පමණ අභයගරියෙන් වෙන්ව වෙනත් නිකායක් වශයෙන් ජීවත් වූ බවත් සඳහන් වේ.[72]

අභයගිරි විහාරයට හා මහා විහාරයට සම්බන්ධව මෙම පාංශුකූලික භික්ෂූන් වහන්සේලා ජීවත් වුවත් ජේතවන නිකායට අනුබද්ධ නොවූ බව 'සිවුර සහ නගුල' ග්‍රන්ථයේ සඳහන් වේ.[73] වෙන වෙන ම නිකාය පහළ වූවාට පසුව එම

71 විමලකිත්ති හිමි, මැදඋයන්ගොඩ., ශාෘවෘ ප්‍රඃ, 1955, පි.127
72 ගුණවර්ධන, රණවීර., සීඃ සහ නාඃ, 1993. පි.42
73 ගුණවර්ධන, රණවීර., සීඃ සහ නාඃ, 1993. පි.42





එකිනෙක නිකායවලට අයත් පාංශුකූලිකයන් ජීවත් වූ බව වල්පොල රාහුල හිමි පවසයි.[75]

චූලවංශයේ සඳහන් වනුයේ ද මෙම භික්ෂු කණ්ඩායම කිසියම් වූ නිකායකට සම්බන්ධව විසිය යුතු බව යි. එම පුවතට අනුව, පාංශුකූලිකයෝ මහාවිහාරයට අභයගිරියට පමණක් නොව ජේතවන විහාරයට සම්බන්ධව ජීවත් වන්නට ඇතැයි අනුමාන වශයෙන් සඳහන් කළ හැකි ය.

### 2.3.2අරඤ්ඤක භික්ෂූන් වහන්සේලා

වනයේ හුදකලාව හැසිරෙමින් භාවනානුයෝගී ජීවිතයක් ගත කරමින් ධූතාංග අනුගමනය කරමින් ජීවත් වූ භික්ෂූන්" අරඤ්ඤක " වහන්සේලා වශයෙන් හැඳින් වේ. මෙම භික්ෂු කණ්ඩායම ද ජේතවන නිකායට සම්බන්ධව වැඩ සිටි බව වල්පොල රාහුල හිමියන් "ලක්දිව බුදුසමයෙහි ඉතිහාසය"[74] නැමැති ග්‍රන්ථයේ සඳහන් කරනු ලබයි. මෙම සඳහන නිවැරදි සඳහනක් බව මහාචාර්ය මැන්දිස් රෝහණධීර මහතා " සංඝ සංවිධාන" යන ග්‍රන්ථයේ සඳහන් කොට ඇත.[75]

"ථෙරිය අරඤ්ඤවාසී" භික්ෂූන් වහන්සේලාට පස්වන කාශ්‍යප රජ දවස (ක්‍රි.ව. 914-923) ' **සක්ක සේනාපති**' මාතාව විසින් ආවාසයක් තනවා දුන් බව 'සිවුර හා නගුල' ග්‍රන්ථයේ දක්වා තිබේ.[76] මහා විහාරයට 'ථේරිය' යන නාම ද අවශේෂයෙන් යෙදෙන නමකි. මෙලෙස සඳහන් වීමෙන් හැඟී යනුයේ වෙනත් නිකායවලට සම්බන්ධ අරඤ්ඤක භික්ෂූන් වහන්සේලා ද වැඩ සිටි බවයි. එසේ නම් මෙම භික්ෂූන් වහන්සේලා ජේතවන විහාරයට ද සම්බන්ධ වන්නට ඇතැයි සිතීමට පුළුවන.

74 රාහුල හිමි, වල්පොල., ලෘ බුඃ ඉඃ, 1989, පි.42
75 රෝහණධීර, මැන්දිස්., සඃ සඃ, 1974, පි.207
76 ගුණවර්ධන, රණවීර., සීඃ සහ නාඃ, 1993, පි.42

අනුරපුර අවධියේ ආගමික පසුබිම දෙස බලන විට එහි බෙහෙවින් ම නිකාය පදනම් වූ පසුබිමක් තිබෙන හෙයින් කිසිම භික්ෂූන් වහන්සේ නමකට ස්වාධීනව විසීම අපහසු ය. ඒ සෑම භික්ෂූන් වහන්සේ නමක් ම කිසියම් වූ නිකායකට සම්බන්ධව විසිය යුතුය යන්න අනුමාන කළ හැකි ය.

## 2.4ජේතවන විහාරයට සම්බන්ධ මූලඃ

අනුරපුර යුගයේ ආගමික වශයෙන් භික්ෂූන් වහන්සේලාගේ ක්‍රමික සංවිධානයේ සැලැස්මක් වශයෙන් "මූල" හෙවත් ආයතන හැඳින්විය හැකි ය. තම නිකායික භික්ෂූන් වහන්සේලා අධ්‍යාපනික කටයුතු සේ ම නිකායේ අභිසංවර්ධනය උදෙසා මෙම මූලයන්ගෙන් සිදුවන්නට ඇත්තේ අනුපමය වූ සේවයකි. ජේතවන විහාරයට සම්බන්ධ මූලයන්ගෙන් සිදු වූ සේවය පිළිබඳ අපක්ෂපාතී වාර්තාවක් ඉදිරිපත් නො වූවත් සෙසු මූලයන්ගෙන් සිදු වූ සේවය සමග සසඳන විට අනුරපුර අවධියේ පාලකයන් පවා මෙම මූලයන් මගින් මෙහෙය වූ බව සඳහන් වේ.[77]

අනුරපුර යුගයේ සංඝයා වහන්සේලාගේ ක්‍රමානුකූලත්වය පිළිබිඹු කරන මූලවලින් මූල දෙකක් මෙම ජේතවන විහාරයට අයත්ව තිබී ඇත.[78] එනම්,

1. රතන + මා පිරිවෙන
2. සෙනෙවිරද් පිරිවෙන

යනුවෙනි.



### 2.4.1රතන මා පිරිවෙන

ජේතවනාරාමය ඉදි කිරීමෙන් පසුව එම රහතන් වහන්සේලා උදෙසා "රතන - මා " පිරිවෙන මහසෙනු රජු විසින් පිහිටුවන ලදැයි පැවසේ.[79] එය නිර්මාණය කරන ලද වර්ෂයක් අපට හමු නො වේ. නූතනයේ ද එය පිහිටියේ කුමන ස්ථානයේ ද යන්න තවම නිශ්චිත වශයෙන් සොයා ගෙන නොමැත.

VI වන අග්ගබෝධි රජතුමා විසින් මෙම පිරිවෙන උදෙසා ප්‍රාසාදයක් තනවා විශාල කළ බව සඳහන් වේ.[80]

රතන - මා පිරිවෙන උදෙසා ජල මණ්ඩපයක් තැනවූ බව VI වන මිහිඳු රජතුමාගේ සෙල් ලිපියක සඳහන්ව ඇත.[81] මේ තුළින් එළැඹිය හැක්කේ මුල් කාලයේ සිට පැවති මෙම පිරිවෙන, ප්‍රතිසංස්කරණය කොට, මෙම සෙල් ලිපිය පිහිට වූ බවයි. සෙල් ලිපිය හමු වී ඇත්තේ බෞද්ධ ගල්ගරාදී වැට නමින් ප්‍රකට නෂ්ඨාවශේෂ අසළ වටවන්දනා පාර සකස් කිරීමේ දී ය.

### 2.4.2සෙනෙවිරද් පිරිවෙනඃ

ජේතවන විහාරයට සම්බන්ධව තිබුණා යැයි සැළකෙන අනෙක් පිරිවෙන වනුයේ සෙනෙවිරද් පිරිවෙන ය. මෙය IV වන අගග්බෝධි රජුගේ දෙමළ සේනාධිපතියෙකු වූ 'පොත්තසාත' විසින් කර වූ බව සඳහන් වේ.[82] මෙම පිරිවෙන හඳුන්වා ඇත්තේ " දෙනා වෙහෙර සිරිසඟ බො දෙ පිරිවෙන " යනුවෙනි.[83] මෙම පිරිවෙන සඳහා IVවන දප්පුල රජුගේ අත්තානි ලිපියකින්, "වෙලංගම" නම් ගමක් ප්‍රදානය කළ බව

---

79 ගුණවර්ධන, රණවීර., සිං සහ නා., 1993, පි.42

දක් වේ. වුත්ත මාලාවෙහි සඳහන්ව ඇත්තේ සේනාපති මූලය හා සෙනෙවිරද් මූලය යනු එකම මූලය වන්නට ඇති බව ය. මෙම මූලයේ වැඩ සිටි නාහිමිපාණන් වහන්සේ සැදැහැවත්, සිල්වත් හා කාරුණික භික්ෂූන් වහන්සේ කෙනෙකු ලෙස අගය කර ඇති බව ද පැවසේ.[84] අවසන් වරට මෙම මූලය පිළිබඳ සඳහන් වනුයේ පල්කුඹුර සන්නයෙහි ය.[85] ඒ අනුව 7. වැනි බුවනෙකබාහු රජතුමා වශයෙන් හඳුන්වනු ලැබ ඇති රජකු විසින් එවකට එම මූලයේ අධිපතිත්වය දැරූ භික්ෂූන් වහන්සේ නමක් උදෙසා ගමක් ප්‍රදානය කිරීම එම සන්නසෙහි ඇතුළත්ව ඇත.

නූතන පුරාවිද්‍යා කැණීම් මඟින් මෙම මූලය ජේතවනාරාම දාගැබට බටහිරින් ඇති පිළිම ගෙයටත්, රතන -මා යැයි සැලකෙන ස්ථානයටත් අතර පිහිටා ඇති බව සැලසුම්වල දක්වා ඇත.[86]

කරුණු විමර්ශනය කරනු ලබන විට පැහැදිලි වනුයේ මෙම මූලයන් මහා සංඝයා වහන්සේ කෙනෙකුගේ නායකත්වය යටතේ සංවිධානය වූ බව යි. මෙම මූලයන් කොතරම් පූජනීයත්වයට හා ගෞරවයට පාත්‍ර ව තිබුනේ ද යත්, චූලවංශයේ සඳහනට අනුව මෙම මූලයන් සඳහා Iවැනි පරාක්‍රමබාහු රජතුමා විසින් ප්‍රාසාද ඉදිකළ බව සඳහන් කිරීමට පුළුවන. [87] පූජාවලියෙහි මෙම පුවත විස්තර වනුයේ මෙම ප්‍රාසාද ගොඩනංවන ලද්දේ පොළොන්නරුවේ සෑගිරිය බව ය. මෙතුමා රජ වනවිට සොළී බලය නිසා මෙම මූලයන්ගේ

[84] වත්තල, ශරත්., ඇ:වි:, 1987, පි.23
[85] E.Z.Vol.111. Edi. by. Din Marting De Zilva Wickramasinghe, 1982, P. 228 - 229
[86] DO
[87] E.Z.Vol.111. Edi. by. Din Marting De Zilva Wickramasinghe., 1982. P. 228 - 229





පාලනයෙන් ගිලිහී ගිය ඉඩම් නැවතත් භාර දෙන ලදී.[88] නිකාය සංග්‍රහයේ[89] සඳහන් අන්දමට මෙම මූලයන්ගේ නායකත්වයට භික්ෂූන් වහන්සේලා පත් කරන ලද්දේ රජතුමාගේ ආඥාව යටතේ ය.

**2.4.3ජේතවන විහාරයෙන් සිදු වූ සේවය:**

ජේතවන විහාරයෙන් සිදු වූ සේවය මහා විහාරය හා අභයගිරිය තරම් උසස් තත්ත්වයක යැයි සාහිත්‍ය මූලාශ්‍රවලට අනුව පැවසිය නො හැකි ය. නමුත් අනුරපුර යුගයේ පැවති ප්‍රධාන නිකායන් අතුරින් එකක් වශයෙන් ගැනෙන ජේතවන විහාරයට සම්බන්ධ මූල දෙකක් තිබීමත්, රජවරුන් මේ සඳහා විශාල අනුග්‍රහයක් දක්වා තිබීමත් නිසා එයින් සේවයක් සිදු නො වුණා යැයි සඳහන් කිරීමට නො පුළුවන.

වංශකතාකරුවන් එසේ ජේතවන විහාරයෙන් සේවයක් සිදු නො වූ බවට නිශ්ශබ්ද සිටියත්, මහා වංශ ටීකාවෙන් මෙයින් සිදු වූ සේවයක් පිළිබඳව සඳහන් වේ.[90] මෙම සඳහනට අනුව ජේතවන විහාරීය භික්ෂූන් වහන්සේලා විනය පිටකයේ උභය විභංගයට අර්ථ පාඨාන්තර සැපයූ බව දක්වනු ලබයි.

ජේතවන විහාරයෙන් සිදු වූ තවත් සේවයක් වනුයේ මහා විහාරීය මතිමතාන්තර විවේචනයට භාජනය කරමින් කුරුන්දවුල්ලක පිරිවනේ දාඨාවේධ භික්ෂුව හා කෝලම් බහාලන පිරිවෙන් වැසි දාඨාවේධ භික්ෂූන් විනය ව්‍යාඛ්‍යාත පාඨ ලියා තැබීම යි. මොවුන්ගේ සංස්කරණයට අයත් වූයේ ධම්මරුචික සංස්කරණයේ විභංග කොටස් දෙක හා සාගලික සංස්කරණයේ ඛන්දක පරිවාර කොටස් දෙක ය. මෙම සංස්කරණය මහා විහාරයට වඩා 'තථ්‍යවාදී' යැයි ඔවූහු කියා

[88] ම: ව:, 1908, 46 පරිච්ඡේදය 16,22 ගාථා.
[89] E.Z.Vol.111, 1982, P. 228 - 229
[90] ගුණවර්ධන, රණවීර., සි:සහන:, 1993, පි.305

සිටියහ.[91] මෙයින් අනෙක් නිකාය දෙකට මෙන් ජේතවන නිකායට ද අනන්‍ය වූ විනය පිටක සංස්කරණයක් තිබිණැයි ද සමහරවිට ස්වකීය අටුවා සම්ප්‍රදායක් තිබිණැයි විශ්වාස කිරීමට පුළුවන.

ජේතවන විහාරයෙන් සිදු වූ සේවය මෙසේ සීමාසහිතව සඳහන් වූවත් මෙයට අනුබද්ධ පිරිවෙන්වලින් මීට වඩා විශිෂ්ඨ සේවයක් සිදු වන්නට ඇතැයි අපට අනුමාන වශයෙන් සඳහන් කිරීමට පුළුවන.

## 2.5ජේතවන විහාරයට සම්බන්ධ භික්ෂුණී ආරාම

දෙවන පෑතිස් රජ දවස ලංකාවට වැඩම කරවන ලද බුදු දහම කෙරෙහි පැහැදුනු අනුලා ඇතුළු කාන්තාවෝ බුදු දහම වැළඳගෙන, නිර්මල බුදු දහමට අනුපමේය සේවයක් සිදු කරමින් විසී ය. පසු කාලය වනවිට ලංකාවේ බුදු දහම නිකාය වශයෙන් බෙදී යන්නට පටන් ගනු ලැබූ හෙයින් ලංකික භික්ෂුණීන් වහන්සේලා ද එසේ නිකායන්වලට බෙදී ගියහ. ජේතවන නිකාය බිහිවීමෙන් පසුව භික්ෂුණීන් ජේතවන විහාරයට ද සම්බන්ධව විසු බව මහා වංශයේ සඳහන් වේ.

මහසෙන් රජු විසින් ජේතවන විහාරය ආරම්භ කිරීමෙන් පසුව එකී විහාරයට සම්බන්ධව විසු භික්ෂුණීන් වහන්සේලා සඳහා ''උතුරු අබහෙබ'' භික්ෂුණී ආරාම දෙකක් කරවා පූජා කළේ ය.[92] එසේ නම් මහසෙන් රජු දවස වන විට ද භික්ෂුණීන් ජේතවන විහාරයට සම්බන්ධ වී සිටි බව මෙයින් පැහැදිලි ය.

ක්‍රි. ව. 315-498 අතර රජ කළ ධාතුසේන රජතුමාගේ පුත්‍රයා වූ Iවන මුගලන් රජතුමා "රාජිනී'' නම් මෙහෙණවරක් ඉදි කොට එය ජේතවන විහාරවාසී භික්ෂුණීන් උදෙසා පිදූ බව

[91] E.Z.Vol.111. Edi. by. Din Marting De Zilva Wickramasinghe., 1982, P. 240 - 247

[92] චූ. ව. II වන කාණ්ඩය, 1927, 33 ගාථාව





මහාවංශයේ සඳහන් වේ.[93] VIවන මිහිඳු රජුගේ ජේතවනාරාම සෙල්ලිපියේ සඳහන් වන අන්දමට ''අසරණ මෙහෙණගණට'' මෙහෙණවරක් කරවූ බව ප්‍රකට ය.[94] මෙම මෙහෙණවර ද ජේතවනරාම නිකායට අයත් භික්ෂූන් වහන්සේලා සඳහා විය යුතු ය.

මෙසේ භික්ෂූන් වහන්සේලා මෙන් ම, භික්ෂූන් වහන්සේලා ද නිකාය වශයෙන් බෙදී යාමට මූලික ම හේතුව වන්නට ඇත්තේ, සංඝමිත්‍ර භික්ෂුවගේ අවවාද අනුශාසනා අනුව මහා විහාරය විනාශ කිරීම නිසා මහා විහාරයට සම්බන්ධ භික්ෂුණී ආරාම ද විනාශ වන්නට ඇත. එබැවින් මෙසේ ආරාම විනාශ කිරීමේ දී බොහෝ භික්ෂුණීහු ජීවිතාරක්ෂාව වෙනුවෙන් වෙනත් සෙවණක් සඳහා ද මෙසේ අභයගිරිය හා ජේතවන භික්ෂුණී ආරාම කරාපැමිණෙන්නට ඇතැයි සඳහන් කළ හැකි ය.

භික්ෂුණීන් සඳහා වන අෂ්ට ගරු ධර්මවලට අනුව සෑම භික්ෂුණීන් වහන්සේ නමක්ම, භික්ෂූන් වහන්සේගේ අවවාද අනුශාසනා මධ්‍යයේ ජීවත් විය යුතු ය. ඒ අනුව කිසිම භික්ෂුණියකට ස්වාධීනව ජීවත් වීමට අයිතියක් නොමැත. ලාංකික භික්ෂූන් වහන්සේලා නිකාය වශයෙන් බෙදී යාමේ දී භික්ෂූන් වහන්සේලා ද නිකාය වශයෙන් බෙදෙන්නට ඇතැයි සිතිය හැකි ය.

[93] චූ. ව. II වන කාණ්ඩය, 1927, 33 ගාථාව

[94] නිඃසඃ, 1952

# තුන්වන පරිච්ඡේදය

## ජේතවන විහාරයේ පිරිහීම

ජේතවන විහාරය, ජේතවන නිකාය නමින්, ලක් බුදු සසුනට තුන්වන නිකාය වශයෙන් එක් වෙමින් නව වැනි සියවස වන විට ශ්‍රී ලංකාවේ පැවිදි සංවිධානයේ ඉතා වැදගත් නිකායක් බවට පරිවර්තනය විය.[95] VIIIවැනි සියවසේ පමණ ජීවත් වූ විනීත දේව නම් වූ ඉන්දීය පඬිවරයා ද මේ බව දැන සිටි බව සඳහන් වේ. ඔහු විසින් රචනා කරන ලද කෘතියෙහි, එකොළොස් වැනි සියවසේ දී ටිබෙට් භාෂාවට පරිවර්තනය කරන ලද වර්ෂාග්‍රපෘච්ඡා සූත්‍රයේ ද මෙරට පැවති ජේතවන නිකාය ඇතුළු අනෙක් ප්‍රධාන නිකායන් දෙක ද දක්වා ඇත.[96] ෆාහියන් භික්ෂුව ලක්දිව වැඩි අවස්ථාවේ දී මෙරට බුදු සසුනේ තත්ත්වය වාර්තා කරමින් ජේතවන විහාරයේ භික්ෂූන් වහන්සේලා 2000ක් පමණ විසූ බව සඳහන් කොට තිබේ.[97]

ලක්දිව මෙම නිකාය භේදය කොතෙක් දුරට වර්ධනය වූයේ ද යත්, 5 වැනි සියවස පමණ වන විට අභිලේඛනවල හා සාහිත්‍ය මූලාශ්‍රයන්හි දිවයිනේ විවිධ පළාත්වල පිහිටි ඇතැම් විහාරස්ථාන හඳුන්වා ඇත්තේ ද මෙම නිකායන් එකකට අයත් සංස්ථාවක් වශයෙනි. නවවැනි හා දසවැනි සියවස්වලදී මෙම ජේතවන නිකායට ද අයත් අධිකාරි බලය හා එහි සංවිධානාත්මක ශක්තිය උසස් මට්ටමකට පවතින්නට ඇතැයි සිතීමට අවකාශ තිබේ.

---

95 ව.ප. කාණ්ඩ 1., 1935, පි.176

96 මැවං, 1908, 19වන පරිච්ඡේදය. 4 ගාථාව

97 එම, 37වන පරිච්ඡේදය. 4 ගාථාව

ජේතවන නිකාය හෙවත්, දෙනානකය පළමු පරිච්ඡේදයේ සඳහන් වන පරිදි ක්‍රි.ව. 3 වන සියවසේ දී ආරම්භ වී නොයෙක් නරපතියන් අතින් සංවර්ධනයට පත්ව ක්‍රි.ව. 12වන සියවස පමණ දක්වා පවතින්ට ඇත. මේ අතරතුර මධ්‍යස්ථ මතධාරීන්ට සෙවණ දුන් ආයතනයක් වශයෙන් හැඳින්විය හැකි ජේතවනාරාමය ක්‍රි.ව. 12 වන සියවස සියවසේ පසු පිරිහීමට පත්වීමට හේතු රාශියක් බලපාන්නට ඇත.

ජේතවන විහාරයේ පරිහානිය ක්‍රි.ව. 12 වන සියවසෙන් ආරම්භ වූවත්, පිරිහීම ආරම්භ වූයේ, ජේතවනාරාමය ආරම්භ වූ දිනයේ සිට ම ය. මහා විහාරීය සීමාව තුළ ජේතවනාරාමය ඉදි කිරීමට ආරම්භ කළ අවස්ථාවේ දී මහා විහාරීය භික්ෂූන් වහන්සේලා එයට විරෝධය පෑමට ගත් ක්‍රියා කලාපයත් ජේතවනාරාමය ගොඩනගා මහසෙන් රජතුමා විසින් තිස්ස හිමියන්ට පෞද්ගලික පූජාවක් වශයෙන් පූජා කරනු ලැබූ උන්වහන්සේ අන්තිමවත්ථුවෙන් චෝදනා කොට උපැවිදි කිරීමත් පෙන්වා දීමට පුළුවන. මෙසේ කරනු ලැබුවේ, ජේතවන විහාරය විනාශ කිරීම අදිටනින් විය යුතු ය. එතැනින් නො නැවතුණු මහා විහාරීය භික්ෂූන් වහන්සේලා තම විහාරයට පක්ෂපාතී රජෙක් බිහි වූ පසු උත්සාහ ගනු ලැබුවේ ද මෙකී වූ විහාරය විනාශ කිරීමට ය. කෙසේ වෙතත් සඳහන් කළ හැකි වනුයේ මෙම විහාරය පිරිහීම මෙහි ආරම්භය සිට ම සිදු වූ බව යි.

ජේතවනාරාමයේ පිරිහීමට බලපෑ සාධකයක් වන්නේ සිලාකාල රජු දවස ගෙන්වන ලද "ධර්ම ධාතුව"යි. මෙම විහාරය බිහි වූයේ අභයගිරික භික්ෂුවක් වූ සාගල භික්ෂුවගේ මූලිකත්වයෙන් එම විහාරයේ විසූ තවත් භික්ෂුවන් වහන්සේලා





ද රැගෙන යාමෙනි. මේ අනුව නව නිකායික භික්ෂූන් ප්‍රථමයෙන් ම මහා විහාරයට හා අභයගිරියට වෙනස්ව යමින් සිය ආගම ආඛ්‍යාන කරන්නට ඇත. මෙයින් පැහැදිලි වනුයේ මහා විහාරය අතර පමණක් නොව අභයගිරිය හා ජේතවනාරාමය අතර ද මුල් අවස්ථාවේ දී එතරම් සුහදත්වයක් නො වූ බව ය.

නමුත්, සිලාකාල රාජ්‍ය සමයෙන් 12වන අවුරුද්දේ පමණ කාසි නම් නුවරින් ගෙනෙන ලද "ධම්ම ධාතුව" ජේතවනාරාමයට භාර කිරීමට උත්සාහ ගනු ලැබූ නමුත් ආරම්භයේ දී එම භික්ෂූන් වහන්සේලා වෛතුල්‍යවාදී ඉගැන්වීම්වලට එතරම් රුචියක් නො දැක්වූවත් පසුව අභයගිරි විහාරිකයන් විසින් ජේතවන භික්ෂූන් වහන්සේ කැමති කරවා ගෙන "'ධම්ම ධාතුව" ජේතවනිකයන්ට භාර දෙන ලදී.[98]

අභයගිරිකයන් මෙසේ "ධම්ම ධාතුව" ජේතවන භික්ෂූන්ට භාර කිරීමෙන් පසු උත්සාහ ගන්නට ඇත්තේ ජේතවන භික්ෂූන් ස්වාධීනව නැගී සිටීමේ ශක්තිය හීන කිරීමට පිරිසක් ද වූ බැවින් ඔවුන් ස්වාධීනව නැගී සිටියොත් බලවත් පහරක් වදිනුයේ අභයගරිකයන්ට ය. ඒ අනුව ඔවුන් අභයගිරිය විහාරයේ ආගමික සංකල්පය වූ මහායාන ධර්මය ඇදා ගනිමින් අභයගිරි විහාරයේ ම ශාඛාවක් ලෙසින් පවත්වාගෙන යාම අභයගිරියේ කීර්තිනාමයට වාසිදායක ය. තත්ත්වය මෙසේ වූයේ නම් ජේතවන විහාරයේ පිරිහීම සිලාකාල රජු දවස ද සිදු වූ බව සඳහන් කිරීමට පුළුවන.

1 වන අග්ගබෝධි රජු (571-604) දවස ද ජේතවනාරාමය පිරිහීමට පත් වූ බව දැක්විය හැකි ය.[99] ඉන්දීය භික්ෂුවක් වූ

---

[98] මං.වං., 1909, 39 වන පරිච්ඡේදය. 41,43 ගාථාව

[99] E.Z.Vol.111, 1912, P.75

CamScanner

ජෝතිපාල තෙරණුවෝ වෛතුල්‍යවාදී ගත් ජේතවන විහාරීය භික්ෂූන් වහන්සේලා සමඟ වාදයක් පවත්වන ලදී. එම වාදයේ දී බොහෝ විට ජයගනු ලැබුවේ ජෝතිපාල භික්ෂුව ය. බොහෝ විට මෙම භික්ෂුව මෙහෙය වන්නට ඇත්තේ මහා විහාරීය භික්ෂූන් වහන්සේලා වන්නට පුළුවන. නමුත් ජේතවන විහාරීය භික්ෂූන් වහන්සේලා පරාජය ලැබුවත් රජ සභාවේ ''වියත්තා'' තනතුර දරූ නිලධාරියෙකු මාර්ගයෙන් රජතුමාගේ ප්‍රසාදය දිනාගෙන සිටියහ. රජුගේ සහයෝගය ලබාගත හැකි වූයේ එම නිලධාරියා ජීවතුන් අතර සිටිනතාක් පමණි. ඔහුගේ මරණින් පසු ජේතවන විහාරීය භික්ෂූන් වහන්සේලා නිහතමානිව මහා විහාර භික්ෂූන් වහන්සේලාට අවනත වූ බව නිකාය සංග්‍රහයේ සඳහන් ව ඇත.[100]

ජේතවන නිකායික භික්ෂූන් වහන්සේලා මහා විහාරයට අවනත වන්නට ඇත්තේ තම නිකායට ඉන්පසුව ස්වාධීනව ඉදිරියට යාමට ශක්තියක් නො මැති නිසා විය යුතු ය. ඇතැම් විට ජෝතිපාල භික්ෂූවගේ වාදයෙන් පසුව තමන් ගමන් කරනු ලැබන්නේ වැරදි මාර්ගයක බව වැටහී ගියා විය යුතුය. එසේ නො වූයේ නම් ශ්‍රී ලංකාවාසී ජනතාවට ගැලපෙන ධර්ම මාර්ගය මහා විහාරයෙන් බෙදා හැරෙන නිසා රජවරුන්ගේ නො මද සහයෝගය වැඩියෙන් ලැබීම නිසා විය හැකි ය. ජේතවන විහාරයේ භික්ෂූන් වහන්සේලා නව නිකායක් වූ බැවින් එතරම් වියත් ප්‍රබුද්ධ භික්ෂූන් වහන්සේලා නො සිටීම නිසා ද වන්නට පුළුවන. කෙසේ නමුත් මේ තුළින් ද සිදු වූයේ නැවත වරක් ජේතවන විහාරයේ පිරිහීම ඇති වීම යි.

100 වජිර සිල්මානාන, පානදුරේ., හි.ව., 1990, පි.368





11වැනි දාඨොපතිස්ස රජු දවස සහයෝගයෙන් සිදු කරන ලද විනය පිටකයේ සංස්කරණය ද[101] මෙම විහාරයේ පිරිහීමට බලපෑ තවත් සාධකයක් වශයෙන් ගෙනහැර දක්විය හැකි ය. ජේතවන විහාරය අයත් කුරුන්දවුල්ල පිරිවෙණෙහි විසූ ''දාඨවෙද'' භික්ෂුව හා කොලම්බහාලක පිරිවෙණහි, ''දාඨාවෙද'' භික්ෂු එකමුතුව මෙම කාර්ය සිදු කරන ලදී.

මෙම හවුල් ප්‍රයත්නයේ අරමුණ වන්නට ඇත්තේ කණ්ඩායම් දෙකටම පිළිගත හැකි, විනය පිටකයක් සංස්කරණය කිරීම වන්නට පුළුවනි. මෙම අවධිය වනවිට ධර්මය පිළිබඳ ප්‍රශ්නවල දී ජේතවන නිකාය අනුගමනය කළ ස්ථාවරයන් නො පැහැදිලි හා වෙනස් වන සුළු ය.[102] ජේතවන නිකාය නැවතත් අභයගිරි විහාරයට ළං වීමක් මේ තුළින් සිදු වූවා යැයි අනුමානයෙන් දක්විය හැකි ය.

ආගමික මතවාදයක් පමණක් නොව රටේ අස්ථාවර වූ දේශපාලනය ද විශේෂයෙන්ම විදේශීය ආක්‍රමණ ද ජේතවන විහාරයේ පිරිහීමට බෙහෙවින් බලපා තිබේ. රාජ්‍ය අත්පත් කරගැනීම සඳහා ඔවුනොවුන් මරා ගැනීමෙන් හා සටන් කිරීමෙන් ද යුධ කෝලාහලවලින් හා රාජ්‍ය විපර්යාස ආදියෙන් පිරුණු මෙසමයන්හි ආගමික දියුණුවක් කෙසේවත් අපේක්ෂා කළ නො හැකි ය. මන්ද රටක ස්ථාවර වූ දේශපාලනය රටේ ආර්ථිකය කෙරෙහි බලපාන අතර එම ආර්ථික තත්ත්වය රටේ ආගමික පුනර්ජීවනයට හේතු වන බැවිනි.

අනුරාධපුරය රාජධානිය කොට ගෙන, රට පාලනය කළ රජවරුන්ට අභ්‍යන්තර මෙන්ම බාහිර ආක්‍රමණ ද වළක්වනු නොහැකි විය. ඒ ඒ රාජ්‍ය සමයන්හි විදේශියන් විසින් රට

101 ගුණවර්ධන, රණවීර., සිඃ සහ නාඃ, 1993, පි.1

102 Bareau, Ardre. L.S.B.D.P.V. Madurasi, 1995, P 24

ආක්‍රමණය කරන ලැබූ අතර මෙහි දී ජේතවන විහාරයේ පාරිහානියට බෙහෙවින් බලපෑවේ සොළී ආක්‍රමණයන් ය.

11 වන උදය රජුගේ හා 111 වන සේන රජුගේ ඇවෑමෙන් ලක්දිව සිංහාසනය උරුම වූයේ, 111 වන උදය රජු වෙත ය. ඔහු මත්පැනෙහි ලොල් වූ අලසයෙකු ලෙසින් රට පාලනය කළ බැවින් මේ අවස්ථාවේ දී පරන්තක රජ Vවන දප්පුල රජුගේ සමයෙහි මෙහි ගෙන එන ලද පඬි රජුගේ රාජ කකුධ භාණ්ඩ ඉල්ලා එව් ය.[103] මෙය දීමට අපොහොසත් වූයෙන් පරන්තකයින් දියත් ආක්‍රමණය කොට ලක්දිව පාලනය ඔවුන් විසින් ගෙන ගියේ ය.

පරන්තකයින්ගෙන් රට බේරාගෙන ලක්දිව සිහසුනට පත් වූයේ VI වන මිහිඳු රජතුමා ය. ඔහු චිරාගත චාරිත්‍රය කඩ කොට කාලිංග දේශයෙන් විවාහයක් කරගනු ලැබී ය. එයින් වර්ෂයක් ඉක්ම යාමටත් පෙර "වල්ලභ" නම් සොළී රජෙක් මෙරට ආක්‍රමණය කළේ ය.[104] මෙයින් පසු ඔවුන් බොහෝ කාලයක් රාජ්‍ය පාලනය භාරගෙන සිටියේ ය.

මෙම අවස්ථාවේ දී ද බුද්ධාගමට එතරම් වාසිදායක කාල පරිච්ඡේදයක් උදා වූවා යැයි සිතීම උගහට ය. මන්ද මොවුන්ගේ ධර්මය හින්දු ධර්මය වූයෙන් මොවුන් බොහෝ කොට උත්සාහ ගෙන ඇත්තේ අනුරාධපුර යුගයේ තිබුණු බෞද්ධ ගොඩනැගිලි පමණක් නොව බුදු දහම ද විනාශ කොට ඒ වෙනුවට හින්දු දහම මෙරටට ආදේශ කිරීමට ය. මේ බව දැනට අනුරාධපුර රාජධානියේ අවසාන කාලයට අයත් යැයි නිගමනය කළ හැකි හින්දු දේවස්ථානවල නටබුන් නිහඬව කියා පායි. මෙබඳු වකවානුවක ජේතවන විහාරය ද

103 අස්සජි හිමි, ගන්තුනේ., ගා : පා:, 1986, පි.52

104 නි: සං:, 1690, පි.19





අනිවාර්යයෙන් ම පිරිහීමට පත්වූවාට කිසිදු සැකයක් නො මැත.

"වල්ලභ" සොළීන්ගෙන් රට බේරාගෙන ලක් රජය මීළඟට පාලනය කරනු ලැබුවේ Vවන මිහිඳු රජු ය.[105] මෙතුමාගේ පාලන සමයෙහි නිසි පරිදි රජයට ලැබිය යුතු අය බදු නො ලැබී ගියේ ය. මේ හේතුව නිසා මේ වනවිට මෙරට සිටි බලබාර් ජාතික වේලක්කාර හමුදාවට වැටුප් ගෙවීමට තරම් රාජ්‍ය භාණ්ඩාගාරයේ මුදල් නො මැති වූයෙන් ඔවුන් විසින් රජුට විරුද්ධව කැරළි ගසන ලදි. මේ අවස්ථාවේ දී රජු රුහුණුට පලාගිය අතර සොලීන් විසින් ඉන්පසු පාලන බලය සියතට ගත්හ.

බොහෝ කාලයක් රට පාලනය කළ මොවුන්ගෙන් ජේතවන විහාරයට තබා බුදු දහමේ දියුණුවට කිසිදු සේවයක් නො විය. මොවුන් ද සිදු කරනු ලැබුවේ බෞද්ධ විහාරස්ථාන විනාශ කොට ඒ වෙනුවට හින්දු දේවස්ථාන ඉදි කිරීම ය.

මෙබඳු අවස්ථාවක භික්ෂූන් වහන්සේලාට මහත් අඳුරු කාලයක ජීවත් වන්නට සිදු වූ අතර, සොළීන් අතින් විනාශ වූ වෙහෙර විහාර අතර ජේතවනාරාම විහාරය ද අයත් බව සඳහන් වේ.[106]

මේ හේතුව නිසා ම ජේතවනාරාමය භික්ෂූන් වහන්සේලාගෙන් හිස් වූ මධ්‍යස්ථානයක් වූවාට කිසිදු සැකයක් නොමැත. මෙබඳු අවස්ථාවක ජේතවනාරාම භික්ෂූන් වහන්සේලා ඇතැම් විට උපැවිදි වන්නට ඇත. නොමැතිනම් තම ජීවිත ආරක්ෂාව පතා වෙනත් ප්‍රදේශවල ජීවත් වන්නට ඇතැයි අනුමාන කළ හැකි ය.

105 නි: සං:, 1690, පි.19

106 එම

සොළීන්ගෙන් ශ්‍රී ලංකාව මුදවා ගෙන රට එක්සේසත් කොට ලක්දිව පාලනය කරනු ලැබුවේ Iවන පරාක්‍රමබාහු රජතුමා ය. (ක්‍රි.ව. 1153-1186) නමුත්, ඒ වනවිට වල් බිහි වී ගිය බුද්ධශාසනය නඟා සිටුවීම එතුමා මත පැවරුණු විශාලතම වගකීම ය. ඒ අනුව අනුරාධපුර ශුද්ධ නගරයේ පිහිටා ඇති සොළීන් විසින් විනාශ කරන ලද බෞද්ධ විහාර ස්ථාන ප්‍රතිසංස්කරණය කරනු ලැබූ අතර ජේතවනාරාම විහාරයෙහි දාගැබ තවත් අඩි 210 ක් උස් කොට තැන වූ බව සඳහන් වේ.[107]

බුද්ධ වර්ෂ 1708 දී (ක්‍රි.ව. 1165 - 1166) පරාක්‍රමබාහු රජතුමා විසින්, එවකට පැවති මහාවිහාරය අභයගිරිය හා ජේතවන නිකාය යන නිකායයන් තුනම එක් නිකායක් බවට පත් කිරීමට ශාසන සංශෝධනයක් සිදු කරනු ලදී.[108] මෙම ශාසන සංශෝධනයෙන් ජේතවන විහාරය පරිහානියට පත් වූ අතරම මේ තුළින් එතෙක් ලක්දිව පැවති වෛතුල්‍යවාදය සම්පූර්ණයෙන් ම තුරන් වූ බව සඳහන් වේ.[109] පරාක්‍රමබාහු රජතුමාගේ මෙම කාර්යයෙන් වෛතුල්‍යවාදය සම්පූර්ණයෙන්ම තුරන් වූවා නම් අනිවාර්යෙන් ම ජේතවන විහාරය ද පරිහානිය කරා ගමන් කළ යුතුම ය.

ජේතවන විහාරයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් බල නො පෑවත් අනියම් ලෙස හෝ ශ්‍රී ලංකාවේ අගනගරය පොළොන්නරුවට මාරුවීම ද බලපෑ බව සඳහන් කළ හැකි ය. සොළීන් විසින් අනුරාධපුරය ආක්‍රමණය කළ පසු අග නගරය වශයෙන් පොළොන්නරුව තෝරා ගෙන එය 'ජනනාථපුර'

107 එං.ප., 1935, පි.176
108 ගුණවර්ධන, රණවීර., සිː සහ නාː, 1993, පි.1
109 කොඩ්රිංටන්, එච්.ඩබ්ලිව්., සැːලංːඉː, 1957, පි.38





යනුවෙන් නම් කරමින් තම පාලනය ගෙන ගියේ ය. ඉන්පසුව රජ බවට පැමිණි Iවන පරාක්‍රමබාහු රජතුමා ද එය එලෙසින්ම පවත්වාගෙන ගියා පමණක් නොව එම අගනුවර තුළ ද බෞද්ධ සිද්ධස්ථාන ගොඩනංවමින් බෞද්ධ සංස්කෘතියේ ආභාසය නැවතත් පොළොන්නරුව කේන්ද්‍රස්ථාන කරගෙන රටවැසියන්ට ලබාදෙන්නට උත්සුක වූහ.

රාජධානිය නගරය පොළොන්නරුව බවට පරිවර්තනය වීම ජේතවන විහාරයේ පිරිහීමට බල පෑ බව සඳහන් කරනු ලබන්නේ පොළොන්නරුවෙහි ද "ජේතවනාරාම" නමින් විහාරයක් ඉදි කිරීම යි.[110] මෙය රජමාළිගාව අසළ ම ගොඩනැංවූ බව ද සඳහන් වේ. මේ තුළින් අනුරාධපුරයේ ඉදි වූ ජේතවනාරාම විහාරයේ වටිනාකම අඩුවීමට පටන් ගත්තා විය හැකි අතර රාජධානිය මාරුවීම නිසා එය අභාවයට පත් වූවා යැයි සිතීමට පුළුවන.

ජේතවනාරාම විහාරයේ පිරිහීම එක් කාලයකින් පටන් ගත්තක් නො වන බවත් එය වරින්වර පිරිහීමට පත් වූ බවත් Iවන පරාක්‍රමබාහු රජතුමාගේ ශාසන සංශෝධනයෙන් එහි වැදගත්කම අඩු වූ බවත් සඳහන් කළ හැකි ය.

110 කොඩ්රිංටන්, එච්.ඩබ්ලිව්., සැːලංːඉː, 1957, පි.38

# සිව්වන පරිච්ඡේදය

## 4.1අභයගිරිය හා ජේතවන නම් මාරුවීම

පරසතුරු උවදුරු හමුවේ ලක්දිව අග නගරය පොළොන්නරුව බවට පත්වීමෙන් පසුව අනුරාධපුර පූජ්‍ය භූමි ප්‍රදේශය වනගත ප්‍රදේශ බවට පත්වූහ. එකී වූ හේතුව නිසා ම පසු කාලීන වන විට වැදගත් වූ සිද්ධස්ථාන කීපයක් හඳුනා ගැනීමට නො හැකි වූ අතර එයින් ප්‍රමුඛස්ථානයක් ගනු ලැබුවේ ජේතවනාරාමය අභයගිරිය වශයෙනුත් අභයගිරිය ජේතවනාරාමය වශයෙනුත් වරදවා තේරුම් ගැනීම යි.

මහසෙන් මහරජ ජේතවනාරාම දාගැබ පිහිටුවන ලද්දේ මහාවිහාර සීමාව මඩිමින් උන්වහන්සේලාගේ විරෝධතාව මධ්‍යයේ මහා විහාරයට නැගෙනහිර දෙසිනි.[111] එහෙයින් මහා විහාර භූමිය අසලින් ම ඇත්තේ ජේතවනාරාම විහාරය බව පැහැදිලි ය.

අභයගිරි විහාරය පිහිටා තිබෙන්නේ ද මහා විහාර සීමාවෙන් පිටත වූ බටහිර දෙස ය. එම විහාරය ගොඩනැගුණේ නිගණ්ඨාශ්‍රමයක් බිඳ හෙළා ඒ මත ය.[112]

නමුත්, පසු යුගය වනවිට අනුරපුර නගරය නෂ්ටප්‍රායවීම නිසා ජේතවන විහාරයෙන් සොයාගනු ලැබූ සෙල් ලිපි මෙන් ම නටබුන් ද අභයගිරි වශයෙනුත්, අභයගිරිය ජේතවනය වශයෙනුත්, මාරු කරගෙන තිබුණු අතර පුරාවිද්‍යා

---

111 විජයසිංහ, සෝමරත්න., පැ:ල:, 1963, පි.148

112 එම

දෙපාර්තමේන්තුව විසින් සම්පාදිත ශිලාලේඛන සංග්‍රහයන්හි දී ද එම වරද එලෙස ම දක්වා තිබේ.

මෙම නම් මාරුවීම නිවැරදි කරලීමට මුලින් ම සමත් වූයේ 'අයර්ටන්' මහතා විසිනි.[113] ඔහු විසින් අභයගිරි (එවකට ජේතවන විහාරය) විහාර මළුවේ දකුණු දොරටුවෙහි තිබී මළුතිස (කණිඨතිස්ස) රජුගේ සෙල් ලිපියක් සොයා ගෙන ඇත අතර[114] එම සෙල් ලිපියේ,

"උතර මහ චෙත"

යනුවෙන් සඳහන් ව තිබේ. නිසැකයෙන් ම එය අභයගිරි විහාරය වශයෙන් දක්වන ලදි.

ශ්‍රී ලංකාවේ පුරා විද්‍යාවන් වූ එච්.සී.පී. බෙල්, පාකර් හා හොර්කාට් වැනි විද්වතුන් ද එම අදහසම සනාථ කරනු ලැබූහ. නමුත් බෙල් මහතා ඒ පිළිබඳ ව අවිනිශ්චිතව සිටි බව ඔහු විසින් සකස් කරන ලද පුරා විද්‍යා වාර්තාවල සඳහන් කරනු ලැබ ඇත්තේ අභයගිරිය ජේතවනය වශයෙනුත් ජේතවනය අභයගරිය වශයෙනුත් සළකා ය.[115]

ආචාර්ය සෙනරත් පරණවිතාන මහතා ද මළුතිස රජතුමාගේ එම සෙල් ලිපිය හා අභයගිරි විහාරයේ (ප්‍රථමයෙන් ජේතවන විහාරය) පිය ගැට පෙළේ ලිපි අට ද[116] උපයෝගි කරගෙන 1933 වර්ෂයේ දී ස්ථිර වශයෙන් ම ජේතවන විහාරය-අභයගිරි විහාරය වශයෙනුත්, අභයගිරි විහාරය-ජේතවන විහාරය වශයෙනුත් පැවති නම් මාරුව වෙනස් කරන ලදි.[117]

[113] වත්තල. ශරත්., ඇ: වි:, 1991, පි.22
[114] කොඩරිංටන්, එච්.ඩබ්ලිව්., සැ:ලං:ඉ:, 1957, පි.62
[115] එම
[116] එම
[117] එම





## 4.2ජේතවන දාගැබ

ජේතවන විහාර සංකීර්ණයේ පිහිටි ගොඩනැගිලි නිර්මාණ අතුරෙන් විශේෂ අවධානය යොමුවන, "ජේතවන දාගැබ" අනෙක් ගොඩනැගිලි මධ්‍යයේ පිහිටා ඇත.[118] ශ්‍රී ලංකාවේ පිහිටි විශාලතම දාගැබ් නිර්මානය වශයෙන් හැඳින්විය හැකි මෙහි සම්පූර්ණ උස අඩි 400ක් වේ. මහසෙන් රජු විසින් දායකත්වය සපයන ලද මෙම දාගැබ ආසියාවේ පිහිටි විශාලතම ගඩොල් නිර්මාන අතුරෙන් තෙවන ස්ථානය ද හිමි කරගනී. මෙහි පිළිස්සුණු ගඩොල් 93,300,000 ක් අඩංගවනු අතර හේක්ටයාර් 5.6 ක් පුරා වසා ඇත.[119]

වර්තමානයේ දාගැබ නටබුන් වූ ස්වරූපයෙන් දිස් වන නමුත් එහි සංරක්ෂණ කටයුතු සිදු කරමින් පවතී. නූතන සංරක්ෂණ කටයුතු සිදු කිරීමට ප්‍රථම කිප වතාවක්ම මේ පිළිබඳ ව පුරා විද්‍යාඥයින්ගේ ඇස ගැසුණු බවත් එවන් අවධීන්හි දී විනාශ මුඛයට පාත්‍ර වූ ජේතවන දාගැබ සංරක්ෂණය කිරීමට ඔවුන් ද පෙළඹුණු බව සඳහන් කිරීමට පුළුවන.

ජේතවන දාගැබ පිළිබඳව අවධානය යොමු කළ පුද්ගලයෙකු වශයෙන් 1874 දී උතුරු මැද පළාතේ දිසාපති වශයෙන් කටයුතු කළ ජේ.ඒ.ජ්. ඩික්සන් මහතා සඳහන් කළ හැකි ය. එතුමා පසින් වැසී ගිය වාහල්කඩ තුනක පාදම් නිර්මාන හා අලංකරණය මතු වන ලෙස පිරිසිදු කළ බව සඳහන් වේ.[120]

[118] නි: සා:, 1955, පි.31
[119] වනරතන නාහිමි, කඹුරුපිටියේ., 1970, පි. 111
[120] එම

ඊට ප්‍රථම එනම් 1828-1832 අතර, මේජර් පෝර්බස් මහතා අනුරාධපුයට ගිය බවත් එම ගමනේ දී ජේතවන ස්ථූපය වනයෙන් වැසී තිබුණු බවත් ජෝන් ඩේවිඩ්ගේ ''ශ්‍රී ලංකාව'' පිළිබඳ ග්‍රන්ථයේ සඳහන් වේ.[121] භික්ෂූන් වහන්සේ නමක් විසින් එළි පෙහෙළි කරගනිමින් වාසය කළ බවත් 1829 දී ජනවාරි මස ඇති වූ අධික වර්ෂාව නිසා එහි කොත් කැරැල්ලේ කොටසක් කඩා වැටුණු බව ද එහි වැඩිදුරටත් සඳහන් කොට ඇත. කෙසේ වෙතත් 1833 දී මේජර් ස්කිනර් මහතා අනුරාධ ශුද්ධ නගරයේ සැලැස්ම පිඹුරුපත් කළ අවස්ථාවේ දී මෙම ජේතවන දාගැබේ එවකට උස වශයෙන් දක්වා ඇත්තේ අඩි 244 කි.[122]

ලොකු කුඩා ගස්වලින් සහ වන ලැහැබින් සියවස් ගණනක් ම වැසිතිබුණු මෙහි මුල් ස්වරූපය නූතනයේ පවා සිතා ගැනීමට අපහසු තරම් ය.[123] නමුත් මීටර් 120 කට ආසන්න විෂ්කම්භයක් ඇති ස්තූපයේ පාදම පිහිටි පොළව දක්වා ම ගමන් කොට ඇති අතර එය මීටර් 09 ක් පමණ පොළොවේ යටට පිහිටා ඇත. ස්තූපයේ පිටතට පෙනෙන විෂ්කම්භයට වඩා පතුළ මීටර් 18 ක් පමණ පළල ය. එය ද ගඩොල් නිර්මාණයෙන් ම සිදු කර ඇති බව නූතන පුරා විද්‍යා කැනීම් තුළින් හමු වී තිබේ.[124] මේ පිළිබඳ ව එච්.සී.පී.බෙල් මහතා සඳහන් කරනු ලබන්නේ මෙකී අත්තිවාරම මතුපිට පොළොවේ සිට අඩි 26 ක් පමණ යටට පිහිටා ඇති බවත් එහි පාදම හුණු ගල් තට්ටුවකින් (ගොරෝසුවට) ආවරණය කොට ඒ මත හුණු වාත්තු කර ඇති බවත් දක්වයි. එසේ ම පාදමේ

[121] වනරතන නාහිමි, කඹුරුපිටියේ., 1970, පි. 111
[122] E.Z. vol. 1, 1912. P.25
[123] A.S.C.A.R. Bell, H.C.P. 1894, 1904
[124] අමරසේකර, ඹන්දුල., සිː ශිː ලේ ː විː 1 වන කාණ්ඩය, 1937, පි.122





ගඩොල් නිර්මානය කිරීම ආරම්භ කොට ඇත්තේ සිමෙන්ති තලයක් මත බවත් ඒ මහතා වැඩිදුරටත් දක්වා තිබේ.[125]

ස්තූපය නිර්මානය කර ඇත්තේ උතුරු-දකුණු සහ නැගෙනහිර- බටහිර අක්ෂ අනුව ය. පිටතින් බැම්මක් සමඟ වාහල්කඩ සතරක් ඇති අතර එය වැලි මළුවට මග පෙන්වනු ලබයි. ඇත් පවුරක් දක්නට ලැබේ. එසේම ස්තූපය නිර්මානය කරන ලද්දේ පොළොව මට්ටමෙ සිට උස් කරන ලද සතරැස් වේදිකාවක් මත ය. එයට ගොඩවීම සඳහා සතර දිසාවන්හි පඩිපේළි සතරක් ද නිර්මානය කොට ඇත.[126]

ජේම්ස් ජී. ස්මිදර් මහතාගේ වාර්තාවට අනුව දාගැබේ අඩි 07ක් පමණ පළල දාගැබ ප්‍රදක්ෂිණා කිරීම සඳහා භාවිත කරන්නට ඇතැයි සැළකෙන පේසා වළලු තුනක් හමු වී තිබේ. එම පේසා වළලුවලින් පහළ ම ප්‍රාසාදය අඩි 06 යි අඟල් 09 ක් උස වන අතර දෙවැනි ප්‍රාසාදය අඩි 04යි අඟල් 09 ක් වේ. තුන්වන ප්‍රාසාදය අඩි 04 ය අඟල් 06 ක් පමණ උස වේ. මෙම ප්‍රාසාද තුන ම ගඩොලින් තනා ඇති බව වර්තමානයේ පවා දිස්වන අතර ඒවා හුණු පිරියම් කර නිසැකව ම මෙම කොටස කැටයම් කළ බොරදම් තිබෙන්නට ඇති බව ඒ මහතා වැඩිදුරටත් දක්වා තිබේ.[127]

ජේතවන දාගැබ පිහිටා ඇති මතුපිට ගඩොල් ඇල්ලූ චතුරශ්‍රය වටා මිටි තාප්පයකින් වටකර තිබුණේ යැයි බෙල් මහතා සඳහන් කරයි.[128] එසේම දාගැබ නිර්මානය කර ඇති සතරැස් වේදිකාව මීටර් 7.5 ක් පළල ය.[129]

[125] හෙට්ටිආරච්චි. එස්.බී. සහ කුලතුංග ටී.ජී.අ., මධ්‍යම සංස්කෘතික අරමුදල, 1992, පි.3
[126] J.P.F.A.E.R.R. Unesco, 1982, P. 16
[127] Ratnayake, hema., " JETAWANAYA" T.C.T.S.L., 1993, P.70
[128] J.P.F.A.E.R.R. , 1982, P. 16
[129] - Do -

CamScanner

ගොඩනැගිල්ලේ ප්‍රධාන කොටස වන අර්ධ ගෝලාකාර හැඩය, ගඩොලින් නිම කර ඇති අතර, වේදිකාවේ මතුපිට සිට, අඩි 09 යි අඟල් 06 ක් පමණ පහළින් පොළොව මට්ටමේ යම් නිශ්චිත ලක්ෂයක සිට මෙම හැඩය ලකුණු වී තිබේ.[130] එම ලක්ෂය ඉහළ ම ප්‍රාසාදයේ මුදුනේ සිට අඩි 25 යි අඟල් 06 ක් පමණ පහළින් පිහිටා ඇත. වක්‍ර හැඩය ඇරඹෙන්නේ එම ප්‍රාසාදය මුදුනෙහි ය.[131] සැලසුමේ සඳහන්ව ඇති පරිදි[132] වර්තමානයේ නෂ්ටප්‍රාය වී ඇති හෙයින් ද ස්වභාවික විපත්වලට ගොදුරුවීම නිසා එහි කොත් කැරල්ල හා හතරැස් කොටුව කඩා වැටීම නිසා එක් වූ පස් මෙම ගර්භය මත තැන්පත් වී ඇති හෙයින් ද එහි මුල් ස්වරූපයට තරමක් බාධා සිදු වී ඇත. මෙම සැලසුමෙහි කඩ ඉරිවලින් දක්වා ඇත්තේ ගර්භයේ මුල් ස්වරූපය යි. දිග් රේඛාවෙන් පෙන්නුම් කරනු ලබන්නේ ස්වභාවික විපත් නිසා හා පරසතුරු උවදුරු නිසා පස් කඳු මෙම ගර්භය තුළ තැන්පත්ව ඇති බව යි. මෙම ගර්භය බුම්බුලාකාර හැඩයක් ගනු ලබන අතර එහි විෂ්කම්භය අඩි 325ක් පමණ වේ.

මෙම ගර්බයට ඉහළින් අඩි 76 ක් පාදය ඇති, අඩි 32ක් අඟල් 06 ක් පමණ උසැති හතරැස් කොටුවක් දක්නට ලැබේ. මෙහි සතර පැත්තේ වක්‍ර ලක්ෂණ පිළිසකර කර ඇති බව දක්නට ලැබෙන නමුත් එය එහි එක් කොටසක පමණක් දක්නට ලැබේ. නූතනයේ සතරැස් කොටුවේ බටහිර දිසාවේ පිහිටි කොටස සම්පූර්ණයෙන් ම කැඩී ගොස් ඇති බව දක්නට ලැබේ. මෙය ස්වාභාවික විනාශයන්ගෙන් වළකාලීම සඳහා 1903 දී පමණ එහි කොන්ක්‍රීට් දමා ඇති බව සඳහන් වන අතර 139

[130] J.P.F.A.E.R.R., 1982, P.17
[131] ඡායා ඵලක අංක 01 බලන්න.
[132] Ratnayake, hema., " JETAWANAYA" T.C.T.S.L., 1993, P.70





සතරැස් කොටුව මත ගඩොලින් කළ රවුම් කොත් කැරැල්ලක් දිස් වේ. එම කොත් කැරැල්ල පාදයේ විෂ්කම්භය අඩි 33 කි. උස අඩි 48 ක් පමණ ය. දැනට එම කොත් කැරැල්ල අංග සම්පූර්ණ ආකාරයෙන් දිසු නො වන අතර කැඩී ගයි ස්ථානයෙහි විෂ්කම්භය අඩි 24 ක් පමණ වේ.[133] මෙම කොත් කැරැල්ල 19 වන ශත වර්ෂයේ දී නැවත සකස් කිරීමක් වශයෙන් සඳහන් කරනු ලබයි.[134] එහි අඩි 2 යි අඟල් 06 ක් පමන දුරින් අඟල් 06 ක් පමණ පළල 'දාර' තනා ඇත.

මෙම කොත් කැරුැල්ලට පහළින් වූ බිසෝ කොටුව ප්‍රථමයෙන් ම අලංකාර වී තිබුණු බව පැවසෙනුයේ බෞද්ධ ගරාදි වැටකිනි.[135] නමුත් දැනට එහි ශේෂව ඇත්තේ එක් එක් මුහුණත අඩි 02 යි අඟල් 1/2 ක් පමණ පළල සම දුරින් පිහිටි බදාම තීරු පමණි. සිරස් අතට ඇති එම බදාම තීරු හරහා තිරස් අතට ද අඟල් 15 ක් පමණ පටි යොදා ඇති බව දක්නට ලැබේ.[136]

ස්මිදර් මහතාගේ වාර්තාවල සඳහන් වන අන්දමට ජේතවන දාගැබේ වර්තමාන උස වශයෙන් සළකනු ලබන්නේ අඩි 232 ක් පමණි. ඒ මහතාගේ වාර්තාවලට අනුව මෙහි ප්‍රධාන අංගයන්හි උස හා පළල පහත දැක් වේ.

[133] A.S.C.A.R. Bell, H.C.P. 1892. 1892, Vol IV, P.03
[134] ඡායා ඵලක අංක 02 බලන්න.
[135] Smither, James., G.A.R.A.S.L., 1993, P.69
[136] - Do -

144 අඩි අඟල් පාදම අඩි 16කට ඉහළින් වූ පාසාද මට්ටමෙන්

| | අඩි | අඟල් |
|---|---|---|
| බුබ්බුලාකාර හැඩයේ විෂ්කම්භය | 325 | 0 |
| පාදමේ පිටත හැඩයේ විෂ්කම්භය | 367 | 0 |
| පාදම මතුපිට ප්‍රථම පාසාදයේ උස | 06 | |
| පාදම මතුපිට දෙවන පාසාදයේ උස | 11 | 6 |
| පාදම මතුපිට ගෝලාකාර හැඩය සහ බිසෝ කොටුව සන්ධි වන තැනට දුර | 150 | 6 |
| පාදමේ සිට බිසෝ කොටුව මුදුනට | 183 | 0 |

ජේතවන දාගැබ බෙල් මහතා විසින් කැනීම් කරනු ලැබූ අවස්ථාවේ දී දාගැබ ඉදිකර ඇති චතුරශ්‍රය වටා අනෙක් දාගැබ්බලට මෙන්, එම චතුරශ්‍රය වටා දිවෙන ස්තෝප්පුවක් නිර්මාණය කර ඇති අයුරු දක්නට ලැබී ඇති බවත් ආදි කාලයේ මෙම භූමියේ උත්සව පවත්වන්නට ඇත්තේ මෙම ස්තෝප්පුවේ බවත් සඳහන් කරනු ලබයි.[137]

ජේතවන දාගැබට පිවිසීමට පොළොව මට්ටමෙන් උස්කර මළුවට පිවිසීමට පෙත්මගක් සාදා තිබූ අතර එය ප්‍රධාන පඩි පේළිවලට විරුද්ධ පසින් පිහිටුවා ඇත. මළුවට ඇතුළ්වන ස්ථානයෙහි පිස්සක් සහිත දොරටුවක් දක්නට ලැබේ.[138] එය

137 A .S.C.A.R. Bell, H.C.P., 1894,Vo. IV, P.04
138 Ratnayake, Hema., " JETAWANAYA" T.C.T.S.L., 1993, P.70-P.69





වර්තමානයේ ද දක්නට හැකි ය. (නටබුන් වූ ස්වරූපයෙන්)[139] පෙත්මග සිට ඇතුල්වීමේ දොරටුවට විරුද්ධ පසින්, මළුව දෙසට නෙරාගිය පියස්ස සහිත දොරටු හතරක් දක්නට ලැබෙන බව, බෙල් මහතා සඳහන් කරයි.

I. මළුව උඩ
II. ඇතුල්වන ස්ථානය
III. මණ්ඩපයෙහි
IV. මළුවට ඉදිරිපස හා පසුපස යනුවෙනි.[140]

මෙම පියසි පොළොව මට්ටමෙන් පහළට යා හැකි පඩි පේළි පිහිටා ඇත. එකිනෙකට සමාන පියසි වශයෙන් සඳහන් කරනු ලබන බෙල් මහතා, එහි දිග හා පළල, අඩි 50×38 බව දක්වයි. එමෙන් ම මෙය සාමාන්‍ය පොදු සැලැස්මක් මත සකස් කර ඇත.

නැගෙනහිර සහ දකුණේ ඇති පියස්ස සහිත දොරටු, බටහිර හා උතුරෙහි ඇති දොරටුවලට වඩා වෙනස්කම් දක්වයි. එහි වෙනස වශයෙන් දක්වා ඇත්තේ කළු ගලේ ම නෙළන ලද මල් බඳුන් ය. එකි දිසාවල මුරගල්වල ද විශේෂත්වයක් දක්නට ලැබේ. එනම්, තරමක් ඉදිරියට නෙරා ගිය මල් බඳුන් දක්නට ලැබීම ය. ඊට තරමක් කුඩා ප්‍රමාණයෙන් යුත් මල් බඳුන් පඩි පෙළට ඇතුල් වන ස්ථානයෙහි සතර දිශාවෙහි ම සමානව ම දක්නට ලැබේ.

139 Smither, James., G.A.R.A.S.L., 1993, P.69
140 -DO-

CamScanner

මෙම පියස්ස සහිත දොරටුවලට වහලක් නොමැත. මෙහි මැද තාප්පයකින් වට වූ මුර ගෙවල් දක්නට ලැබෙන අතර එකිනෙකට වෙනස් වූ කුළුණු මත මෙම දොරටු සතර මැද පිහිටා ඇත.[141] නමුත් මේ කිසිවක් වර්තමාන නටබුන් තුළින් විද්‍යාමාන නොවේ.

චෛත්‍යයක ප්‍රධාන අංග අතර මීළඟට ප්‍රධාන අංගය වනුයේ වාහල්කඩ ය. ජේතවන විහාරයට ද. අනුරාධපුර යුගයේ ඇතැම් චෛත්‍යවල නිර්මාන කර තිබෙන වාහල්කඩ නිර්මානය කර තිබූ බව, බෙල් මහතාගේ සහ ස්මිදර් මහතාගේ වාර්තාවල සඳහන් වන නමුත් එවන් අංගයක් වර්තමානයේ විද්‍යමාන නොවේ. විශේෂයෙන් ම ස්වභාවික විපත් වලින් හා බෞද්ධ විරෝධී පිරිස් විසින් සිදු කරන ලද විනාශයක් හමුවේ බහුතර කොටසක් විනාශ වී ගොස් තිබෙන අතර, නටබුන්ව ඇති සුළු කොටස් වර්තමානයේ සිදු කෙරෙන කැණීම් හා සංරක්ෂණ කටයුතුවලට පහසු වන අන්දමට එම ස්ථානවලින් ඉවත් කොට ඇත.

ස්මිදර් මහතාගේ වාර්තාවේ සඳහන් වන අන්දමට, කාලනිර්ණයක් කළ නො හැකි කාල පරිච්ඡේදයක දී බටහිර හා උතුරු හා දකුණු දිශාවල පිහිටි කැටයම් සහිත සෙල්මුවා වාහල්කඩ තුනක් මතු වී ඇත.[142] එම වාර්තාවේ ම සඳහන් වන අන්දමට නැගෙනහිර දෙස යම් කැණීමක් සිදු වී නැතත් ඉහත දැක්වූ පරිදි තවත් එවන් වූ නිර්මානයක් ඇතැයි ඒ මහතා විශ්වාස කරයි.

141 වික්‍රමගමගේ, චන්‍ද්‍රා., ස්., 1990, පි.40
142 J.P.F.A.E.R.R., 1982, P.17





බටහිර පිහිටි වාහල්කඩ අඩි 15 ක් පමණ උස වන බව බෙල් මහතා සඳහන් කරයි.[143] අභ්‍යන්තර ස්ථම්භ පුන්කලසින් නිකුත් වන ආකාරයෙන් නිර්මානය කරන ලද මල් වැල්වලින් අලංකෘත කොට ඇත. මෙම වාහල්කඩෙහි ඇති ස්ථම්භ ඉදිරියට ඇදෙන ලියවැලක් දක්නට ලැබේ. එම ලියවැලෙහි සිංහරූප දෙකක් නිමවා තිබෙන නමුත්, එය එකිනෙකට වෙනස් ස්වරූපයක් ගනී. ස්ථම්භයෙහි කොටසක් කැඩී තිබෙන හෙයින් එම කැඩී තිබෙන ස්ථානය දක්වා උස අඩි 05 යි අඟල් 09 කි. ස්මිදර් මහතා සඳහන් කරනු ලබන්නේ මෙම ස්ථම්භය අඩි 20ක් පමණ උස විය හැකි බව ය.[144]

නෂ්ටප්‍රාය වී ඇති සිංහ රූප සහිත ස්ථම්භයෙහි ප්‍රථමයෙන් ම හුණු බදාම යොදා ඇති බවට, තැනින් තැන, දක්නට ලැබෙන හුණු බදාම තුළින් සිතා ගැනීමට පුළුවන. මෙම වාහල්කඩ අලංකාර වර්ණයන්ගෙන් වර්ණ ගන්වා ඇති බව සෙවන ලැබූ තන්හි රතු, කොළ සහ කහ පාට පින්තාරු කළ තැන් ඉදහිට දක්නට ලැබීමෙන් සිතා ගැනීමට හැකි ය.[145]

මෙම බටහිර වාහල්කඩෙහි බාහිර ස්ථම්භයෙහි, සිත් ගන්නා සුළු අලංකාර ලියවැලක් නිර්මානය කොට තිබේ.[146] එම ලියවැල පුන් කලසකින් දිවෙන අයුරින් නිර්මානය කර ඇති අතර, එබඳු ලියවැල කොටස් හතරකින් දක්නට ලැබේ. එම ලියවැල ළඟ ළඟ රවුම් නිරූපණය කර ඇත. එහි එක් එක් ලියවැලෙහි නොපිට හැරවූ මලක් දක්වා ඇති අතර එම මල පාදක කොට ගෙන සත්ව රූපයක් දක්නට හැකි ය.

143 Smither, James., G.A.R.A.S.L., 1993, P.69
144 -DO-
145 -DO-
146 -DO-

එම රවුම්වල නිරූපිත සත්වයින් අතර පහළ ම රවුමේ රඟන ආකාරයේ හස්තියෙකුගේ රූපයක් ද ඊට ඉහළින් වූ රවුමේ හිඳගෙන සිටින සිංහයෙකු ද තෙවන රවුම් තුළ සිටගෙන සිටින වෘෂභයෙකුගේ රූපයක් ද ඉහළ රවුමේ නැවතත් සිංහයෙකු නිර්මානය කොට ඇති අතර එම සිංහයා සිට ගෙන සිටින ආකාරයෙන් දක්වා ඇත. හතරවන රවුමට ඉහළින්. රඟන ආකාරයේ පුරුෂ රූප තුනක් සිත්තම් කර ඇත්තේ ඔවුන්ගේ දෑත්වල පූජා වට්ටි වැනි ද්‍රව්‍යය ද එක් කරමිනි. එම පුරුෂ රූප තුනෙන් මැද සිටින රූපයේ පූජා වට්ටිය දක්වා ඇත්තේ හිස මතින් එය දරා සිටින ආකාරයෙනි. සෙසු දෙදෙනා ඒ දෙපසට සිට එක් අතකින් තම පූජා වට්ටිය දරා සිටින්නේ මැද සිටින පුරුෂයාට එය දරා සිටීමට රුකුල් දෙන ස්වරූපයකිනි.[147] ඔවුන් තිදෙනා අනෙක් අත ඉඟටියට තබාගෙන සිටින අයුරින් සිත්තම් කොට තිබේ. මෙබඳු රූප කුමන අරුතක් දීම සඳහා නිර්මානය කළා ද යන්න නිශ්චය කිරීම අපහසු ය.

වාහල්කඩෙහි උතුරු කෙළවර දක්නට ලැබෙන අනුරූපී ස්ථම්භවල සුළු වශයෙන් ශේෂව ගිය ලියවැල් කොටස් දක්නට ලැබෙන අතර උතුරු වාහල්කඩෙහි ඇත් රුවක් දක්නට ලැබීමෙන් මෙම ස්ථම්භයෙහි ද, කලින් සඳහන් කළ නිර්මාණවලට සමාන බව සිතිය හැකි ය. මන්ද අනුරපුර යුගයේ නිරූපිත අනෙක් වාහල්කඩ දෙස බලනවිට ඒවායෙහි වෙනස්කම් දක්නට ලැබෙන්නේ සතර දිසාවෙහි වාහල්කඩ මුදුන් හි පිහිටි සත්වයින් ගෙනි. ඒවායෙහි ලක්ෂණ වෙනස්

147 Smither, James., G.A.R.A.S.L., 1993, P.69





වන්නේ ද මඳ වශයෙන් බව පරණවිතාන මහතාගේ 'ලංකාවේ ස්තූප' ග්‍රන්ථය අධ්‍යයනය කරන විට පැහැදිලි වේ.[148]

මෙම වාහල්කඩෙහි බාහිර ස්ථම්භවල පසුපස මුහුණත් කැටයම් පුවරු දෙකක් සෑදෙන සේ ඒවා ගිල්වා තිබෙනු දක්නට ලැබේ. එම පුවරු එකක් මත එකක් සිටින සේ නිර්මානය කර ඇත. ඉහළ ගල් පුවරුවේ එක් අතකින් මල් දෙකක් අල්ලා ගෙන සිටින ආකාරයේ මිනිස් රූපයක් නිර්මාණය කර ඇති අතර එය උරහිස දක්වා විහිදෙන ආකාරයක් පෙන්නුම් කරයි. වම් අත ඔහුගේ වම් ඉඟටියෙහි රඳවා ඇත. අඟපසඟ මනාව පෙනෙන සේ දුහුල් වස්ත්‍රයකින් සරසා ඇති බව පෙනේ.

මෙම පුවරුව බොහෝ සෙයින් නටබුන්ව ගොස් ඇති බැවින් නම් කිරීමට තරම් දුෂ්කර වූ හිස් පැළඳුම් ඔහුගේ හිස මත දක්වා ඇති අයුරු පෙන්නුම් කෙරෙන නමුත් නාග හිස් පහකින් සමන්විත යැයි කිව හැකි ය. දෙකන් මැණික් එක් කළ තෝඩුවලින් අලංකාර කර ඇත.[149]

මෙහි කුඩා පුවරුවෙහි දක්වෙන්නේ ස්ත්‍රී රූපයකි. ඇය දකුණු අතින් මල් දෙකක් පමණක් රැගෙන සිටින ආකාරයක් දක්නට ලැබෙන අතර ඇයගේ එම අත ඉහළට එස වී ඇත. වම් අත ඇයගේ ම මෙවුල්දමෙහි රඳවා ඇත. දුහුල් ඇඳුමකින් සරසා ඇති ඇයගේ උඩු කයට මාලයකුත් දෙකන්වලට විශාල තෝඩුත් දෑතේ බාහුවලට විශාල වළලු තුන බැගිනුත් අලංකාර කොට ඇති බව දක්නට ලැබේ. මෙහි දක්නට ලැබෙන විශේෂිතම ලක්ෂණය වනුයේ ඇයගේ වම් උරයට පිටුපසින්

148 A .S.C.A.R. Bell, H.C.P., 1894,Vo. IV, P.01
149 -DO-

ඇය දෙස නෙත් යොමා ඇයට අමතන ආකාරයෙන් එක් පෙණයක් සහිත නාගයෙකු නිර්මාණය කර තිබීම යි.[150]

ඉහත සඳහන් ලක්ෂණ නිරූපිත ස්ථම්භ හෙවත් ගල් පුවරුවලට අමතරව. වාහල්කඩ එක් එක් කෙළවර පහළම ප්‍රාසාදයේ ගඩොල් බැම්මට සමාන මට්ටමකින් අඩි 03යි අඟල් 10ක් උස, අඩි 2යි අඟල් 08ක් පළල, නාග පෙණ . හතකින් සමන්විත ලම්බාකාර ගල් කණු නිර්මානය කොට තිබෙනු දක්නට ලැබේ.[151] මෙම නාගයාගේ බෙල්ලේ මැණික් එබ්බ වූ කොළරයක් ද, හිස් හතට උඩින් ඡත්‍රයක් ද නිර්මානය කොට ඇත. සෙල් කැටයම්වල නිරූපිත මෙම නාග රූප අතිශයින් ම ස්වාභාවික ආකාරයෙන් නිරූපිත ය. [152] නාගයාගේ හමෙහි කොර පොතු හැඩ පවා ඉතාමත් ස්වභාවික ආකාරයෙන් ම දක්වා ඇත. අනුරාධපුර යුගයෙන් සොයාගත් සියලු ම කැටයම් අභිබවා මෙම කර්මාන්තය ඉස්මතු වන බව ස්මිද්ර් මහතාගේ අදහස යි.

ජේතවන විහාරයේ අලංකාරය පිණිස ගොඩනගා ඇති මෙම අලංකාර ගොඩනැගිල්ලෙහි උතුරෙහි පිහිටා ඇති වාහල්කඩෙහි අභ්‍යන්තර ස්ථම්භ මුහුණත උක්කුටික වාමනයෙකුගේ හිස උඩින් ඔහුගේ දෑත් මතින් එසවුණු කුඩා මුවවිටකින් යුත් වාම් පුන්කලසක් නිර්මානය කොට තිබේ. ඒ තුළින් නික්මෙන සේ සාදා ඇති විසිතුරු කැටයමින් හෙබි ලියවැලෙහි මූලික ම ලක්ෂණය වනුයේ එය නලාකාර පුෂ්පයක ස්වරූපයක් දැරීමයි. එය යුගල ආකාරයෙන් දක්වා ඇත. නලාකාර පුෂ්පයන්, එකිනෙක මත පිහිටන පරිදි ද නොයෙක් හැඩයේ පත්‍රයන්ගෙන් ද අලංකෘත කොට තිබේ. මෙම ලියවැලෙහි යොදා ඇති පත්‍රවල සමහර තැනෙක පත්‍ර වෙනුවට

[150] ඡායා ඡාලක අංක 03 බලන්න.
[151] A .S.C.A.R. Bell, H.C.P., 1894,Vo. IV, P.02
[152] -DO-





සත්ව රූප යුගල බැගින් නිරූපණය කොට ඇති අයුරු දැක ගැනීමට පුළුවන. එම සත්ව රූප සමදුරින් නිර්මානය කර ඇති බව, ස්මිදර් මහතාගේ වාර්තාවේ සඳහන් වේ.[153]

පුෂ්ප, ගර්භ තුළින් නික්මෙන මෙම සත්ව රූප, වමට හෝ දකුණට, ඉහළට පනින ස්වරූපයක් දිස් වේ. මෙම උතුරු වාහල්කඩෙහි නැගෙනහිර කෙළවර ස්ථම්භයෙහි එම රූප පහළ සිට පෙළ ගැසී ඇත්තේ පිළිවෙළින්, අශ්වයන්, හාවුන්, වෘෂභයන්, ගෝනුන් වශයෙනි. එහිම බටහිර කෙළවර වෘෂභයන්, සිංහයන්, හා අශ්වයින් දක්වා තිබේ.[154] අශ්වයාගෙන් පසුව සත්වයාගේ රූපය අසළින් ස්ථම්භ කැඩී මුදුන් කොටස අතුරුදහන් වූ ආකාරයකින් දිස් වේ. එබැවින් ඒ පිළිබඳව දත්ත එක්රැස් කිරීම උගහට ය.

එහි බාහිර ස්ථම්භයට ඉහළින්, පිටතට දිස්වන කොටස. පියුම් ලියවැලකින් නිර්මාණය කොට ඇත. පියුම් පිරිවරා සිටින සේ ඒවා වක්‍ර වී ඇත. පියුම්වල ද පොහොට්ටු හැඩය ද අර්ධ පුෂ්පිත හැඩය ද පූර්ණ පුෂ්පිත හැඩය ද එකම ලියවැලෙහි දිස් වේ. මෙහි නැගෙනහිර ශෛලියෙහි, සුපුෂ්පිත පියුම කේන්ද්‍රගත කොට ඇති සෙයක් දිස් වේ. නමුත් බටහිර කෙළවර පිළිවෙළ තරමක් වෙනස් ය. තැනින් තැන සිංහයෙකුගේ හෝ පක්ෂියෙකුගේ හැඩය කේන්ද්‍රගත වන ලෙස ලියවැලෙහි පියුම් දුරස් කොට නිර්මානය කොට ඇත.

මෙහි බාහිර ස්ථම්භ මුහුණත ද ලියවැල් සැලසුමක් දක්නට ලැබේ. වෘත සයක් නිර්මානය වන ලෙස එය සැකසී ඇත. එක් එක් වෘත්තයක ලාංඡනයකි. එයට යටිකුරු සුපිෂ්පිත

[153] Smither, James., G.A.R.A.S.L., 1993, P.69
[154] -DO-

මලක් මත පිහිටා ඇති ආකාරයක් දිස් වේ. ස්ථම්භ ද්වයෙහි ම ලක්ෂණ මෙලෙස නොවේ. නැගෙනහිර ස්ථම්භයෙහි පාදයේ සිට ප්‍රථම වෘත්තයෙහිම අන්තර්ගත වනුයේ "ධර්මචක්‍ර" ලාංඡනයකි. දෙවෙනි ලාංඡනය උඩින්, විෂ්ණු දෙවියාගේ සක් ගෙඩිය ද ඊළඟට කුමක් නිර්මානය කර තිබේ ද යන්න නො පැහැදිලි නමුත් සමහරවිට ධර්ම චක්‍රය උසුලාගත් කණු හැඩයක් විය හැකි ය.[155] ඉන්පසු නිර්මානය කොට ඇත්තේ, ස්වස්තික හැඩය යි. ඉහළින් ම නිරූපිත වනුයේ විෂ්ණු දෙවියාගේ "පළිහ" ආයුධය යි. වාහල්කඩෙහි බටහිර ස්ථම්භය නො පැහැදිලි තරම් ය. එසේ වුවත් පහළම වෘත්තයෙහි ස්ථම්භ හැඩයකි. ඒ මත නො පැහැදිලි වස්තුවකි. එම ස්ථම්භයෙහි ම දකුණුපස හිස් වෘත්තයක් දක්වා ඇත. වම්පස ස්වස්තියක් ද චක්‍ර ලාංඡනයක් ද ත්‍රිශූලය මත ධර්ම චක්‍රය යනාදිය වශයෙන් චක්‍ර මත දක්වා ඇත. ඉහළම වෘත්තයෙ නිර්මානය කොට ඇත්තේ කුමක් ද යන්න අපැහැදිලි ය.

මෙම ස්ථම්භයන්හි පසු මුහුණත සෙල් පුවරු දෙකක් තබා ඇත. මෙය ද බටහිර වාහල්කඩ මෙන් දක්වා ඇත. එහි නැගෙනහිර ස්තම්භයෙහි ඉහල ලොකු පුවරුවෙහි පුරුෂ රූපයක් නිර්මානය කොට ඇති අතර එය හිටි රූපයකි. ඔහුගේ දකුණු අත හිසට ඉහළින් එස වී ඇත. වමත ද උරහිස දක්වා ඒ අයුරින් ම එස වී තිබේ. නිර්මානය කොට ඇත්තේ දුහුල් වස්ත්‍රයකි.

බටහිර වාහල්කඩ මෙන් පහත පුවරුවෙහි ස්ත්‍රී රූපයක් නිර්මාණය කොට තිබේ. නමුත් මෙහි වෙනසකට ඇත්තේ බටහිර වාහල්කඩෙහි මෙන් ස්ත්‍රී රූපය අසළින් මතුවන නාග රූපයක් මෙහි දක්නට නො ලැබීම යි. මෙම සෙල් පුවරුව

[155] Smither, James., G.A.R.A.S.L., 1993, P.69





එක්තරා දුරකට කැටයම් රහිතවීම ද මෙහි දක්නට ලැබෙන තවත් විශේෂත්වයකි. නො නිමි තත්ත්වයකින් පැවතුණ ද අතිශයින් ම සූක්ෂම ලියවැලක් ඒ තුළ දක්නට හැකි ය. එම ලියවැලෙහි එක දිගට චක්‍ර දක්නට ලැබෙන අතර ඒ තුළ වෘෂභ හා සිංහ රූප නිර්මානය කොට ඇත.[156]

ජේතවන විහාරයේ ඉදි කරන ලද, දූනට සොයා ගෙන ඇති පරිදි එහි ඉදි වූ දකුණු වාහල්කඩ ද බටහිර වාහල්කඩෙහි ස්වරූපය ම ගනී. එහි අභ්‍යන්තර ස්ථම්භ විශේෂ සැරසිල්ලකින් අලංකාර කොට ඇත. ලියවැල් වඩාත් සියුම් ලෙස හා වඩාත් දියුණු ලෙස නිර්මානය කර තිබීම විශේෂ ලක්ෂණයකි. මෙහි නිරූපිත ලියකම් අතර නලාකාර පුෂ්පයන්ගේ හැඩය විශේෂිත ය. සිරස් අතට නෙළා ඇති එම පුෂ්පයන්ගේ පත්‍ර පිහිටා ඇත්තේ, තැනින් තැන, පසුපස ගැටෙන සේ ය. ඒ අතර සත්වයන්ගේ රූප ද නිර්මානය කොට ඇති බව දක්නට හැකි ය. මෙහි නටබුන්ව ඇති කොටසෙහි දක්නට ලැබෙන අන්දමට, දකුණු වාහල්කඩෙහි බටහිර පෙදෙස වෘෂභයන් පෙළක් හා සිංහයන් පෙළකින් අලංකාර කොට ඇත. මෙහි ම නැගෙනහිර පෙදෙසේ පිහිටුවා ඇති ස්ථම්භය අනෙක් ඒවාට වඩා සුරක්ෂිතව ඇති හෙයින් එය ආදර්ශය පිණිස ගත්ත ද එහි ඇත්තේ ද වෘෂභ රූ පමණි.[157]

මෙහි බාහිර ස්ථම්භයක් නිර්මානය කොට ඇත්තේ, බටහිර හා උතුරු වාහල්කඩ මෙනි. සූක්ෂම ආකාරයේ ලියවැලක් පුන්කලසකින් නිකුත් වේ. එම ලියවැල සිංහයන් තිදෙනෙකු සිටින පුෂ්පයකින් කෙළවර වේ. එම සිංහයන් තිදෙනා සහිත

[156] Smither, James., G.A.R.A.S.L., 1993, P.69
[157] -DO-

පුෂ්පය කේන්ද්‍ර මල්වලින් නිකුත් වන අතර, ඒ අතර සිංහයන් හා වෘෂභයන් යුගල වශයෙන් නිරූපණය කොට ඇත.[158]

බාහිර ස්ථම්භයන්ගේ පසුපස, උතුරු හා බටහිර වාහල්කඩවල බාහිර ස්ථම්භ මෙනි. ඒ අනුව මෙහි ඉහළ විශාල ගල් පුවරුවල පුරුෂ රූපය නිර්මානය කර ඇති බව දක්නට ලැබෙන අතර ඔහු ස්වර්ණාභරණවලින් අලංකාර වී ඇති ආකාරයක් පෙනේ. නාග හිස් පහක් ද නිරූපිත බව පෙනෙන අතර, ඔහුගේ හිස් වැස්ම යැයි නිගමනය කළ හැකි තලප්පාවක් පසෙකින් දක්නට ලැබේ. නිර්මිත පුරුෂයාගේ දකුණු අතින් පියුම් දෙකක් අල්ලා ගෙන ඇත. අනෙක් අත දුහුල් වත රඳනා බඳපටිය මත ය.[159]

මෙම පුරුෂ රූපය සහිත ස්ථම්භයට පිටු පසින් ඇත්තේ ස්ත්‍රී රූපයකි. නමුත් එය විස්තර කිරීමට තරම් පැහැදිලි ස්වරූපයක් ඒ තුළින් දිස් නො වේ.[160]

නැගෙනහිර කෙළවර නාග හිස් පහකින් සමන්විත හිස් වැස්ම සහිත පුරුෂ රූපය එහි අනෙක් කෙළවර රූපයට බෙහෙවින් සමාන බවක් දක්වයි. මෙහි දක්නට ලැබෙන සුළු වෙනස වනුයේ එක් අතක රැඳි තනි පියුම පමණකි. මෙම පුරුෂ රූපය නිර්මානය කොට ඇත්තේ කුඩා වේදිකාවක් සේ සකස් කරන ලද උස් බිමක ය. පහත දැක්වෙන ස්ත්‍රී රූපය විනිවිද පෙනෙන ආකාරයෙන් දුහුල් වස්ත්‍රයකින් සරසා තිබේ. දුහුල් වස්ත්‍රයකින් සරසා තිබෙන නිසා ම ඇයගේ අඟපසඟ පැහැදිලිව පෙනෙන සෙයක් දක්නට හැකි ය. මෙ දුහුල් වස්ත්‍ර හීන් කෙණ්ඩ දක්වා නිර්මානය කොට ඇත. ගෙලෙහි දෙකන්හි හා දෙඅත් හි ස්වරණාභරණවලින් සරසා තිබේ.

158 Smither, James., G.A.R.A.S.L., 1993, P.69
159 පරණවිතාන, සෙනරත්., ල.ස්., 1962
160 Smither, James., G.A.R.A.S.L., 1993, P.71





ඇයගේ දකුණු අත, ඉහළට එසවෙන අතර එම අතෙහි පියුම් පොහොට්ටු හැඩැති කිසියම් වු වස්තුවක් දක්නට ලැබේ. නමුත් එය ස්ථිර වශයෙන් ම කුමක් ද යන්න අපැහැදිලි ය. වම් අතින් බඳ පටිය අල්ලාගෙන සිටින විලාසයක් පෙන්නුම් කෙරේ. බටහිර වාහල්කඩෙහි මෙන් ම මෙම දකුණු වාහල්කඩහි ද, නාගයෙකු ගේ හිසත්, ස්ත්‍රියගේ වම් උරහිසට උඩින් මතු වේ. පුරුෂ රූපය නිර්මාණය කර ඇති පරිදි ඇය ද කුඩා වේදිකාවක් මත නිර්මානය කර ඇත. සාහසිකයන්ගේ ග්‍රහණයට හසුව ඇති බැවින්, මෙම රූපයේ මුහුණ විපරීත ස්වරූපයක් ගනී.

දකුණු වාහල්කඩෙහි නටබුන්ව ඇති ලක්ෂණ අනුව වෙන වෙන ම සේල පුවරු මත නාගරූප පැවති බව දිස් වේ. ඒවා බොහෝ සෙයින් බටහිර වාහල්කඩහි රූප ස්වරූපයක් ගනී.

මෙම ජේතවන විහාරයට සම්බන්ධව, වාහල්කඩවලට සමාන්තරව කුඩා පන්සල්වල නටබුන් බටහිර දෙස දැකිය හැකි බව ජේ.ජී. ස්මිදර් මහතා සඳහන් කරනු ලැබුවත්[161] එච්.සී.පී. බෙල් මහතා ප්‍රධාන දාගැබට සතර දිසාවන්හි ම කුඩා පූජනීය ස්ථානයක් දක්නට ලැබෙන බව සඳහන් කරනු ලබයි.[162]

බාරොස් මහතාගේ අදහසට අනුව නැගෙනහිර පූජනීය ස්ථානය අන් හැම ගොඩනැගිල්ලකට ම වඩා සම්පූර්ණ තත්ත්වයේ පවතින බව සඳහන් කරනු ලැබේ.[163] එම ගොඩනැගිල්ලේ දෙපස කෙළවර ගලින් කොටන ලද තනි ගල් කණු තුනක් තබා ඇති අතර, එහි මුදුන පැතැලි වූ ආකාරයක් ගනී. ඒවා උසින් අඩි 03 ක් පමණ ය.

161 Smither, James., G.A.R.A.S.L., 1993, P.71
162 -DO-
163 -DO-

මෙහි පෙණ හතක් ඇති නාගයෙකුගේ රූපයක්, ඉදිරියට පැමිණෙන විලාසයෙන් දක්වා ඇත.[164] මෙම ගොඩනැගිල්ලේ මැද මැදිරි දෙකකට වෙන් කර එම මැදිරි දෙකෙහි ස්ත්‍රී හා පුරුෂ රූප දෙකක් තනා ඇත. මෙම පිරිමි රූපය පෙණ හතක් සහිත නාගයෙකුගේ හිස ආවරණය වී ඇත. ස්ත්‍රියගේ රූපයේ හිසෙහි තනි නාගයෙකුගේ හිසක් පමණක් දක්නට ලැබේ. මෙම ප්‍රතිමාවෙහි අනෙක් පසෙහි ද කුඩා සහ විශාල මැදිරි දෙකකට බෙදා ඇත. කුඩා මැදිරියෙහි බුදුරදුන්ට සම්බන්ධ කථා වස්තුවක් නිර්මානය කොට ඇත.[165] විශාල මැදිරියේ හංසයන්, මොනරුන් ආදී සතුන්ගෙන් යුක්ත වූ මල් වැලක් තනා ඇත. මෙය අඩි 07ක් පමණ උස ය. මෙහි ඇතුල් ස්ථම්භය අඩි 06ක් පමණ උස ය. එය සම්පූර්ණයෙන් ම මල් ලියකම්වලින් නිමකර ඇති බව දක්නට ලැබේ. මෙම ගොඩනැගිල්ල තුළ නිර්මිත සත්ව රූප අතර ඇතුන්ගේ හිස් දක්නට ලැබෙන අතර ම, නෙළුම් මල් ද නිරූපිතව ඇත. තව ද බිත්ති හිස, දියමන්ති හැඩයට කපා ගලින් නිමවා ඇත යන්න බෙල් මහතාගේ අදහස යි.[166] නිරූපිත සත්ව හ ශාඛ රූපයන් පිත්තාරු කර ඇති අතර එයට උදාහරණ වශයෙන් නාග හිස්වල සමහර පාටවල සේයා දක්නට ලැබෙන බව කිව හැකි ය.

මෙහි උතුරු පූජනීය ගොඩනැගිල්ල මේ වනවිට විනාශ මුඛයට පාත්‍ර ව ඇති බවක්, මැක්පිල් මහතා එය නැවත ගොඩනැගූ බවත් වාර්තා වේ.[167] එහි උස අඩි 15 කි. එය 1886 දී ප්‍රතිසංස්කරණය කරන ලද්දේ මිරිස වැටි දාගැබ අකාරයට යැයි එහි දී වැඩි දුරටත් සඳහන් වේ.

164 Smither, James., G.A.R.A.S.L., 1993, P.71
165 A .S.C.A.R. Bell, H.C.P., 1894,Vo. IV, P.02
166 -DO-
167 -DO-





බටහිර ප්‍රධාන වාහල්කඩට ඉදිරියෙන් වූ, වේදිකාවෙහි පිහිටි කුඩා පන්සල තුළ අඩි 07ක් උසැති ශිලාස්ථම්භ අටක් පමණ දක්නට ලැබේ. එහි දක්නට ලැබෙන විශේෂිත ලක්ෂණය වනුයේ ද්විත්ව කණු අග මුළු හැඩ කපා අවසන් කොට තිබීම යි.[168] අනෙක් ඒවා ස්වභාවික ආකාරයෙන් ම දක්වා තිබේ. මේවා බිත්තිවලට තබා බඳිනු ලැබ ඇති ස්වරූයක් දිස් වේ. වේදිකාවේ සිට අඩියක් පමණ උසින් වූ ගඩොල් ඇල්ලූ බිමක මේ කණු, සවි වී ඇත. මෙහි උස් බිමෙහි මුළු දිග අඩි 26 කි. පළල අඩි 18කි. අඩි 03යි අඟල් 08ක් දිග අඩි 2යි අඟල් 03 ක් පළල අල්තාරයක් වැනි සෙල් පුවරුවක් මේ නිර්මානයට ඇතුළත් ය. එය තාවකාලික ලෙස සවි කළ දොරටුවෙහි කොටසක් ලෙස දක්නට ලැබේ.[169] එහි යට මුල් අල්තාරයේ පාද බොරදම් පෙනේ. මේවා කේන්ද්‍රස්ථානයෙන් ඇත් ව පිහිටුවා ඇත්තේ දකුණු කෙළවරේ කුඩා කුළුණු දෙකකට ඉඩ සැලැස්මට ය. ඒවායේ කැඩුණු කොටස් පමණි, ශේෂව ඇත්තේ උතුරු දෙස ද එමෙන් ම දකුණු දෙස ද මෙවන් වූ ආකාරයේ පූජනීය ගොඩනැගිලි දක්නට ලැබෙන බවත් ඒවාත් නැගෙනහිර හා බටහිර පිහිටි ඒවා මෙන් ම දිස්වන බව, ස්මිදර් මහතාගේ අදහස යි.[170]

මෙම පූජනීය පන්සල් දාගැබට සමාන දුරකින් පිහිටා ඇති බැවින් එය පන්සල හා දාගැබ අතර අඩි 09යි අඟල් 5 1/2 ක් දිගැති, අඩි 03යි, අඟල් 7 1/2 ක් පළලැති සෙල්මුවා අල්තාර පුරවැවක් ඉහළ මුහුණත ගිල්වා ඇති අතර එය තාවකාලික කණු මත රඳවා ඇත. ඒ අනුව වාහල්කඩ සමීපව ම, මුල් තත්ත්වයේ අල්තාරයකි. එහි පාදම අඩි 10යි අඟල් 06 ක් දිග ය.

168 Smither, James., G.A.R.A.S.L., 1993, P.71
169 -DO-
170 -DO-

අඟල් 06ක් පළල ය. එය ද වේදිකාවක් මත නිර්මානය කර ඇත.[171] වාහල්කඩින් අඩි 09ක් ඉදිරියට නෙරා එන, මෙහි ඉදිරි නෙත්තිය කැටයම් කොට ඇති සෙයක් දක්නට ලැබේ. වේදිකාවෙහි දිග අවිනශ්චිත වුවත් අඩි 30ක් පමණ වූ වාහල්කඩෙහි මධ්‍යම කොටසෙහි සම්පූර්ණ දිගම මෙහි ද තිබෙන්නට ඇත. එමෙන් ම අඟල් 08ක සතරැස් කණු සතරක් එහි තිබෙන්නට ඇතැයි අනුමාන කළ හැකි ය. ඉන් එක් කුළුණක් තවමත් ශේෂව පවතී.

## 4.3පිළිම ගෙයඃ (දාගැබට බටහිරින් පිහිටා ඇති)

ජේතවන දාගැබට බටහිරින්, දාගැබට යාර 200 ක් පමණ දුරින් විශාල පිළිම ගෙයක නටබුන් දක්නට ලැබන අතර,[172] ඒ තුළ හිටි පිළිමයක් තැන්පත්ව තිබෙන්නට ඇතැයි අනුමාන කළ හැකි ය. එච්.සී.පී. බෙල් මහතා මෙය හඳුන්වනු ලබන්නේ. "පිළිම ගේඃ අංක2'' වශයෙනි. [173] මෙම ගොඩනැගිල්ලේ සෙල්මුවා උළුවස්ස, උසින් අඩි 27 කි. එය පොළොව යටට අඩි 09 ක් පමණ වැළලී ඇතැයි නූතන කැණීම් පරීක්ෂකවරුන්ගේ උපකල්පනය යි. ක්‍රි.ව. 10වන සියවයේ පමණ, පිළිම ගෙය ඉදිවන්නට ඇතැයි සඳහන් වේ.[174]

ආයක චතුරශ්‍රකාරව ගොඩනගා ඇති මෙම ගොඩනැගිල්ලට ඉදිරියෙන්, වර්තමානයේ, ''ප්‍රමුඛය'' වශයෙන් හඳුනාගෙන ඇති චතුරශ්‍රය, අඩි 35 ක් දිග වන අතර අඩි 34යි. අඟල් 03ක් පළල ය. මෙය පොළොව මට්ටමේ සිට උස අඩි

[171] Smither, James., G.A.R.A.S.L., 1993, P.71
[172] ඡායා ඵලක අංක 04 බලන්න.
[173] A.S.C.A.R. Bell, H.C.P. 1892., 1904, P.04
[174] Ratnayake, Hema., " JETAWANAYA" T.C.T.S.L., 1993, P.70-P.69





03යි අඟල් 06කි. එය ගඩොලින් නිමවා ඇත. එම ගොඩනැගිලේලේ මුදුනත පළල (නටබුන්ව ඇති ස්ථානය) අඩි 02යි. අඟල් 01කි. මෙම ''ප්‍රමුඛය'' ඉදි කිරීම සඳහා යොදා ගෙන ඇති ගඩොල් ගලක්, අඩි 01 ක් දිග වන අතර, අඟල් 08 ක් පළල වේ. එහි ඝණකම අඟල් 02 කි.

''ප්‍රමුඛය'' යෙහි ප්‍රධාන එක් දොරටුවක් තිබෙන අතර එය නැගෙනහිරට මුහුණලා ඉදි කොට ඇත. එහි පඩි පේළි 05 ක් දක්නට ලැබේ. දිග අඩි 12යි අඟල් 09කි. පළමු (පළමු පඩි පේළි 04) අඩි 01කි. අවසාන පඩි පේළිය අඩි 03ක පමණ පළල වේ. මෙම ගොඩනැගිල්ල අභ්‍යන්තරයේ කැඩුණු ගල් කණු 13 ක් පමණ දක්නට හැකි ය. මේවායෙහි දිග හා පළල සමාන නො වෙතත් ඒවායෙහි සාමාන්‍ය වටප්‍රමාණය අඩි 01යි, අඟල් 04ක් පමණ වේ. මෙම ගල් කණුවල අඩි 05 යි, අඟල් 1/2 කි ගිය පසු අඟල් 02ක් පමණ ඇතුළට හාරන ලද කවයක් දක්නට ලැබේ. මේවා කුමන ප්‍රයෝජනයක් සඳහා නිර්මානය කළා ද යන්න සැක සහිත ය. ඒ කෙසේවෙතත්, නටබුන්ව ඇති ගල් කණු මෙම ප්‍රමුඛයේ වහල දැරීම සඳහා කරන්නට ඇතැයි අනුමාන කළ හැකි ය.

පිළිම ගෙට දෙපසින් එයට අඩි 50ක් පමණ ඉදිරියෙන් වර්තමානයේ සේවා ස්ථානය යැයි සැලකෙන ගොඩනැගිලි හඳුනා ගෙන ඇති අතර පිළිම ගෙට ඇතුල් වන විට වම් පසින් ඇති ගොඩනැගිල්ල අඩි 25යි, අඟල් 02ක් පමණ දිග වන අතර, එය අඩි 33යි, අඟල් 04ක් පළල ය. මෙයට පිවිසීමට එක් දොරටුවක් පමණක් තිබී ඇති බැව් පෙනේ. මෙහි පඩි පේළි 06ක් දක්නටන ලැබේ. එය අඩි 06යි අඟල් 08ක් දිග ය. ගලින් නිමවා ඇති මෙම පඩි පේළි එක් පඩි පෙළක් අඩි 01ක් පළල ය. දොරටුව දෙපස කොරවක් ගල් නිර්මානය කර ඇති අතර

ඒවා නටබුන්ව ඇති හෙයින් එය කුමන අකාරයෙන් පැවතියා ද යන්න නිශ්චය කිරීම උගහට ය. මෙම සේවා ස්ථානයෙහි කැඩුණු ගල් කණු 04ක් අභ්‍යන්තරයෙහි දක්නට ලැබේ. ඒවා මෙම ගොඩනැගිල්ලේ වහලය දරා සිටීමට උපයෝගී කර ගත් ඒවා යැයි අනුමාන කළ හැකි ය. එසේ නො වන්නේ නම් මහල් කීපයක් ඉදි කරන්නට උපයෝගී කරගත් කුළුණු විය හැකි ය.

දකුණු පස ඇති "සේවා ස්ථාන" ගොඩනැගිල්ල, අඩි 25යි, අඟල් 07 ක් දිග වේ. එහි පළල අඩි 33යි අඟල් 04 කි. මෙයට පිවිසීම සඳහා ද එක් දොරටුවක් පමණක් තිබෙන අතර, එය ගලින් නිමකර ඇත. ඇතුල්වීම සඳහා පඩි පේළි 05ක් ඉදි කර ඇති අතර, එහි දිග අඩි 05 යි, අඟල් 06 ක් පමණ වේ. එක් පඩි පේළියක පළල අඩි 01ක් පමණ ය. මෙම පඩි පේළි දෙපස කොරවක්ගල් දෙකක් දක්නට ලැබෙන නමුත්, එය නිර්මානශීලීත්වයෙන් තොර ය. එමෙන් ම දොරටුව පාමුල සකස් කර ඇති සඳකඩ පහණ ද නිර්මානශීලීත්වයෙන් තොර ය. දකුණු පස සේවා ස්ථානයෙහි කැඩුණු ගල් කණු 10ක් දක්නට ලැබෙන අතර මේවා ද වහල හෝ මහල් කීපයක් සකස් කිරීමට උපයෝගී කර ගත්තා විය යුතු ය.

පිළිමය තැන්පත් කර තිබූ ගොඩනැගිල්ලේ ප්‍රධාන දොරටුව නැගෙනහිර දෙසට මුහුණ ලා නිර්මානය කර ඇත. තවත් අප්‍රධාන දොරටුවක් උතුරු දෙස දක්වා තිබේ. බුදුන් පිදිම සඳහා පැමිණෙන බැතිමතුන් ඇතුල් විය යුත්තේ නැගෙනහිර දෙස නිර්මානය කරන ලද දොරටුවෙනි. එය, අඩි 13යි, අඟල් 02ක් පමණ දිග ය. පළල අඩි 01 කි. එහි උස අඩි 27ක් පමණ ඉදිරියෙන් ගඩොල් ඇල්ලු කොටසක් දක්නට ලැබෙන අතර එහි උස අඩි 03යි, අඟල් 01කි. පළල අඟල් 14කි. නමුත් එහි සෑම





තැනම එක හා සමාන නො වේ. දකුණු පස අඟල් 14 ක් වන අතර උතුරු පස අඟල් 12කි. එහි දකුණු පස වතුර බැස යාමට කළු ගලින් නිමකරන ලද අඩි 03යි අඟල් 04ක් දිග අඟල් 11 ක් පමණ පළල කාණුවක් දක්නට ලැබේ.

ප්‍රධාන දොරටුවෙහි. අඩි 02යි අඟල් 06ක් පමණ පළල, පොළොවේ සිට අඩි 01 ක් පමණ ඝණකම ඇති ශෛලමය ලැල්ලක් දක්නට ලැබේ. මෙම දොරටුව ලීවලින් හෝ ගලින් තනන ලද කණු දෙකක් මත රඳවා ඇත. ඒ බවට අඟල් 9 1/2 X9 142 ප්‍රමාණයේ වළවල් දෙකක් දක්නට ලැබීමෙන් අනුමාන කිරීමට පුළුවන.

මෙම පිළිමගෙහි උතුරු දිසාවේ පිහිටා ඇති අප්‍රධාන දොරටුව අඩි 09යි, අඟල් 04ක් පමණ උස වේ. එහි පළල අඩි 03යි, අඟල් 04 කි. මෙහි උළුවස්ස කළු ගලින් නිමවා ඇති අතර එහි ඝණකම අඟල් 11ක් පමණ ය. දොරටුවට ප්‍රවිෂ්ට වීමට පඩි පෙළවල් දෙකක් තිබෙන අතර පළමු පඩි පෙළ අඩි 06 යි, අඟල් 08ක් දිග වන අතර, පළල අඩි 01 යි, අඟල් 6 1/2කි. දෙවෙනි පඩි පේළිය අඩි 03යි, අඟල් 02ක් පමණ වේ. පළල අඩි 01යි, අඟල් 10කි.

මෙම පිළිම ගෙය එකම ශාලාවක් වශයෙන් දක්නට ලැබුණත්, එය ප්‍රධාන කොටස් තුනකින් යුක්ත ය. එහි පළමු වන කොටස ඇතුල් වන ස්ථානය වශයෙනුත්, දෙවෙනි කොටස පිළිමය තැන්පත් කර තිබූ කොටස වශයෙනුත් සඳහන් කිරීමට පුළුවන.

ඉහත දෙවෙනි කොටස, අඩි 15 ක් දිග වන අතර. එහි පළල අඩි 13යි, අඟල් 10කි. (ප්‍රදක්ෂිණා පථයට ප්‍රවිෂ්ට වීමට ඇත. පිළිමය තැන්පත් කර ඇති කොටසට ඉදිරියෙන් ඇති කොටසෙහි වම්පස අඩි 05 යි අඟල් 09ක් දිග, අඩි 01 ක් පළල

ගල් ලැල්ලක් දමා තිබෙන අතර එයට ද පිවිසීමට දොරටුවක් තිබුණ යැයි සැලකිය හැකි නටබුන් දක්නට ලැබේ. එම දොරටුව සවිකර තිබුණා යැයි අනුමාන කළහැකි වම්පස හා දකුණුපස අඟල් 4/ 1/2 × 1 1/2 ප්‍රමාණයේ වළවල් දක්නට ලැබේ.

මෙම කොටස පිළිම ගෙය වටා ප්‍රදක්ෂිණ කිරීමට යොදා ඇති ප්‍රදක්ෂිණ පථයට පිවිසීමට සකස් කර ඇති අතර එහි වම්පස ද එයට ප්‍රවිෂ්ට වීමට තවත් දොරටුවක් දක්නට ලැබේ. අඩි 05යි, අඟල් 09ක් දිග අඩි 01යි, අඟල් 11 ක් පමණ පළල කළුගල් ලැල්ලක් දක්නට පුළුවන. අඟල් 5 x 2 ප්‍රමාණයේ වළවල් දෙපස නටබුන්ව තිබේ.

දකුණු පස ද මෙම ප්‍රමාණයේ ම දොරටුවක් තිබූ බවට අනුමාන කළ හැකි නටබුන් දක්නට ලැබේ. ප්‍රදක්ෂිණ පථයේ සම්පූර්ණ දිග. අඩි 184යි අඟල් 10කි. පළල අඩි 05යි, අඟල් 08කි. මෙම පථය තුළ කවුළු 16ක් දක්නට ඇති අතර බෙල් මහතා, තමාගේ වාර්තාවේ සඳහන් කරනු ලබන්නේ කවුළු 12ක් වශයෙනි.[175] පිළිමය තැන්පත් කර තිබූ කොටසෙහි පමණක් කවුළු 12ක් දක්නට ලැබේ. සමහර විට බෙල් මහතා පිළිමය තැන්පත් කර තිබූ කොටසෙහි පමණක් කවුළු සංඛ්‍යාව දක්වූවා විය හැකි ය.

හිටි පිළිමය තැන්පත් කර තිබූ චතුරශ්‍රාකාර කොටස අඩි 25යි, අඟල් 06ක් දිග වන අතර අඩි 25යි අඟල් 06ක් පළල වේ. මෙ කොටසෙහි පොළව මත සම්පූර්ණයෙන් ම ගල් අතුරා ඇත. මෙයට ඇතුල් වීමට ද දොරටුවක් තිබුණ බවට අනුමාන කළ හැකි සාධක දක්නට ලැබෙන අතර ඒවා දාරුමයෙන්

[175] A.S.C.A.R. Bell, H.C.P. 1892., 1904, P.04





සකස් කළ යැයි සිතීමට පුළුවන. දොරටුවෙහි දෙපස අඟල් 9×5 ප්‍රමාණයේ වළවල් දක්නට හැකිය. එයට මඳක් පිටුපසින් අඟලේ 4 1/2 × 2 1/2 ප්‍රමාණයේ වළවල් දෙක බැගින් ද දක්නට ලැබේ.

මෙම හිටි පිළිමය තැන්පත් කරන ලද්දේ පීඨයක් මතය.[176] එහි සම්පූර්ණ වට ප්‍රමාණය අඩි 37යි, අඟල් 03 පමණ වේ. පීඨය වළලු දෙකක ආකාරයෙන් නිර්මානය කොට ඇති බව දක්නට හැකි ය. බෙල් මහතාගේ වාර්තාවේ සඳහන් වනුයේ මෙම පීඨය සම්පූර්ණයෙන් ම හුණු ගලින් තනා ඇති බව ය.[177] එබඳු ස්වරූපයක් වර්තමානයේ දිස් නො වුව ද ඇතැම් විට වර්තමානයේ දී විනාශව තිබූ මෙය ප්‍රතිසංස්කරණයට භාජනය කරන්නට ඇතැයි සිතීමට පුළුවන.

ඇතුළත කොටස හුණු ගලින් සකස් කර ඇති සෙයක් දිස් වුව ද මතු පිටින් ගඩොලින් නිමවා ඇති ස්වරූපයක් දිස් වේ. පීඨයෙහි සම්පූර්ණ උස (යන්ත්‍ර ගලේ සිට) අඩි 06යි අඟල් 04 ක් පමණ වන අතර පොළොව මට්ටමේ සිට අඩි 03යි අඟල් 07ක් පමණ වේ. නමුත් බෙල් මහතා එහි උස වාර්තා කරනු ලබන්නේ අඩි 02 ක් වශයෙනි.[178]

මෙහි යන්ත්‍ර ගල වර්තමානයේ නටබුන් අතුරින් දක්නට ලැබෙන අතර එහි කොටු 18ක් දක්නට ලැබේ. එහි එක් කොටුවක් අඩි 01 යි, අඟල් 08ක් දිග වන අතර, අඩි 01 යි, අඟල් 08ක් පළල වේ. එවගේම අඩි 01යි, අඟල් 06ක් දිග හා පළල කොටු ද දක්නට හැකි ය.

යන්ත්‍ර ගල බුදු පිළිමය සඳහා නිධන් වස්තු තැන්පත් කරන්නට ඇතැයි අනුමාන කළ හැකි ය. අනුරපුර යුගයේ පිළිම

[176] ඡායා ඵලක අංක 05 බලන්න.
[177] A.S.C.A.R. Bell, H.C.P. 1892., 1904, P.04
[178] -DO-

තෙළීම කලාවේ ලක්ෂණ අනුව බුදු පිළිමක් තැන්පත් කිරීමට ප්‍රථම එහි යටින් මෙවන් වූ යන්ත්‍ර ගලක් දක්නට ලැබේ.

බෙල් මහතාගේ වාර්තාවට අනුව මෙම පිළිම ගෙය අසළින් අපූර්ව පළිගු ඇස් දෙකක් හමු වී ඇත.[179] එය නිල් පැහැයෙන් සායම් කර ඇති බවක් ද දිස් වූ බව එතුමා වැඩිදුරටත් සඳහන් කරයි.

අනුරපුර යුගයේ දැනට හමු වී ඇති සාධකවලට අනුව විශාලතම පිළිමගෙය වශයෙන් සැලකෙන මෙය සම්පූර්ණයෙන් ම ගඩොලින් නිම කරන ලද තාප්පයකින් වට කරන ලද්දකි. හමු වී ඇති සාධක වලට අනුව එකී වූ තාප්පය අඩි 01යි, අඟල් 10ක් පළල් වන අතර මෙහි දිග හා පළල අඩි 199× 178ක් වේ. එක් ගඩොල් කැටයක් අඟල් 09ක් දිග වන අතර අඟල් 04ක් පළලවේ.

[179] A.S.C.A.R. Bell, H.C.P. 1892., 1904, P.04





## 4.4උපෝස්ථාගාරය

ජේතවන විහාරයෙහි නටබුන්ව ඇති ප්‍රධාන ගොඩනැගලි අතරට හමු ව ඇති තවත් ගොඩනැගල්ලකි වනුයේ "උපෝසථාගාරය" නමින් හඳුන්වා ඇති ගොඩනැගිල්ල යි. ජේතවන දාගැබට මීටර් 120ක් පමණ දකුණින් පිහිටා ඇත. මෙහි ආරම්භය පිළිබඳ ව ස්ථිර නිගමනයකට මෙතෙක් එළඹ නැති නමුත් "දියසෙත්" උපෝසථාගාරයක් IVවන මහින්ද රජතුමා විසින්, (ක්‍රි.ව. 946 -954) ඉදි කළ බව සඳහන් වේ.[180] සමහරවිට එම "දියසෙත්" උපෝසථාගාරයත් මෙය විය හැකි ය. කෙසේ වෙතත් නූතනයේ දක්නට ලැබෙන නටබුන් ස්වරූප අනුව මෙය ක්‍රි. ව. 7, 8 හෝ 9වන සියවස්වල සකස් කරන්නට ඇතැයි අනුමාන කිරීමට පුළුවන.

මෙහි ප්‍රධාන දොරටුව, දාගැබට මුහුණලා, උතුරු දිසාවෙහි පිහිටා ඇත. එහි දිග අඩි 14යි, අඟල් 05කි. පෝය ගෙට පිවිසීම සඳහා පඩි පේළි 05 ක් දක්නට ලැබේ. එහි එක් පඩි පේළියක පළල අඩි 01යි, අඟල් 04කි. දෙපසින් කොරවක්ගල් ගඩොලින් ම නිර්මාණය කර තිබෙන බවත් පළල අඟල් 11ක් පමණ වේ. මුරගල් තිබුණු බවට සැක කළ හැකි නටබුන් තිබෙන නමුත් එය කෙසේ සකස් කර තිබුණේ ද යන්න නිශ්චය කිරීම උගහට ය. ගොඩනැගිලේ උතුරු පැත්ත අඩි 101යි, අඟල් 03ක් පමණ වේ. පාදමේ සිට අඩි 03යි අඟල් 08ක් උස්ව තිබේ. ඒ තුළ ගඩොල් වරි 16ක් තිබෙන බවත් එම එක් ගඩොල් කැටයක ඝණකම අගල් 02ක් පමණ වේ. අඩි 01ක් දිග වන අතර පළල අඟ 09 ක් පමණ වේ. නැගෙනහිර අඩි 62 යි අඟල් 02 ක් වන

[180] E.Z. Vol.1., 1912, P. 227

අතර එම දිසාවේ ගඩොල් වරි 18ක් ඇත. එහි උස අඩි 04 කි. පළල අඩි 03කි.

උපෝසථාගාරයේ දකුණු පැත්ත අඩි 128 යි, අඟල් 7 ක් පමණ වේ. (ජන්තාගාරය රහිතව) උස අඩි 04 කි. ගඩොල් වරි 18 ක් පමණ වන අතර ඇතැම් ස්ථානවල ගඩොල් වරි 16ක් ද දක්නට ලැබේ.

මෙම ගොඩනැගිල්ලේ ප්‍රධාන දොරටුවට අමතරව, දකුණු පසින් ද ඊට මදක් කුඩා වූ දොරටුවක් පිහිටුවා තිබෙන අතර එහි දිග අඩි 06යි අඟල් 08ක් පමණ වේ. මෙහි පඩි පෙළි 07 ක් දක්නට ලැබෙන අතර එහි පළල අඩි 1යි, අඟල් 03කි. එය ගඩොලින් නිමවා ඇත. දකුණු පස දොරටුවේ සඳකඩ පහණක් නිර්මාණය කර ඇතත්, එය නිර්මානවලින් තොර ය. මෙය සඳකඩ පහණෙහි ආරම්භක අවධිය සිහි ගන්වන්නකි. කොරවක්ගලට පහතින්, එහි දෙපස මුරගල් දෙකක් නිර්මාණය කර ඇතත් එහි නියම ස්වරූපය කුමන ආකාරයෙන් පැවතියේ ද යන්න, ඉතිරි වී ඇති නටබුන් ප්‍රමාණවත් නො වේ.

උපෝසථාගාරයට සම්බන්ධ බටහිර දෙස ජන්තාගාරයක් තිබෙන අතර ඇතැම් විට දකුණුපස දොරටුව එයට ප්‍රවිෂ්ටවීමට තිබෙන දොරටුවක් වශයෙන් ද අනුමාන කල හැකි ය. මෙම ගොඩනැගිල්ලෙහි බටහිර පෙදෙස, අඩි 105 යි අඟල් 09ක් දිග ය. ගඩොල් වරි 18ක් පමණ දනට දක්නට ලැබෙන අතර ඇතැම් ස්ථානවල එය 16, 17 ප්‍රමාණයෙන් ද යුක්ත ය. එහි උස අඩි 04යි අඟල් 02කි. බටහිර දිසාවේ බිත්තියේ පළල අඩි 03යි, අඟල් 05ක් පමණ වේ.

බටහිර දිසාවේ ඉදි කර ඇති ජන්තාඝාරය නිර්මාන ලක්ෂණ අනුව කොටස් දෙකකින් යුක්ත ය. එහි මුල් කොටසේ දිග අඩි 13යි, අඟල් 09ක් පමණ වන අතර පළල අඩි 07කි.





දෙවෙනි කොටසේ දිග අඩි 20යි අඟල් 02කි. පළල අඩි 20කි. මේ තුළ කැඩුණු ගල් කණු 08ක් දක්නට ලැබෙන අතර ගල් කණු තිබුණා යැයි අනුමාන කළ හැකි ස්ථාන 05ක් දක්නට ලැබේ. මෙය ජල ක්‍රීඩා මණ්ඩපයක් වශයෙන් හැඳින් වේ.[181]

ජන්තාඝාරයෙහි දක්නට ලැබෙන ගල් කණුවලට අමතරව උපෝසථාගාරයෙහි ගල් කණු 178ක් තිබෙන අතර, එහි ද ගල් කණු තිබුණා යැයි සිතිය හැකි ස්ථාන 06 ක නෂ්ටාවශේෂ ඇත. මෙම ගල් කනු එකිනෙක දිග හා පළල සමාන නො වෙතත් එහි සාමාන්‍ය දිග පළල අඩි 2 × 2ක් පමණ වේ. එවගේම මෙම ගල් කණු බොහෝ සෙයින් එකිනෙකට සමාන දුරින් පිහිටා තිබෙන සෙයක් දක්නට ලැබේ. තට්ටු කිපයක් නිර්මානය කිරීම උදෙසා මෙය උපයෝගි කරගන්නට ඇතැයි සිතිමට පුළුවන.

ජේතවන විහාර සංකීර්ණයේ පිහිටා තිබෙන මෙම උපෝසථාගාරය තුළ අඩි ශිල අභිෂේකය හා ප්‍රව්‍රජ්‍යා අභිෂේකය ද සිදු කරන්නට ඇතැයි අනුමාන කිරීමට පුරා විද්‍යාත්මක සාධක හමු වී ඇත.

මෙම ගොඩනැගිල්ලට සමාන ගොඩනැගිල්ලක් අභයගිරි විහාරයෙන් ද සොයා ගෙන ඇත. එය අභයගිරි විහාරයට උතුරින් ඇති පොකුණට යාබදව පිහිටා තිබේ. මෙම පොකුණත් ගොඩනැගිල්ලත් අතර අන්‍යෝන්‍ය වූ සම්බන්ධයක් පෙන්නුම් කරයි. එවගේම මෙම ගොඩනැගිල්ලේ ඉදිරිපසින් හා දෙපැත්තෙන් නිමවා ඇති ගල් කණු පොකුණ වෙත යොමු කර ඇති බවත් දක්නට ලැබේ. ගොඩනැගිල්ලේ වේදි සහිත කාමරවල ජලය සහිත භාජන තැන්පත් කිරීම සඳහා පාවිච්චි කළ ඒවා ලෙස සඳහන් කළ හැකි ය. ජලය පිටගල් පොකුණට

[181] Ratnayake, Hema., " JETAWANAYA" T.C.T.S.L., 1993, P.70-P.69

බැස යාමට ඉඩ හැර ඇත. මෙම ගොඩනැගිල්ල අනිවාර්යයෙන් ම අභිෂේක මණ්ඩපයක් වූවාට කිසිදු සැකයක් නැත.

ජේතවන විහාර සංකීර්ණයේ පිහිටා ඇති උපෝසථාගාරය ද, මෙම ගොඩනැගිල්ලට ම සමාන යැයි සඳහන් කිරීමට පුළුවන. මෙහි නිර්මානය කර ඇති ජන්තාඝාරය, ජල ක්‍රීඩා මණ්ඩපයක් වශයෙන් හැඳින්වූවත්. එය කිසියම් වූ පූජනීය කටයුත්තක් සඳහා යොදා ගත් ගොඩනැගිල්ලක් වශයෙන් අනුමාන කිරීමට පුළුවන. විශේෂයෙන් ම සසුනේ ඇති, ඉතාම උත්තුංග පූජනීය ගොඩනැගිලි අතර ජන්තාඝාර ගොඩනැගිල්ලක් තිබිය යුතු නොවේ. එසේ තිබේ නම් ජලය ලැබිය යුතු පොකුණක් හෝ වෙනයම් ස්ථානයක අපිරිසිදු ජලය බැස යාමට උචිත පසුබිමක් තිබිය යුතු ය. නමුත් එවන් පරිසරයක් එහි නොමැති බව එම ව්‍යාපෘතියේ කැණීම් පරීක්ෂක ස්වාමීන් වහන්සේ සමඟ පැවති සාකච්ඡාවේ දී අනාවරණය විය. එහි ජන්තාගාරයක් ඉදි කිරීමට තරම් සුදුසු තත්ත්වයක් ද නො පවතී. මෙය ජන්තාඝාරයක් නම්, ඒ අවට සංඝවාස තිබිය යුතු ය. එහි වූ සංඝාවාස ද පිහිටා තිබෙන්නේ ඊට බොහෝ ඈත ය.

මෙම ජන්තාඝාරය සහිත ගොඩනැගිල්ල කිසියම් වූ පූජනීය කටයුත්තක් සඳහා යොදා ගත්තක් යැයි අනුමානයෙන් සඳහන් කිරීමට පුළුවන. විශේෂයෙන් ම පෝය කර්ම සඳහා ජලය අවශ්‍ය ය. ඒ සඳහා ජලයේ උපයෝගීතාව පූර්ව කෘත්‍යය නමින් හැඳින් වේ.

**" සම්මජ්ජනි පිදිපොච - උදකං ආසනෙන්ච "**

යනුවෙන් විනය පිටකයේ සඳහන් වේ. පෝය කර්ම කිරීමට මත්තෙන් පැන් කෙණ්ඩියක් යොදා ගැනීම විනය





ප්‍රඥප්තියක් වුව ද එයට විශාල ජල ප්‍රමාණයක් අවශ්‍ය නො වේ. එසේ නම් මෙම ගොඩනැගිල්ලේ ජලය කුමක් සඳහා භාවිත කරන්නට ඇත් ද? මෙම ගොඩනැගිල්ල තුළ අධි ශීල අභිෂේකය හා ප්‍රව්‍රජ්‍යයා අභිෂේකය සිදු කරන්න ට ඇතැයි අනුමාන කළ හැකි බව පැවති සාකච්ඡාවේදී සඳහන් විය. මැද මිදුලක් සහිත ආයක චතුරශ්‍රාකාර මෙම ගොඩනැගිල්ලේහි ජලය පිටව යන්නේ අසළ ඇති ළිඳකට ය. එසේ ම එම ජලය පැගීමට ඉඩ සලස්වා නොමැත. එසේ නම් මෙම ගොඩනැගිල්ල ඉහත සඳහන් පූජනීය කටයුතු සඳහා යොදා ගන්නට ඇතැයි අනුමාන කිරීමට පුළුවන.

විනය කර්ම සිදු කරන්නේ පෝය සීමා මාලකයක් තුළ ය. විනය කර්ම සිදු කිරීමට උචිත හා යොදා ගනු ලබන එම ස්ථානය පෝය සීමාව යි. විශේෂයෙන් ම පැවිදි කිරීමේ දී කුල කුමරකු හිස බූගා නැවීම සිදු කරනු ලබයි. කහ ආදී අමුද්‍රව්‍ය ශරීරය තුළ තවරා සිවුරු දැරීමට මත්තෙන් නැවීම ආගමික පවිත්‍රත්වය සංකේතවත් කරන්නක් සේ ම එය භෞතික මෙන්ම විද්‍යාත්මක පදනමක් මත සිදු කරනු ලබන්නකි. මෙම අභිෂේක ගොඩනැගිල්ල අසල අමුද්‍රව්‍ය අඹරා ගැනීම සඳහා උපයෝගී කරගත් ඇඹරුම් ගලක් තිබී ඇත. එයට අමතරව, වතුර භාජන තබා ගැනීමට, ගලින් ම නිර්මානය කරන ලද ආධාරක වළලු දෙකක් ද නටබුන්ව ඇත. ඒවා ජලය සහිත භාජන තැන්පත් කිරීමට යොදා ගත් ඒවා බව සඳහන් කළ හැකි ය. මෙම ගොඩනැගිල්ල තුළ උපසම්පදා හා පැවිදි කිරීමේ විනය කර්ම දෙකම සිදු කරන්නට ඇතැයි සඳහන් කළ හැකි ය.

වෙනත් ස්ථානයන්හි පුරා විද්‍යාත්මක හා ඓතිහාසික සාධකවලට අනුව ලැබෙන නිගමනයන්ට පටහැනි භූගෝලීය

CS CamScanner

වශයෙන් පිහිටා තිබීම හා අවට විද්‍යාමාන පුරාවිද්‍යාත්මක සාධකවලට අනුව මෙම ගොඩනැගිල්ල තුළ උපසම්පදා හා ප්‍රව්‍රජ්‍යා අභිෂේක සිදු කරන්නට ඇතැයි අනුමාන කළ හැකි ය.

## 4.5දාන ශාලාව

ජේතවන දාගැබට මුහුණලා ගිණිකොණ දිසාවෙහි පිහිටි මෙය දූනට හමුව ඇත. ජේතවන විහාරයට සම්බන්ධ එකම දාන ශාලාව මෙය වේ. මෙම ගොඩනැගිල්ල මහසෙන් රජ සමයේ දී ආරම්භ කරන්නට ඇතැයි අනුමාන කළ හැකි අතර පසුකාලීනව ජේතවන විහාරයට පක්ෂපාතිත්වය දක් වූ රජවරුන් විසින් මෙය විශාල කරන්නට ඇතැයි සඳහන් කිරීමට පුළුවන. වර්තමානයේ දක්නට ලැබෙන අන්දමට මෙය ක්‍රි.ව. 7 හෝ 8 වන සියවස්වල ඉදිකරන්නට ඇතැයි අනුමාන කළ හැකි ය.

අඩි 114ක් දිග හා අඩි 88ක් පළල වන මෙම ගොඩනැගල්ලෙහි ප්‍රධාන දොරටුවට අමතරව එයට දෙපසින් තවත් දොරටු දෙකක් පිහිටුවා ඇත. බටහිර දෙසට මුහුණලා ඇති ප්‍රධාන දොරටුව අඩි06 ක් පමණ දිග ය. අයත් වනුයේ පඩි පේළි දෙකක් පමණි. එය අඩි 01යි, අඟල් 02 ක් පමණ පළල ය. එවගේම නිර්මාන රහිත සඳකඩ පහණක් ද දක්නට ලැබේ.

ප්‍රධාන දොරටුවට වම පසින් පිහිටුවා ඇති දොරටුව අඩි 03යි, අඟල් 11ක් දිග ය. එහි ද පඩි පේළි දෙකක් නිර්මානය කර ඇත. එක් පඩි පෙළක පළල අඩි 01යි, අඟල් 02කි. මෙම දොරටවට ද නිර්මාන රහිත සඳකඩ පහණක් යොදා ඇති බව දූක ගැනීමට පුළුවන.





දකුණුපස ඇති දොරටුව ද අඩි 04යි, අඟල් 07ක් දිග වන අතර නටබුන්ව ඇත්තේ එක් පඩි පෙලක් පමණි. එය අඩි 01යි, අඟල් 06ක් පළල ය.

මෙම දොරටුව නිර්මානය කර ඇති ආකාරය අනුව එළැඹිය හැකි වනුයේ ප්‍රධාන දොරටුවෙන් ඇතුල්වීම හා එයට දෙපසින් ඇති දොරටු දෙකින් පිටවීම සිදු වූ බවයි. දාන ශාලාවෙහි මැද ශාලාව වශයෙන් හැඳින්වෙන කොටස අඩි 58 යි, අඟල් 9 1/2 දිග වේ. පළල අඩි 36යි, අඟල් 02 කි. මෙහි සම්පූර්ණයෙන් ම ගල් අතුරා ආවරණය කොට ඇත. එමෙන් ම මෙම ශාලාව වටා, ලීවලින් හෝ ගල්වලින් සකස් කරන ලදයි සැලෙකෙන වැටක් යැයි සැලකිය හැකි, කණුවල සලකුණු 89ක් දක්නට ලැබේ. එහි එකිනෙක කණුවක් අතර දුර අඩි 01කි. එක වලක වර්ගඵලය අඟල් 04ක් පමණ වේ. මෙයින් සැළකිය හැකි වනුයේ, මැද ශාලාව වටා ගරාදි වැටක් තිබෙන්නට ඇති බවත්, මෙහි වළවල් වල ස්වරූපය අනුව එය එතරම් උසට නිර්මානය කර නො මැති බවත් ය.

මැද ශාලාව වටා කෙටි කණුවලට අමතරව අඩි 01ක් පමණ වර්ග ඵලය ඇති ගල් කණු 13ක් නටබුන්ව ඇත. ගල් කණු තිබුණා යැයි සැලකිය හැකි තවත් ස්ථාන 07ක සලකුණු ද දක්නට ලැබේ. මෙම ගල් කණු ගොඩනැගිල්ලේ ශක්තිය රඳා පැවැත්වීමට යොදන්නට ඇතැයි සැළකිය හැකි අතර සමහරවිට ජේතවන විහාර සංකීර්ණයේ දූනට හමුව ඇති එකම දාන ශාලාව මෙය වන බැවින් මහල් කීපයකට ගලින් හෝ ලීයෙන් ගොඩනගන්නට ඇතැයි ද ඒ සඳහා මෙම ගල් කණු උපයෝගී කර ගන්නට ඇතැයි ද අනුමාන කිරීමට පුළුවන.

දාන ශාලාවේ නැගෙනහිර දිසාවේ මැද ශාලාවේ සිට දිවෙන අඩි 26යි අඟල් 10ක් දිග, අඟල් 11ක් පමණ පළල කාණුවක් ඉදි කර ඇත. සමහරවිට මැද ශාලාව සෝදන්නට ඇති අතර එසේ සෝදා දැමීම නිසා එකී වූ අපිරිසිදු ජලය පිට කිරීම සඳහා තනන්නට ඇතැයි සැලකිය හැකි ය. දාන ශාලාවේ ප්‍රධාන මායිමේ සිට මෙම මැද ශාලාව ඉදි කර ඇත්තේ උතුරු දිසාවේ අඩි 21යි අඟලේ 65ක් ද, දකුණු දිසාවේ අඩි 25යි, අඟල් 07ක් ද, නැගෙනහිර දිසාවේ අඩි 24යි, අඟල් 3ක් ද බටහිර දිසාවේ අඩි 26ක් ද වන පරිද්දෙන් භූමි ප්‍රදේශයේ අතහැර ඒ මැද ය. ප්‍රධාන දොරටුවට වම් පස පාදෝවනය කළා යැයි නිගමනය කළ හැකි පාදෝනි ගලක් දක්නට ලැබේ.

මෙම දාන ශාලාවට අඩි 36 ක් දිග හා අඩි 05ක් පළල, අඩි 02යි අඟල් 05ක් ගැඹුර, ගලින් නිම කරන ලද ඔරුවක්[182] හා අඩි 08යි අඟල් 04ක් දිග, අඩි 03ක් පළල අඩි 01යි අඟල් 03ක් පමණ ගැඹුර තවත් ඔරුවක් ද දක්නට ලැබේ.

මෙම ගල් ඔරු පිත්තලවලින් හෝ ඇලුමිනියම්වලින් සකස් කරන ලද ආවරණයකින් ආවරණය කරන්නට ඇතැයි අනුමාන කළ හැකි ය. එසේම, කුඩා ඔරුවක් දැමීම සඳහාත්. විශාල ඔරුව, තහඩුවලින් ම කාමර කිපයකට බෙදා, එම එකිනෙක කාමර තුළ ව්‍යඤ්ජන දැමීමට සකස් කරන්නට ඇතැයි ද අනුමානයෙන් සඳහන් කළ හැකි ය.

මැද ශාලාවේ සිට ගල් ඔරු පිහිටුවා තිබෙන ස්ථානයට පිවිසීමට නැගෙනහිර දිසාවේ දොරටුවක් ඉදි කර තිබෙන අතර එම දොරටුවට අඩි 09යි, අඟල් 08ක් පමණ දිග ය. මේ තුළ ලීවලින් හෝ ගල්වලින් උළුවහු තනන්නට ඇතැයි සිතිය හැකි ය.

182 ඡායා ඵලක අංක 10 බලන්න.



ඒ වගේ ම මැද ශාලාවට උතුරින් දාන ශාලාව සීමාව තුළ ම ගල් කණු 46ක් ද, දකුණින් ගල් කණු 23ක් ද, නැගෙනහිරින් 28ක් ද ල බටහිරින් ගල් කණු 08ක් ද දක්නට ලැබෙන අතර මෙසේ සතර දිසාවන්හි ගල් කණු ඉදි කිරිමෙන් මෙම ගොඩනැගිල්ල මහල් කරන්නට ඇතැයි අනුමාන කළ හැකි ය.

ජේතවන විහාරයේ දාන ශාලාවට දකුණින්, එයට යාබදව අඩි 30 × 15 ප්‍රමාණයේ කළු ගලින් නිම කරන ලද ගොඩනැගිල්ලක නටබුන් දක්නට ලැබේ. මෙම සීමාව තුළ ම අඩි 04යි, අඟල් 11 ක් පමණ පළල කළුගලින් ම නිම කරන ලද බේසමක් යැයි සිතිය හැකි අංගයක් දක්නට ඇත. මෙය පිහිටා තිබෙනුයේ මෙම සීමාවේ උතුරට අඩි 21ක් ද දකුණට අඩි 11 යි අඟල් 5ක් ද නැගෙනහිරට අඩි 11යි අඟල් 05ක්ද බටහිරට අඩි 04යි, අඟලේ 09ක් ද වන සේ ය. මෙම බේසමින් නික්මෙන පරිදි අඩි 15යි, අඟල් 03ක් දිග අඟල් 07ක් පමණ පළල කාණුවක් ඇත.

මෙම ගොඩනැගිල්ල හා එහි අභ්‍යන්තරයේ ඇති පුරා විද්‍යාත්මක සාධකත් ඊට උතුරින් පිහිටා ඇති දාන ශාලාවත් අනුව දාන ශාලාව තුළ පරිහරණය කරන ලද භාජන සේදීම මේ තුළ සිදු කළා යැයි දැක්වීමට හැකි ය. විශේෂයෙන් ම දාන ශාලාව තුළ තිබෙන මැද ශාලාවෙන් නික්මෙන ජලය පිටවීම සඳහා කාණුවක් ඇති අතර මෙම ගොඩනැගිල්ලෙන් පිටවෙන කාණුව තුළින් ද එකී වූ භාජන සේදීමේ දී නික්මෙන අපිරිසිදු ජලය පිට කිරීම සඳහා නිර්මාණය කරන්නට ඇතැයි අනුමාන වශයෙන් සඳහන් කිරීමට පුළුවන.

මෙයට ඇතුල්වීමට එක් දොරටුවක් පමණක් පිහිටා තිබෙන්නට ඇතැයි නිගමනය කිරීමට සාධක තිබේ. එය දකුණු පසින් පිහිටා ඇත. අඩි 05 යි, අඟල් 06ක් පමණ දිග වන මෙම

දොරටුව පඩි පේළි දෙකකින් සමන්විත ය. එය ද කළුගලින් ම නිමවා තිබෙනු පෙනේ. ජේතවන විහාර සංකීර්ණය තුළ භික්ෂූන් වහන්සේලා 200ක් පමණ වැඩ සිට ඇත. මෙම සංකීර්ණය තුළින් දනට හමුව ඇති එකම දාන ශාලාව ද මෙය වේ. දනට තිබෙන සාධකවලට අනුව දානශාලාව භික්ෂූන් වහන්සේලා දානය වැළඳූ ස්ථානයක් වශයෙන් සඳහන් කිරීමට අවකාශ නැත. මන්ද ඒ තරම් භික්ෂූන් වහන්සේලාට එකවර වැඩ සිටීමට හැකි ඉඩ පහසුකම් එහි නොමැති නිසා ය. එසේ නම්, ජේතවන විහාරීය භික්ෂූන් වහන්සේලා මෙම ස්ථානයට පැමිණ, දානය ලබාගෙන තමතමන්ගේ පංචාවාස ගොඩනැගිලි තුළට ගොස් දානය වළඳන්නට ඇතැයි අනුමානයෙන් දක්වීමට පුළුවන.

## 4.6පංචාවාස ගොඩනැගිලි

ජේතවන විහාර සංකීර්ණයේ විශේෂත්වය නිහඬව කියාපාන කැඩපතක් වනුයේ එහි වාස්තු විද්‍යාව යි. ලෝක ආගමික සංස්කෘතියට නැකම් කියනුයේ අපගේ අහස පරයන චෛත්‍යයන් ම පමණක් නොව මෙහි වූ ගොඩනැගිලි නිර්මාන ලක්ෂණයන් ද ඒ අතර ප්‍රධාන ය. බුදු දහම මුල් බැස ගැනීමෙන් අනතුරුව බෞද්ධ සංඝාරාම පැරණි යුගයේ, ප්‍රධාන කොටස් දෙකකින් යුක්තව පැවත ඇත. එනම්,

- උද්‍යාන සංඝරාම
- ගිරි සංඝරාම යනුවෙනි[183]

[183] බස්නායක, එච්.ටී. "පැරණි බෞද්ධ සංඝරාම" ඇස්.ජී. සමරසිංහ ආදිහු, 1983. 17 කළාපය, සඟරාව, පි.83





ජේතවන විහාරයේ භික්ෂූන් වහන්සේලාගේ ආරාම හැඳින්වෙන්නේ, "පංචාවාස" යනුවෙනි. මෙම ගොඩනැගිලි උද්‍යාන සංඝාරාමවලට අයත් වේ අනුරපුර යුගයේ හා පොළොන්නරු යුගවල ඉදි වූ සංඝාරාමවලින් සුවිශේෂ ම සංඝාරාමය මෙය යි.

වචනයේ අර්ථයෙන් ම පැහැදිලි වන පරිදි නියම කරනු ලැබූ මායිම් ඇතුළත පිහිටි මෙම පංචාවාස ගොඩනැගිලි සමූහය ගොඩනැගිලි පහකින් සමන්විත ය. එනම් මධ්‍ය වූ ආවාසය ඇතුළු සතර දිසාවන්හි මාධ්‍ය ආවාසයට මුහුණලා ඉදි වූ මෙය සැලසුම් වී තිබෙන අතර, එහි දනට සොයා ගෙන ඇති අන්දමට පංචාවාස ගොඩනැගිලි 15ක් පමණ තිබේ. මේ අතර, ගොඩනැගිලි 4,3,2 ප්‍රමාණයෙන් ද දක්නට ලැබේ. තෝරාගත් පංචාවාස ගොඩනැගල්ලි අඩි 155 × 153 ප්‍රමාණයේ තාප්පයකින් වට වූ බිම් ප්‍රමාණයක් ඇතුළත පිහිටා ඇත.

මෙම ගොඩනැගිල්ලේ ප්‍රධාන පංචාවාස ගොඩනැගිල්ල උතුරු මායිම් තාප්පයේ සිට අඩි 49 යි අඟල් 04ක් ද, දකුණු මායිම් තාප්පයේ සිට අඩි 49යි අඟල් 09ක් ද, බටහිර මායිම් තාප්පයේ සිට අඩි 56යි අඟල් 04ක් ද, වන පරිද්දෙන් නිර්මානය කර ඇත. මෙය අඩි 37යි අඟල් 04ක් ද, වන අතර අඩි 45යි, අඟල් 04ක් පළල වේ. ප්‍රධාන දොරටුව අඩි 06යි අඟල් 02ක් පමණ වේ. පඩි පේළි 05ක් දක්නට ලැබෙන අතර එම පඩි පේළි පහ අඩි 01යි අඟල් 03ක් පමණ පළ ය. වර්තමානයේ නටබුන්ව ඇති පරිදි එහි දෙපස මුරගල් දෙකකි. නමුත් ඒවා නිර්මානවලින් තොර ය. එමෙන් ම ප්‍රධාන දාරටුව දෙපස කොරවක් ගල් නටබුන් තිබෙන අතර එය රේඛාමය ස්වරූපයකින් දිස් වේ.

එහි දැනට නටබුන්ව ඇති උස ප්‍රමාණය අඩි 03යි අඟල් 06කි. ගඩොල් වරින් 17ක්, ඒ තුළ අන්තර්ගත ය. පළල අඩි 01යි අඟල් 03ක් වේ. (මුදුන) නමුත් එය සියලු ම ස්ථානවල පළල හා සමාන නොවේ. මෙම ප්‍රධාන සංඝාවාස ගොඩනැගිල්ල වටා කැඩුණු ගල් කණු 03ක් දක්නට ලැබෙන අතර එය උතුරු පැත්තේ 02ක් හා දකුණු පස එකක් වශයෙනි. ඇතුළත කැඩුණු ගල් කණු 06ක් ඇත.

මෙම ගොඩනැගිල්ලේ අභ්‍යන්තරයේ බටහිර දිසාවේ අඩි 06යි, අඟල් 09ක් දිග හා අඩි 09 යි, අඟල් 05ක් පළල ප්‍රමාණයේ චතුරශ්‍රයේ දක්නට ලැබේ. එය කළුගලින් සකස් කර ඇත. සම්පූර්ණයෙන් ම කළුගලින් තැනූ අඩි 02යි අඟල් 02ක් දිග හා අඩි 02යි අඟල් 02ක් පළල ප්‍රමාණයේ චතුරශ්‍රයක් වශයෙන් සඳහන් කළ හැකි ය. කොටු 25ක් දක්නට ලැබෙන අතර මෙය නිධන් වස්තු තැන්පත් කිරීමට උපයෝගී කර ගන්නට ඇතැයි අනුමාන කළ හැකි ය. එවගේම මෙහි ලක්ෂණ අනුව මේ තුළ බුදු පිළිමයක් තැන්පත් කරන්නට ඇතැයි ද සිතීමට අවකාශ තිබේ. පංචාවාස ගොඩනැගිලි එහි සාමාන්‍ය ස්වරූපය අනුව ප්‍රමාණයෙන් විවිධාකාර ය. යම් නිශ්චිත අංග ලක්ෂණවලින් යුතු මධ්‍යම ප්‍රසාදයකින් යුත් මෙම ගොඩනැගිල්ලට කොන් හතරට මදක් ඈතින් කුඩා කුටි හතරක් ද නිර්මානය කර ඇත. ඒ අනුව ප්‍රධාන ගොඩනැගිල්ලට ඊසාන දිගින් පිහිටා ඇති ගොඩනැගිල්ල[184] අඩි 24යි, අඟල් 10ක් දිග වන අතර පළල අඩි 25කි. එහි නටබුන්ව ඇති ස්ථානයෙහි පළල අඩි 01යි අඟල් 07කි. මෙහි උස අඩි 2යි, අඟල් 09කි. ගඩොල් වරි 14ක් ඒ තුළ අන්තර්ගත ය.

ඊසාන දිග පිහිටි මෙම ගොඩනැගිල්ලට එක් ප්‍රධාන දොරටුවක් පමණක් දක්නට ලැබෙන අතර එය දකුණට

[184]ඡායා ඵලක අංක 10 බලන්න.





මුහුණලා පිහිටා තිබේ. එම දොරටුවේ දිග, අඩි 4යි, අඟල් 02ක් පමණ වේ. කළුගලින් නිමවා ඇති මෙම දොරටුවේ පඩි පේළි 05 ක් දක්නට ලැබෙන අතර එහි පළල අඟල් 11කි. පඩි පෙළ අභියස සඳකඩ පහණක් නිර්මානය කර ඇති නමුත් එය නිර්මානවලින් තොර ය. මෙහි නැගෙනහිර මුරගල පමණක් ඉතිරිව තිබේ. එය ද නිර්මානවලින් තොර ය. කොරවක්ගල රේඛාමය ස්වරූපයක් දරයි. ඊසාන දිග පිහිටි මෙම කුඩා කුටිය මධ්‍යයේ ගල් කණු 03ක් තිබුණු බවට සාධක ලැබේ.

මෙම ගොඩනැගිල්ලේ වහල තනන්නට ඇත්තේ මෙම ගල් කණු මත විය යුතු ය. එසේ නො වන්නේ නම් මෙය මහල් කීපයකට තිබෙන්නට ඇති බවත් අනුමාන වශයෙන් සඳහන් කිරීමට පුළුවන.

ප්‍රධාන ගොඩනැගිල්ලට වයඹ දෙස පිහිටා ඇති කුටිය අඩි 24යි අඟල් 08ක් දිග වන අතර එහි පළල අඩි 24යි අඟල් 09ක පමණ වේ. මෙහි ප්‍රධාන දොරටුව දකුණු දෙසට මුහුණලා පිහිටා තිබේ. එහි දිග අඩි 04යි අඟල් 1 1/2 ක් පමණ ය. පඩි පේළි 04ක් නිර්මානය කර තිබෙන බව දක්නට ලැබේ. එහි එක් පඩි පෙළක් අඟල් 09 ක් පළල ය. මෙම ගොඩනැගිල්ල දෙපස නටබුන් වූ කොරවක් ගල් දෙකක් දක්නට ලැබෙන නමුත් එහි මුරගල් දක්නට නො ලැබේ. මුරගල් තිබුණු බවට සාධක ඇත.

පංචාවාස ගොඩනැගිල්ලේ ගිණිකොණ දිග පිහිටි කුඩා ගොඩනැගිල්ල [185] අනෙක් ගොඩනැගිලිල මෙන් ඒක ප්‍රධාන දොරටුවකින් සමන්විත ය. මෙය අඩි 24යි අඟල් 08ක් දිග වන අතර අඩි 24 යි, අඟල් 08ක් පළල වේ. මෙහි නටබුන්ව ඇති

[185] ඡායා ඵලක අංක 11 බලන්න.

ස්ථානය තෙක් උස අඩි 02යි, අඟල් 03ක් වේ. එහි ගඩොල් වරි 11කි.

මෙම ගොඩනැගිල්ලට පිවිසීමට ඉදි කොට ඇත්තේ ගඩොලින් තැනූ පඩි පෙළකි. එහි පඩි පේළි 05ක් දක්නට ලැබෙන අතර එහි දිග අඩි 4යි, අඟල් 04 ක් පමණ වේ. එක් පඩි පෙළක පළල අඩි 01යි අඟල් 06 ක් පමණ වේ. මෙහි මුරගල් දෙකක් දක්නට ලැබෙන නමුත්, ඒවා නිර්මාණවලින් තොර ය. මෙය ඉදිරිපස සඳකඩ පහණක නටබුන් දක්නට ලැබෙන නමුත්, එය ද නිර්මාණවලින් තොර ය.

නිරිතදිග පිහිටි ගොඩනැගිල්ල ද ඊසාන, වයඹ හා ගිණිකොණ දිගි පිහිටි ගොඩනැගිලිවලට බෙහෙවින් සමාන ය. මෙය ද අඩි 24 යි අඟල් 11ක් දිග වන අතර, එම ප්‍රමාණයම පළල ද වේ. මෙහි උස අඩි 02යි, අඟල් 09ක් පමණ ය. ගඩොල් වරි 13 කි. ප්‍රධාන දොරටුව උතුරු දිසාවට මුහුණලා තනා ඇත. එම දොරටුව අඩි 04යි අඟල් 04ක් දිග වේ. එක් පඩි පේළියක පළල අඟල් 10කි. මෙහි ද දෙපස මුරගල් දක්නට නො ලැබුණත් මුරගල් තිබුණු බවට සාධක ලැබේ. ඒවා ද හමුව ඇති මුරගල් මෙන් නිර්මාණවලින් තොරව තිබෙන්නට ඇතැයි අනුමාන කළ හැකි ය. එමෙන් ම මෙහි නිර්මිත කොරවක් ගල හා සඳකඩ පහණ ද නිර්මාණවලින් තොරවූ ඒවා ය.

මෙම පංචාවාස ගොඩනැගිල්ලට ප්‍රවිෂ්ටවීමට නිර්මානය කර ඇති ප්‍රමුඛය අඩි 20යි, අඟල් 04 ක් වන අතර, එහි පළල අඩි 15 යි, අඟල් 08කි. එය පොළොව මට්ටමෙ සිට අඩි 02යි, අඟල් 05 ක් උස වේ. ගඩොල් වරි 13 කි. මෙම ගොඩනැගිල්ලේ නැගෙනහිරට හා බටහිරට පඩි පේළි 05 බැගින් දක්නට ලැබේ. එහි දිග අඩි 05 යි, අඟල් 02කි.





නූතනයේ භික්ෂූන් වහන්සේලාගේ ආග්‍රමික නිවාස ලෙස සැළකෙන, මෙම පංචාවාස ගොඩනැගිලි තුළ භෝජන ශාලා, නාන කාමර, පොකුණු ආදී උපයෝගී ගොඩනැගිලි ගණනාවකින් ද, ඇතැම් විට තමන්ගේ පූජාවන් පැවැත්වීම සඳහා පූජාසනයන් ද ඉදි කරගන්නට ඇතැයි අනුමාන කළ හැකි ය.

විශේෂයෙන් ම ජේතවන විහාර සංකීර්ණයේ ඇති පංචාවාස ගොඩනැගිලි පිළිබඳ ව අධ්‍යයනය කරන විට ඇතැම් ගොඩනැගිලි නිර්මානශීලීත්වයෙන් ඉතාමත් අනූන වූ ස්වරූපයක් ගනී.[186] එමෙන් ම ඒවා ප්‍රමාණයෙන් ද විශාල ය. සමහරවිට එම ගොඩනැගලි මෙම විහාරයේ මහානායක හිමිවරුන්ගේ ආවාසයන් විය හැකි ය.

මහායාන සංකල්පය අනුව පංච ධ්‍යානි බුදුවරු සංකල්පය අනුව මෙම ගොඩනැගිලි පංචවාස තත්ත්වයට පත්වූවා ද යන්න සැක සහිත ය.

## 4.7බෞද්ධ ගරාදි වැට.

ජේතවන දාගැබට දකුණු දෙසින් මීටර් 100 ක් පමණ ඈතින් පිහිටි මෙය නූතන පුරා විදුවත් විසින් "පිළිමගෙය/ බෝධිඝරය" වශයෙන් නම් කර ඇත. සාංචි භාරුත් චෛත්‍යයන් වටා දිවෙන වැටක් ආකාරයෙන් තනා ඇති මෙය අනුරාධපුරය ආක්‍රමණය කළණී සොළීන් විසින් විනාශකරන්නට ඇතැයි එච්.සී.පී බෙල් මහතා සඳහන් කරයි.[187]

බෙල් මහතා විසින් 1892 දී පමණ මේ පිළිබඳව කැණීම් කිරීමේ දී මෙහි බාහිර මායිම් නො කඩවා සොයා ගැනීමට හැකි වූ බව සඳහන් කරන අතර එහි ගරාදි වැට වර්තමානයේ

[186] ජායා ඵලක අංක 12 බලන්න.
[187] A.S.C.A.R. Bell, H.C.P. 1892., 1904, P.05

ද එසේම පවතින බව දැක ගැනීමට පුළුවන.[188] නූතනයේ දක්නට හැකි වනුයේ බෞද්ධ ගරාදි වැටේ ප්‍රධාන දොරටුවත්, එහි මත භේදයට තුඩුදුන් බෝධි සරයක් ද පිළිමගෙයක් ද යන්න කොටස පමණි.

වර්තමානයේ දක්නට ලැබෙන අන්දමට මෙම ආයත දීර්ඝ චතුරශ්‍රය නැගෙනහිර සිට බටහිර දිසාව තෙක් අඩි 105 ක් පමණ වන අතර මෙය ගලින් ම නිම කරන්නට ඇත. උතුරු දිසාවේ සිට දකුණට අඩි 80ක් පමණ තිබේ.

බෞද්ධ ගරාදි වැටේ ප්‍රධාන ගල් වැට අඩි 03යි අඟල් 10ක් පමණ උස ය. මෙය ප්‍රධාන කොටස් 03 කින් යුක්ත ය.

I. කුළුණු පදනම
II. සිටුවන ලද කණු
III. ප්‍රාකාර ශීර්ෂය. වශයෙනි.[189]

තිරස් අතරට වැටුණු වැට වශයෙන් සැලකෙන මෙය මනාව සකස් කරන ලද පදනමක් මත සකස් කරන ලද බව අනුමාන කළ හැකි ය. එච්.සී. පී. බෙල් මහතාගේ වාර්තාවේ සඳහන් වන අන්දමට ඉතාමත් අලංකාරව තනන ලද ගරාදි වැට අඩි 02 යි, අඟල් 04 ක් පමණ ඉදිරියට නෙරා සිටි[190] මෙහි විශේෂත්වය වනුයේ නිර්මාණවලින් තොර වීම ය.[191]

මෙම ගරාදි වැටට අමතරව ඇතුළතින් වැටකින් වට කරන ලද කොටුවක නටබුන් දක්නට ලැබෙන අතර එයට සතර දිගින් පිවිසීමට පඩි පේළි තනා ඇති බවට සාධක ලැබේ. මෙහි ස්ථාපිත කරන ලද නැගෙනහිර හා බටහිර ද්වාර මාර්ග කේන්ද්‍ර

[188] ඡායා ඵලක අංක 13 බලන්න.
[189] A.S.C.A.R. Bell, H.C.P. 1892., 1904, P.05
[190] -DO-
[191] ඡායා ඵලක අංක 13 බලන්න.





කොටගෙන ඇති අතර උතුරු සහ දකුණු බටහිර ද්වාර මාර්ගයට සමදුරින් පිහිටා තිබේ. මෙම ගරාදි වැටේ කේන්ද්‍රස්ථානයේ සිට උතුරු දකුණු බටහිර සමදුරින් පිහිටා ඇත. නැගෙනහිර මදක් වෙනස්ව දක්නට ලැබේ. ගරාදි වැටේ උතුරේ සහ දකුණේ වැට මදක් නැගෙනහිරට මුහුණලා තිබෙන්නට ඇති බවත් එය ඉදිරි දෙසට නෙරා ගිය ස්වරූපයක් දිස් වන බව බෙල් මහතා සඳහන් කරනු ලබයි.[192]

අඩි 105ක් දිග හා අඩි 80ක් පළල සමචතුරශ්‍රය වටා අඩි 12යි අඟල් 06ක් පමණ පඩි පේළි සහිත සක්මන් මළුවක් පිහිටා තිබෙන බව දක්නට ලැබේ. මෙම චතුරාශ්‍රයෙහි සතර පැත්තෙහි ම එයට ගොඩවීම සඳහා පඩි පේළි පිහිටා ඇත. එහි පතුලෙහි ම එනම් ගරාදි වැටෙහි ආරම්භය පිටතින් හුණු ගල් බදාම තට්ටුවක් දක්නට ලැබෙන අතර එය අලියෙකුගේ හිසක් නෙළුම් මලක් නැවතත් අලියෙකුගේ හිසක් නෙළුම් මලක් යනා දී වශයෙන් සරසා තිබේ.[193]

මෙහි පොළොවේ සිට එන දෙවෙනි තට්ටුවෙහි ඇතුළත කුළුණු පිහිටා ඇත.[194] මෙම කුළුණු අඩි 12ක් පමණ උස වන අතර අඩි 09 ක් පමණ පළල ය. මෙය සක්මන් කරන විට හොඳින් වාතාශ්‍රය ලැබීම සඳහා ඉදි කළ බවයි බෙල් මහතාගේ අදහස කෙසේ වෙතත් මෙම සඳහනට අනුව මේ වටාම ඇවිදීමට හැකියාවක් බෞද්ධයින්ට ලැබී ඇති බව අනුමාන කළ හැකි ය.

බෞද්ධ ගරාදියෙන් වට වූ අභ්‍යන්තර සැලැස්ම පිළිබඳ ව කරුණු දක්වන විට මෙහි ඉදිරිපස තිබෙන කුළුණු පේළිය පිටුපස තිබෙන කුළුණු පේළියට සම්බන්ධව පැවතියේ නම්

[192] A.S.C.A.R. Bell, H.C.P. 1892., 1904, P.05
[193] A.S.C.A.R. Bell, H.C.P. 1892., 1904, P.05
[194] -DO-

මෙහි කුළුණු 88ක් පමණ තිබිය යුතු ය. එයින් ද 54 ක්ම සම්බන්ධ නො කරන ලද නිදහස් කුළුණු විය යුතුය. මෙහි අභ්‍යන්තර ගොඩනැගිල්ල කණු සහිත ශාලාවක් වශයෙන් දක්වා තිබේ.

දර්ශනීය කුළුණු සහිත මළුව අඩි 58ක් පළල් වන අතර අඩි 80ක් දිග වේ. මෙම ශාලාවෙහි බිම පැතලි ගල් අල්ලා ඇති අතර විවෘත වූ අගලක් ගොඩනැගිල්ලේ මැද සිට පිටතට ගමන් කරයි. එය උතුරු දෙස තිබෙන තාප්පය හරහා තාප්පයෙන් පිටත දක්වා සාදවා ඇත.

මෙය වැසි ජලය බැස යාම සඳහා සාදවා ඇතැයි නිගමනය කිරීමට පුළුවන. එසේ නො වන්නේ නම් මෙහි බෝධියක් රෝපණය කොට තිබුණේ නම් එය බැතිමතුන් විසින් නාවනු ලබන ජලය පිටතට යාමට මෙය යොදුවා ද යන්න සැක සහිත ය.

මෙම ගොඩනැගිල්ල ජේතවන විහාර සංකීර්ණයට වතුර සපයන ශාලාවක් ලෙස භාවිත වූයේ යැයි බෙල් මහතා අදහස් දක්වයි.[195] එනම් ජලය එක්රැස් කරනු ලබන විශාල භාජනයක් මෙම ස්ථානයෙහි ම තිබිය යුතු ය.

ගරාදි වැට තුළ චෛත්‍යයක් ඉදිකර තිබෙන්න ඇතැයි ද අදහස් දක්වා තිබේ.[196] එය එතරම් විශාල ලෙස නොව ඉතාමත් කුඩාවට සකස් කර ඇති බව බෙල් මහතාගේ අදහස යි.

බෞද්ධ ගරාදි වැට අභ්‍යන්තරයෙහි ධාතු තැන්පත් කරන ලද පෙට්ටියක් වැනි භාජනයක් හමු වී ඇති බවත් මෙය ගර්භයක් තුළ තැන්පත් කරන්නට ඇති බවත් බෙල් මහතා

[195] A.S.C.A.R. Bell, H.C.P. 1892., 1904, P.05
[196] -DO-





සඳහන් කරයි.[197] පොළොව මට්ටමින් අඩි 1 යි, අඟල් 6ක් පහතින් පිහිටා ඇති අතර මෙම ගර්භය වටා ගඩොල් අල්ලා ඇති බවත් එම ගඩොල් අල්ලා ඇති කොටස අඩි 4ක් පොළොව මට්ටමේ සිට පහතට සාදා ඇති බවත් දක්වයි. ඒ මහතාගේ අදහස වනුයේ මෙම ගර්භය වටා ගරාදි වැට සකස් කර ඇති බව ය.[198]

වර්තමානයේ ද මේ පිළිබඳ ව ස්ථිර නිගමනයට තව ම එළඹ නැති බව පැහැදිලි ය. නමුත් බොහෝ දුරට මෙම ගොඩනැගිල්ල බෝධිඝරයක් වශයෙන් සඳහන් කිරීමට පුළුවන.

[197] A.S.C.A.R. Bell, H.C.P. 1892., 1904, P.05
[198] -DO-

## නිගමනය

අනුරපුර විහාර සංස්කෘතියේ එක් මං සළකුණක් සනිටුහන් කරනු ලබන මහසෙන් මහරජතුමා විසින් ගොඩනංවන ලද ජේතවන විහාරයේ ඓතිහාසික ප්‍රවෘත්තිය, අනුරපුර සාහිත්‍යය මඟින් වළලා දමා ඇත. නැතහොත් එය වැළලී ගොසින් තිබේ. විශේෂයෙන් රුවන්වැලි සෑය අභයගිරි හා ථූපාරාම යන දාගැබ් ගවේෂණය කරනු ලබන විට එහි වූ චෛත්‍යයන් ඉදි කරනු ලැබූ භූමියේ විශේෂත්වයක් හෝ එහි නිධන් කරනු ලැබූ ධාතුන්හි ඓතිහාසිකත්වයක් ගෙනහැර පානු ලබන්නේ 13 වන සියවස දී පමණ ලියැවුණු පැරකුම්බා සිරිතෙනි. එයට පෙර එවන් වූ ඓතිහාසිකත්වයක් සඳහන් වන්නේ නැති තරම් ය.

ඒ පිළිබඳව නූතන විද්වතුන් විවිධ අදහස් පළ කරමින් එහි ඓතිහාසිකත්වය ගොඩනැංවීමට උත්සාහ දරනු ලබයි. විශේෂයෙන් ම මිහිඳු හිමි ධර්මාලෝකය විහිදුවාලූ ස්ථානය වශයෙන් සැලකීම පෙන්වා දිය හැකි ය. ඇතැම් විට එහි උරුමය මහ විහාරයට හිමිවන්නට පුළුවන. සම්පූර්ණයෙන් ම මහා විහාරයට ද උරුමකම් කිව නො හැක්කේ ජේතවන විහාරය ද මහා විහාර සීමාව තුළ ම ඉදි වූ නිසා ය.

ජේතවන විහාරයේ එවන් වූ ඓතිහාසිකත්වයක් නො මැත්තේ මහසෙන් මහරජතුමාගේ හිතු මනාපයට මෙම වෙහෙර විහාර ඉදි කිරීම වන්නට පුළුවන. මන්ද මෙය ඉදි





කරන්නට පටන් ගත් අවස්ථාවේ සිටම මහා විහාරිකයන්ගේ චෝදනා එල්ල විය.[199] සංඝමිත්‍ර භික්ෂුවගේ ඉල්ලීමකට අනුව ද මෙය ඉදි වූවා විය යුතු ය.

මහසෙන් මහරජ මහාවිහාරය විනාශ කරනු ලැබූ වේ සංඝමිත්‍ර භික්ෂුවගේ බස පිළිගෙන ය ඇතැම් විට මෙය ඉදිකරන්නට ද ඇත්තේ සංඝමිත්‍ර භික්ෂුගේ ආරාධනය මත වන්නට හැකි ය.

අභයගිරිය විහාරය ගිරි නිගන්ඨාශ්‍රමය බිඳ හෙළා ඒ මත ඉදි වූවකි. එයට කිසිවෙකුගේ විරෝධතාවයක් මතු නො වුණත් පිළිගන්වනු ලැබුවේ කුප්පිලකතිස්ස හිමියන් වෙත ය. එය ප්‍රථම පුද්ගලික පිළිගැන්වීමකි. මෙහි රඳා පවතිනුයේ භූමියේ විශේෂත්වය මත ය. ජේතවන විහාරය ද පෞද්ගලික පූජාවක් ලෙස සලකා තිස්ස හිමියන් වෙත පූජා කරනු ලැබී ය.[200] තිස්ස හිමියන් පිළිබඳ ව මහා වංශයෙහි සඳහන් වනුයේ පාපී, කුහක භික්ෂුවක් ලෙස ය. මහාවංශය, මහා විහාරයට පක්ෂපාතී කෘතියක් විය හැකි බැවින් මහා විහාරයට විරුද්ධ වූවන් මෙසේ ගර්හාවට ලක් කළා විය යුතු ය.

ජේතවන විහාර භූමියෙන් සොයා ගන්නා ලද ක්‍රි.ව. 10වන සියවසට අයත් සෙල් ලිපියකට අනුව තිස්ස හිමියන් ශාන්ත, වාම්, සිල්වත් භික්ෂුවක්[201] ලෙස සලකා තිබේ. මහසෙන් රජ පදවිය ලැබීමෙන් පසුව භික්ෂූන් වහන්සේලා විනය පිරිහීමක් දක්නට ලැබෙන්නට ඇති බවත් ඒ අතුරින් මෙම තිස්ස හිමියන්ගේ සිල්වත් භාවය අගය කොට, එම භික්ෂුවට මෙම විහාරය පූජා කළ යුතු ය. ජේතවන විහාරයේ ඇති

---

199 ගුණවර්ධන, රණවීර., සි. හා. න., 1993, පි.33

200 ම.වං., 1908, 37 පරිච්ඡේදය, 32 ගාථා

201 E.Z. Vol.1., 1912, P. 227

ඓතිහාසිකත්වය බොහෝ විට මෙම තිස්ස හිමියන්ගේ චරිතය හා සම්බන්ධ විය හැකි යැයි අනුමාන කිරීමට පුළුවන.

ජේතවන විහාරයේ මහායාන ධර්මයේ තවත් කේන්ද්‍රස්ථානයක් වශයෙන් හඳුන්වති.[202] මහායාන ධර්මයේ එන ප්‍රඥා පාරමිතා සූත්‍රය, ඇතුළත් රන්පත් ඉරු, මෙම විහාර භූමියෙන් සොයා ගන්නා ලදී.[203] සාහිත්‍ය මූලාශ්‍රවලට අනුව ශ්‍රී ලංකාව තුළ මහායාන ධර්මය ව්‍යාප්ත වූවත් එය ඉන්දියාවේ තරම් ප්‍රබල නො වූවා යැයි සිතීමට පුළුවන.

මහායාන ධර්මයට නැකම් කියනු ලබනවා වෙනුවට මෙම විහාරය ථෙරවාදී දර්ශනයේ ම තවත් කොටසක් වශයෙන් හැඳින්වීමට පුළුවන. උස්සිලියාතිස්ස තෙරුන් අභයගිරියෙන් ඉවත්ව, දක්ෂිණ විහාරය පදිංචියට සඳහා තෝරා ගනු ලැබුවේ, මතු එල්ල විය හැකි රාජ උදහසින් ගැළවීම සඳහා ය. එහෙත් අභයගිරි මතයන්ට පක්ෂව කොහේ සිටියත් රාජ උදහසට ලැබෙනවා නො අනුමාන ය. එසේ නම් වෙන්ව යාමට හේතුව වන්නට ඇත්තේ අභයගිරිවාසීන්ගේ මතිමතාන්තරයන්හි නො රුස්නා ස්වභාවය විය හැකි ය. එහෙත් මහා විහාර මතයන්ට පක්ෂවීමට තරම් ඒවා බලවත් නො වන්නට ද පුළුවන. මේ ගමනින් වැදගත් ථෙරවාදී මූලස්ථානයක් පිහිටුවීමේ පියවරක් වූ බව සැළකිය හැකි ය.

ඒ ඒ භික්ෂූන් වහන්සේලා වෙනම නිකායක් වශයෙන් ජීවත් වූයේ නව දර්ශනයක් දියත් කිරීමේ පරමාර්ථයෙන් ම නොව පෙර සිටි විහාරයන් හි සිදු වූ විනය විරෝධී ක්‍රියා නිසා ය. ජේතවනිකයන්," ධම්ම ධාතුව" පිළිගනු ලැබුවත්, පසු කාලය වන විට වෛතුල්‍යවාදී අනුගාමිකයක්ට මුහුණපෑමට සිදු

202 අමරවංශ හිමි, කොත්මලේ., ල.ස., 1969, පි.162

203 Ratnayake,hema., " JETAWANAYA" T.C.T.S.L., 1993, P.70





වූ පරාජයන් හේතු කොට ගෙන ජේතවන නිකායේ ආකල්පයේ වෙනසක් ඇති විය. ඉන්දීය භික්ෂුවක් වූ ජෝතිපාල හිමියන් විසින් මෙහෙයවන ලද වාදයක දී පරාජය පිළිගත් ජේතවනිකයෝ මහා විහාරයට පක්ෂපාතී වෙමින් මහා විහාර ආකල්ප අනුගමනය කරනු ලැබීය.[204] ජේතවනිකයන් මහා විහාරයට පක්ෂපාති වෙන්නට නම් ජේතවන විහාරීය භික්ෂූන් වහන්සේලා තුළ ථෙරවාදී ලක්ෂණ තිබිය යුතු ය.

යම් යම් සුළු විනය නීති පදනම් කරගෙන වෙන්ව ජීවත් වුවත් ජේතවනිකයන් සංඝ සමාජය නියෝජනය කරන්නට ඇත්තේ සාම්ප්‍රදායික හෙවත් චාරිත්‍රානුකූල අර්ථයෙන් බැවින් එය වඩාත් ථෙරවාදී ස්වරූපයකින් සිටින්නට ඇතැයි සිතීමට පුළුවන.

අනුරපුර යුගයේ බිහි වූ සාහිත්‍යය කෘතියක් වන මහා වංශය බොහෝ සෙයින් මහා විහාරයට පක්ෂග්‍රාහී ස්වරූපයක් ගෙන සම්පාදනය කර තිබීමත් එහි ජේතවන විහාරය පිළිබඳ තොරතුරු ස්වල්පයක් පමණක් දක්වා තිබීමත්, මෙම විහාරයෙන් සිදුවූ සේවය පිළිබඳ ව තොරතුරු රැස් කිරීමට තරමක් උගහට ය. නිකාය සංග්‍රහයේ ද ඇත්තේ තොරතුරු ස්වල්පයකි. සපයා ඇති තොරතුරුත් අපක්ෂපතිව සඳහන් කර තිබේ නම් තොරතුරු අධ්‍යයනයට පහසුවක් වේ. විශේෂයෙන් ම නූතනයේ ජේතවන විහාරය සංකීර්ණයේ නටබුන්ව ඇති ගොඩනැගිලි වලින් ස්ථිරව ම මහසෙන් රජතුමා විසින් ආරම්භ කරන ලද ගොඩනැගිල්ලකි සලකනු ලබන්නේ දාගැබ පමණි. විහාරස්ථානයක තිබිය යුතු සියලු අංගයන් ජේතවන විහාර සංකීර්ණය තුළ අදත් විද්‍යාමාන ය. නමුත් ඒ සියල්ල මහසෙන් රජුගේ වැයමේ ප්‍රතිඵලයක් ද? නො එසේ නම් වෙනත් අයෙකුගේ ක්‍රියාවක් ද යන්න දැක්විය හැක්කේ අනුමානයෙනි.

204 ගුණවරධන, රණවීර., සි.හා.න., 1993, පි.35

CamScanner

එයට හේතුව වන්නේ අනුරපුර යුගයේ විසූ කතෘවරුන් අපක්ෂපාති ලෙස සිය කර්තව්‍යය ඉටු කර නො තිබීම යි.

ජේතවන විහාරයේ පිරිහීම පිළිබඳ ව එළැඹිය හැකි නිගමනය වනුයේ, එය මුළුමනින් ම බිඳ වැටීමට ලක් වූයේ, 1වන පරාක්‍රමබාහු රජතුමා විසින් තුන් නිකායම එක් නිකායක් බවට පත් කිරීමට සිදුකළ ධර්ම සංගායනාවෙන් පසුව ය. නමුත් ඊට පෙර ද වරින් වර පරිහානියට පත්ව ඇත. සොලීන්ගේ ආධිපත්‍යට අනුරාධපුර නගරය පත්වීමත්, ඔවුන් විසින් බෞද්ධ සිද්ධස්ථානයන් විනාශ කර දැමීමෙන් සම්පූර්ණයෙන් ම බිඳ වැටීමට බලපෑවේ ය.

ක්‍රි.ව. 12වන සියවසයෙන් පසුව ජරාවාසයට පාත්‍ර වූ ජේතවන විහාර සංකීර්ණය 18වන සියවස පමණ වන තෙක් කිසිවෙකුගේ අවධානයට ලක් වූයේ නැති තරම් ය. බොහෝ බැතිමතුන් අද පවා ජේතවන, අභයගිරිය වශයෙනුත් අභයගිරිය, ජේතවන වශයෙනුත් සලකනු ලබන්නේ එසේ වනගත වීමේ ප්‍රතිඵලයක් නිසා යැයි සිතිය හැකි ය. 1933 දී පමණ පරණවිතාන මහතා ස්ථිර වශයෙන් ම එකී නම් මාරුව නිවැරදි කරන තෙක් උගතුන් පවා එය හඳුන්වනු ලැබුවේ වරදවා ය.

ජේතවන දාගැබේ මුල් ස්වරූපය වර්තමානයේ දිස් වන අයුරින් පැවතියේ නැත. ජේතවන විහාරයේ අභිසංවර්ධනය උදෙසා කටයුතු කළ නරපතියන් අතරින් ධාතුසේන (ක්‍රි.ව. 459-477) ස්තූපය මුදුනත තනවා තිබුණු ඡත්‍රය පිළිසකර කළ බව සඳහන් වේ.[205] එසේ නම් වර්තමානයේ දිස්වන කොත් කැරැල්ල වෙනුවට ක්‍රි.ව. 4 හෝ 5වන සියවස්වල තිබී ඇත්තේ ඡත්‍රයකි. නූතන කොත් කැරැල්ල 19වන සියවසයේ පමණ ඉදි වූවක් බව සැළකිය හැකි ය.

205 ම.ව., 1908, 38 පරිච්ඡේදය. 54, 74 ගාථා





අනුරපුර යුගයේ බිහි වූ වෙනත් චෛත්‍යයන් මුල් කාලයේ දක්නට ලැබුණු ස්වරූපයට වඩා විවිධ රජවරුන්ගේ සහයෝගය මත ඒවා විශාල කරන ලදි. විශේෂයෙන් ම අභයගිරි දාගැබෙ පේසා වළලු නිර්මානය කර ඇත්තේ දාගැබ ඉදි කළාට පසුව බව නූතන පර්යේෂණ තුළින් සනාථ වී ඇත.

නමුත් ජේතවන දාගැබේ පේසා වළලු දාගැබේ මුල් අවස්ථාවේ පටන් ම සම්බන්ධ වී ඇති බව ජේතවන සංකීර්ණයේ කැණීම් තුළින් සනාථ වී ඇත. නූතනයේ එකම ගඩොල් නිර්මානයක් වශයෙන් පැවතුණත් එය සුදු හුණු පිරියම් කොට ඉතාමත් අලංකාර ස්වරූපයෙන් පවතින්නට ඇතැයි දක්විය හැකි ය. ධාතුසේන රජතුමා (ක්‍රි.ව. 459-477) දාගැබට හුණු බදාම කිරීමක් සිදු කළ බව සඳහන් වීමෙන් ඒ බව පැහැදිලි ය.[206]

ජේතවන විහාර සංකීර්ණයේ නටබුන් රාශියක් දක්නට ලැබෙන නමුත් ඒවායේ ආරම්භය කවදා ද යන්න ස්ථිර වශයෙන් ම නිශ්චය කිරීම උගහට ය. ඇතැම් විට වරින්වර ප්‍රතිසංස්කරණ අලුත්වැඩියා කටයුතු වල ස්වරූපය අනුව බොහෝවිට ක්‍රි.ව. 8, 9වන සියවස්වල ඉදි කරන්නට ඇතැයි අනුමාන කළ හැකි ය.

ඉතිරිව ඇති නටබුන් අතරින් වඩාත් මතභේදයට තුඩු දී ඇත්තේ බෞද්ධ ගරාදි වැට වශයෙන් එච්.සී.පී. බෙල් මහතා හඳුන්වා ඇති වර්තමානයේ "පිළිම ගෙය/ බෝධිඝරය" වශයෙන් නම් කර ඇති ගොඩනැගිල්ල යි. බෙල් මහතා ද එකම ස්ථාවරයක සිට එය සනාථ කිරීමට කරුණු ඉදිරිපත් කර නොමැත. ඔහු විසින් ඒ පිළිබඳව විවිධ අදහස් ඉදිරිපත් කරමින් කරුණු ගෙනහැර දක්වති.

206 එම

CS CamScanner

නූතනයේ හඳුන්වා ඇති අන්දමට වඩා එය බෝධිඝරයක ගොඩනැගිල්ලකි ලෙස සැලකීම වඩාත් සුදුසු යැයි සිතමි. මන්ද බෝධිය නැවීමට ඒ අසළට යා හැකි අන්දමට සකස් කර ඇති අයුරින් ද නහවන ලද අමතර ජලය බැස යාමට යොදා ඇති කාණුවක් නටබුන්ව ඇති බැවිනි. කෙසේ වෙතත් එය තවදුරටත් කැණීම් කිරීම තුළින් හා අවට සාධකවලට අනුව එළැඹිය යුත්තකි.

සමස්තයක් වශයෙන් ගත් කළ ජේතවන විහාරයෙහි සැරසිලි හා මෝස්තර ආදිය පිළිබඳ ව ගවේෂණය කරනු ලබන විට ඒවා බොහෝදුරට රැගෙන යන්නේ මුල් යුගයට හෝ දෙවෙනි යුගයේ නිර්මානවලට ය. මුරගල් යෙදීමේ දී (ඇතැම්) ඒවා නිර්මාණවලින් තොර ය. ප්‍රධාන දොරටු අභියස දමා ඇති සඳකඩ පහණ ද නිර්මානවලින් තොර ය. ඇතැම් සඳකඩ පහණ්හි නෙළුම් මලක් පමණක් දක්නට ලැබේ. කොරවක්ගල් නිර්මාණය ද එලෙස ම ය. ඒවා ද කිසිදු අලංකරණයක් නො මැතිව රේඛාමය ස්වරූපයකින් පමණක් දක්වා ඇත. නමුත් මේ අතර නිර්මාණශිලීත්වයෙන් අනූන ඒවා නැත්තේ ම නොවේ. බහුතරය ඇත්තේ ප්‍රාථමික අවධියේ නිර්මාණයන් ය. උදාහරණයක් වශයෙන් දූනට කෞතුකාගාරයේ (ජේතවන විහාරයේ) තැන්පත් කර ඇති නාග පෙණ සහිත මිනිස් මුරගල නිර්මාණශිලීත්වයේ ප්‍රතිභාවය කියාපාන්නකි. එහි මිනිස් අඟපසඟ මනා ලෙස නිරූපණය කොට ඇත.

ජේතවන විහාරය ඉදි වූයේ මහා විහාරය අභයගිරිය වැනි ශ්‍රේෂ්ඨ නිර්මානයන්ගෙන් පසුව ය. විශේෂයෙන් ම අභයගරියි ඉදි වූයේ ක්‍රි.ව. 01 වන සියවසේසේ දී ය. නමුත් එහි අද ද දක්නට ලැබෙන නිර්මාන වර්තමානයේ ද ඉතාමත් ශ්‍රේෂ්ඨ ය.





අභයගිරි විහාරයේ තත්ත්වය එසේ වුවත් ජේතවන විහාරය ක්‍රි.ව. 04වන සියවසේ මුල් භාගයේ ඉදි වුවත් එහි බොහෝ නිර්මාන එකම ස්වරූපයක් ගනී. මෙයට හේතුව වන්නට ඇත්තේ එකම ගුරු කුලයක් විසින් කටයුතු සිදු කිරීම ය. මේ වනවිට අනුරපුර යුගයේ විවිධ ගුරු කුලයක් සිටින්නට ඇති බවත්, ජේතවන විහාරෙයේ මෝස්තර හා සැරසිලි නිර්මාන කිරීමට පැමිණි ගුරුකුලය මෙසේ වාම්, සරල නිර්මානයන් අගය කළා විය හැකි යැයි සඳහන් කළ හැකි ය.

ජේතවන විහාරය ඉදි කරනු ලැබුවේ මහා විහාරය විනාශ කොට මහා විහාරයේ භාණ්ඩ යොදා ගනිමින් යැයි සිතීමට පුළුවන. නිර්මාන කලාවේ ප්‍රාථමික ලක්ෂණ දක්නට ලැබෙන්නේ මහා විහාරයේ ය. මන්ද කලාවේ ආරම්භක ස්ථානය වශයෙන් විද්වතුන් සළකුණු ලබන්නේ මහා විහාරය බැවිනි. මහා විහාරයේ නටබුන් එලෙස උපයෝගී කර ගැනීම ජේතවන විහාරයේ නටබුන්වල ස්වරූපය ප්‍රාථමික ස්වරූපයක් ගැනීමට හේතු වූවා විය හැකි ය.

ජේතවන නිකාය දෙනාකය ඉහතින් සඳහන් පරිදි ක්‍රි.ව. 03වන ශතවර්ෂයේ පමණ ආරම්භ වී නොයෙක් නරපතියන් අතින් සංවර්ධනයට පැමිණ 12වන ශතවර්ෂය දක්වා පැමිණියේ ය. වාම් නිර්මානයන්ගෙන් යුක්ත වූ විහාර සංකීර්ණයේ වර්තමාන නටබුන් ස්වභාව ධර්මයාගෙන් හා විනාශකාරීන්ගෙන් විනාශ වී ගොස් ඇත. ජේතවන විහාරය ආගමික වශයෙන් මෙන් ම කලාත්මක වශයෙන් හෙළ බෞද්ධ සංස්ථාවේ එක් සන්ධිස්ථානයක් වශයෙන් සඳහන් කළ හැකි ය.

# ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

1. අමරවංශ හිමි, කොත්මලේ. ලක්දිව සෙල්ලිපි, කොළඹ, (1969)
2. ආචාර්ය අධිනීතිඥ වික්‍රමසිංහ, කේ. ඩී. පී., පැරකුම්බා සිරිත, 11වන මුද්‍රණය, කොළඹ, (1970)
3. ඇස්. පී. සමරසිංහ ආදීහු, සංස්කෘති. 17 කලාපය, 3 සඟරාව, කොළඹ, (1983)
4. කොඩ්රිංටන්, එච්. ඩබ්ලිව්, සංක්ෂිප්ත ලංකා ඉතිහාසය, කොළඹ, (1957)
5. ගුණවර්ධන, රණවීර, සිවුර සහ නගුල, කොළඹ, (1993)
6. චූල වංශය (ඉ), විල්හෙල්ම් ගයිගර් සංස්කරණය කොටස් 02යි, (පීටීඑස්), ලන්ඩන්, (1925)
7. නිකාය සංග්‍රහය, ඩී. පී. ආර්. සමරනායක සංස්කරණය, කොළඹ, (1960). එම. ද. ඉසෙඩ් වික්‍රමසිංහ සංස්කරණය, කොළඹ, (1890)
8. පරණවිතාන, සෙනරත්, ලංකාවේ ස්තූප, කොළඹ, (1969)
9. පියදස්සි හිමි, බෙරවිල ආදීහු, ශාසන ප්‍රභා, මුල්ලේරියාව, (1986)
10. මහාවංශය, 1වන කාණ්ඩය, ශ්‍රී සුමංගල හිමි සංස්කරණය, කොළඹ, (1946) 1වන කාණ්ඩය, ශ්‍රී සුමංගල හිමි සංස්කරණය, කොළඹ, (1954)
11. මහාවංශය (ඉ), විල්හෙල්ම් ගයිගර් සංස්කරණය (පීටීඑස්), ලන්ඩන්, (1908)
12. මුණිදාස ලොකුවිතාන, සරසවිය, විද්‍යොදය සඟරාව, කලාප 05, ගංගොඩවිල, (1965)





13. රාහුල හිමි, වල්පොළ, ලක්දිව බුදු සමයෙහි ඉතිහාසය, කොළඹ, (1952)
14. රෝහණධීර, මැන්දිස්, සංඝ සංවිධාන, නුගේගොඩ, (1974)
15. වත්තල, ශරත්, අනුරපුර විහාරාම, කොළඹ, (1991)
16. වනරතන නාහිමි, කඹුරුපිටියේ, අනුරපුර නටබුන්, මාතර, (1970)
17. වපිර සිල්මාතාව, පානදුරේ, භික්ෂුණී වංශය, අනුරාධපුරය, (1992)
18. වික්‍රමගමගේ, චන්ද්‍රා, ස්තූප, පොල්ගස්ඕවිට, (1990)
19. විජයසිංහ, සෝමරත්න, පැරණි ලක්දිව, කොළඹ, (1963)
20. විමලකිත්ති හිමි, මැදඋයන්ගොඩ, ශාසන වංශ ප්‍රදීපය, මාතර, (1955)
21. වංසත්ථපකාසිනිය (මහාවංස ටීකාව), (ඉ) පී. පී. මලලසේකර සංස්කරණය, (පීටීඑස්), ලන්ඩන්, (1935)
22. සාසනරතන හිමි, මොරටුව, ලක්දිව මහායාන අදහස්, කොළඹ, (1952)
23. සිංහල ශිලා ලේඛන විවරණය, අමරසේකර, බන්දුල, 1වන කාණ්ඩය, කොළඹ, (1937)
24. හෙට්ටිආරච්චි, එස්. බී සහ කුලතුංග ටී. පී. අභයගිරිය, කොළඹ, (1992)

ENGLISH BOOKS

25. Archaeological Sarvey Ceylon, Annual Reperts. 1890. Bell, H.C.P. Colombo, (1904)
26. Archaeological Sarvey Ceylon, Annual Reperts. 1892. Bell, H.C.P. Colombo, (1904)

27. Archaeological Sarvey Ceylon, Annual Reperts. 1894. Bell, H.C.P. Colombo, (1904)
28. Archaeological Sarvey Ceylon, H.C.P. 1892. Colombo, (1914)
29. Bareau, Ardre. Les Sectes Buddigues da petit Vehicale. Madurasi, (1955)
30. Epigraphia in Zeylanica Volume II, Don Marting De Zilva Wickramasinghe, London, (1928)
31. Epigraphia in Zeylanica Volume III, Don Marting De Zilva Wickramasinghe, London, (1928)
32. Epigraphia in Zeylanica Volume IV, H.W. Corrington and S. Paranavithana, London, (1934)
33. Epigraphia in Zeylanica Volume VI, Don Marting De Zilva Wickramasinghe, London, (1912)
34. Kalupahana, D.J. The Ceylon Journal of the Humanities. Colombo, (1970)
35. Jethawana Project-Farst Archaeological Excavation and Research Report, Unesco, Colombo, (1982)
36. Smither, James, G. Architectaral Remains. Anuradhapura, Sri Lanka. Edi By. Chandra Wickramagamage, Colombo, (1993)
37. The culture Trangle, Unesco. Colombo, (1993)





ඡායාඵලක අංක 01


ජේතවන ස්තූපය



Scanned with CamScanner

## ඡායාරූපක අංක - 02


ස්තූපයට ප්‍රවිශ්ටවීමට ඇති පඩිපෙළ (නැගෙනහිර පිහිටි)






## ඡායාරූපක අංක - 03

පියස්ස සහිතව තිබුණා යැයි අනුමත කළ හැකි ගොඩනැගිල්ල




ඡායාඵලක අංක - 04

පිළිමගෙය



ඡායාඵලක අංක - 05

පිළිම පීඨය



## ඡායාඵලක අංක - 06

උපෝසථාඝාරය








## ඡායාඵලක අංක - 07

ජන්ථාගාරය (උපෝසථාඝාරයේ පිහිටි)



ඡායාඵලක අංක - 08

දාන ශාලාවේ ප්‍රධාන බත් ඔරුව








ඡායාඵලක අංක - 09

දානශාලාවට සම්බන්ධ ගොඩනැගිල්ල



## ඡායාළුලක අංක - 10

පංචාවාස ගොඩනැගිල්ලේ උතුරු දිසාවේ මතුපිට පෙනුම









## ඡායාළුලක අංක - 11

පංචාවාස ගොඩනැගිල්ලේ උතුරු දිසාව



## ඡායාඵලක අංක - 12


පංචාවාස ගොඩනැගිල්ලක ප්‍රධාන දොරටුව සඳහා සකස් කර ඇති කොරවක්ගල





## ඡායාඵලක අංක - 13

බෞද්ධ ගරාදි වැටේ ප්‍රධාන දොරටුව



ආචාර්ය ඒ.එම්.එන්.වසන්ත මෙන්ඩිස් මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකි. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් බෞද්ධ ශිෂ්ටාචාරය විෂයය පිළිබඳව ගෞරව ශාස්ත්‍රවේදි උපාධිය ලබාගත්තේ ප්‍රථම පන්තියේ සාමාර්ථයක් සහිතව ය. ඔහු මානවශාස්ත්‍ර සහ සමාජයවිද්‍යා පීඨයේ වැඩිම ලකුණු ප්‍රතිශතයක් ලබාගත් ශිෂ්‍යයාට පිරිනැමෙන **"ශ්‍රී සෝරත ශාස්ත්‍ර පීඨ ස්වර්ණ මුද්‍රිකාව"** හිමි කරගෙන තිබෙන අතර ම එම පීඨයේ ම ප්‍රථම වර්ෂ පරීක්ෂණයේදි මානවශාස්ත්‍ර විෂයයන් හදාරා වැඩිම ලකුණු සහ උසස් ශ්‍රේණි ලබා ගැනිම වෙනුවෙන් **"රද්දැල්ලේ පඤ්ඤාලෝක අනුස්මරණ"** ශිෂ්‍යත්වයත් , බෞද්ධ ශිෂ්ටාචාරය විෂයය හදාරා වැඩිම ලකුණු ලබා ගැනීම වෙනුවෙන් **"බෙල්ලන්විල ශ්‍රී සෝමරතන අනුස්මරණ"** ශිෂ්‍යත්වයත් දිනා ගෙන තිබේ. ආචාර්ය වසන්ත මෙන්ඩිස් මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් දර්ශනපති උපාධිය හිමි කරගෙන තිබෙන අතර එම උපාධිය හැදෑරීම සඳහා ඔහුට **"වල්පොළ රාහුලමාතා අනුස්මරණ"** ශිෂ්‍යත්වයක් හිමි වී තිබේ. කැළණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ පුරාවිද්‍යා පශ්චාද් උපාධි ආයතනයෙන් පුරාවිද්‍යාව පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව සම්මාන සාමාර්ථයක් සහිතව සමත් වී ඇති අතර එම උපාධිය හැදෑරීම සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනුග්‍රහය ලැබී තිබේ. එම ආයතනයෙන් ම පුරාවිද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය ලබාගෙන ඇති ආචාර්ය වසන්ත මෙන්ඩිස් මහතා චීන රජයේ ශිෂ්‍යත්වයක් ලබාගෙන චීනයේ සිචුආන් විශ්වවිද්‍යාලයෙන් ආචාර්ය උපාධිය හිමි කරගෙන ඇත.

ජේතවන විහාරයෙහි නටබුන් නම් කෘතිය ආචාර්ය වසන්ත මෙන්ඩිස් මහතා විසින් ඔහුගේ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය සඳහා ඉදිරිපත් කළ ස්වාධීන නිබන්ධයයි. මෙම කෘතියෙහි පුරාවිද්‍යාව,ඉතිහාසය මෙන්ම බෞද්ධ ශිෂ්ටාචාරයට අදාල කරුණු අන්තර්ගත ග්‍රන්ථයක් වශයෙන් පෙන්වා දිය හැකිය.

**ආචාර්ය ගාමිණි රණසිංහ**
**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**
**ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය**

ISBN 978-955-4980-09-9
9 789554 980099

සමන් ප්‍රකාශකයෝ සහ මුද්‍රණ ශිල්පියෝ
39/4, වෙල පාර, ගංගොඩවිල, නුගේගොඩ.

මිල රු 500